# සිංහල
# භාෂාව හා සාහිත්‍යය

## 6 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශය

**(2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

සිංහල භාෂාව හා සාහිත්‍යය - 6 ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශය - පළමු වාරය (මොඩියුල අංක 01, 02 හා 03 සඳහා)

ප්‍රථම මුද්‍රණය - 2025

© ජාතික අධ්‍යාපන ආයතනය

ප්‍රකාශනය : ජාතික අධ්‍යාපන ආයතනය

සියලු ම හිමිකම් ඇවිරිණි.

ISBN

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
මුද්‍රණය කරන ලදි.

Printed by : Educational Publications Department

## උපදේශනය, රචනය හා සංස්කරණය

| | |
|---|---|
| උපදේශකත්වය :- | මහාචාර්ය මංජුලා විතානපතිරණ, අධ්‍යක්ෂ ජනරාල්,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| | ආචාර්ය එස්. ඒ. ඩී. සමරවීර, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,<br>භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය. |
| අධීක්ෂණය :- | ආචාර්ය පූජ්‍ය කුකුරම්පොල ඥාණවිමල හිමි,<br>අධ්‍යක්ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. |
| සම්බන්ධීකරණය :- | මදාරා ජයරත්න, සහකාර කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| ලේඛක මණ්ඩලය :-<br>බාහිර | එච්. පී. සුසිල් සිරිසේන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, මීරිගම |
| | ඩබ්ලිව්. කරුණාරත්න, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය, ගිරාගම |
| | ශ්‍රියානි අබේවික්‍රම, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය 1. |
| | ගයා වැයිහේන, ගුරු උපදේශක (විශ්‍රාමික). |
| | නිශ්ශංක බණ්ඩාර, ගුරු සේවය (විශ්‍රාමික). |
| සංස්කරණය :-<br>අභ්‍යන්තර | රුවනි සිසිජා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව. |
| | ආචාර්ය, රාජකීය පණ්ඩිත පූජ්‍ය වාවින්නේ පඤ්ඤානන්ද හිමි,<br>සහකාර කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව. |
| | මදාරා ජයරත්න, සහකාර කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව. |
| භාෂා සංස්කරණය :- | ආචාර්ය පූජ්‍ය මොරකන්දේගොඩ අරියවංස හිමි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>රුහුණ විශ්වවිද්‍යාලය. |
| චිත්‍ර සහ පිටකවරය :- | සමන් කලුබෝවිල, කථිකාචාර්ය, හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, මීරිගම |
| පිටු සැකසුම් :- | ඩී. එම්. ඉරේෂා රංගනා<br>ආර්. එල්. ඩී. කේ. දයාසේන<br>ලක්ෂ්මි ඉරෝෂිකා |

ජාතික අධ්‍යාපන ආයතනයේ පණිවිඩය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ පණිවිඩය

# පෙරවදන

# හැඳින්වීම

අධ්‍යාපනය ලබන මාධ්‍ය භාෂාව පරිසමාප්තියෙන් ම දැන ගැනීමේ ප්‍රයෝජන රාශියකි. හොඳ අධ්‍යාපනයක් ලැබීම ඉන් පළමු වැන්නයි. භාෂා හැකියාව නොමැති ව වෙනත් විෂයක් ග්‍රහණය කිරීම දුෂ්කර කාර්යක් වන්නේ සංකල්ප සාධනය භාෂාවෙන් සිදු වන බැවිනි. එහෙයින් මාධ්‍ය භාෂාව පිළිබඳ පුළුල් අවබෝධය ඉගෙනීමට මනා රුකුලක් වේ. බහුභාෂීය සමාජවල ඇතැම් දරුවෝ මව්බසින් නිවසේ දී කතා කරන අතර පාසලේ දී වෙනත් බසකින් ඉගෙනුම ලබති. ශ්‍රී ලංකාවේ සිංහල හා දෙමළ භාෂා මව්බස ලෙස භාවිත වන අතර ඉංග්‍රීසි භාෂාව ද සුළු පිරිසක් මව්බස ලෙස භාවිත කරති. මව්බසින් අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව ඇතැම් රටවල ජනයාට හිමි නො වේ. එහෙත් ශ්‍රී ලාංකිකයන්ට මව්බසින් අධ්‍යාපනය ලැබීමට අවස්ථාව හිමි වී තිබේ. එමෙන් ම භාෂාව යනු එම භාෂාව අයත් වන සමාජයේ සංස්කෘතිය හා තදින් බද්ධ වූවකි. ඒ අනුව සිංහල සංස්කෘතිය මනාව වටහා ගැනීමටත් යථෝක්ත සංස්කෘතික උරුමයන් අනාගත පරපුරට දායාද කිරීමටත් භාෂාව ඉගෙනීම ප්‍රයෝජනවත් වේ. සතුට, විනෝදය ලබා ගැනීම මෙන් ම මානවයාගේ කුදු මහත් සන්නිවේදන කටයුතු සිදු කරන්නේ ද භාෂාවෙනි. භාෂක සමාජයක අන්තර් ක්‍රියාකාරිත්වය හා සන්නිවේදනය පවත්වා ගැනීමට මෙන් ම සතුට විනෝදය වැඩි දියුණු කර ගැනීමට ද අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය කර ගැනීමට ද භාෂාව ඉවහල් වේ.

ඒ අනුව ශ්‍රී ලාංකේය බහුතරයකගේ මව්බස ද අධ්‍යාපනය ලබන මාධ්‍ය භාෂාව ද වන සිංහල භාෂාව පිළිබඳ මනා පදනමක් සකස් කිරීම සඳහා පාසල් විෂයමාලාවෙහි පුළුල් අවධානයක් යොමු විය යුතු ය. සිංහල භාෂාව පළමු බස ලෙස පාසලේ ඉගැන්වීමේ දී එය අනෙකුත් විෂයන් හා සමෝධානය වීම අත්‍යවශ්‍ය වේ. පළමු බස ඉගැන්වීමේ දී වෙනත් විෂයන්හි පෙළ භාවිතයට ගැනීම කෙරෙහි විෂයමාලාවෙහි අවධානය යොමු වනුයේ මේ හේතුවෙනි. හුදෙක් සිංහල පමණක් දැන ගැනීමට සීමා නො වී අනෙකුත් විෂයන් ඉගෙනීමේ උපකාරක මාධ්‍යයක් ලෙස සිංහල ඉගෙනීම මෙහි දී සිදු වේ. එනිසා සිංහල භාෂා හැකියාව වැඩි දියුණු කර ගන්නා අතරතුර ම ඊට සමගාමී ව අධ්‍යයනය කරන අනෙකුත් විෂයන්හි වාක්කෝෂය පිළිබඳ අවබෝධය ලබා ගැනීම ද පළමු බස ඉගෙනීමේ කාර්යට අයත් වේ.

ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාවේ සිංහල භාෂා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා සම්පාදනය කරන සිංහල භාෂාව හා සාහිත්‍යය ගුරුමාර්ගොපදේශ මාලාව ගුරුවරයාට තම ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය මැනවින් සංවිධානය කර ගැනීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සපයනු ඇත. 21 වන සියවසේ කුසලතා ශිෂ්‍යයා තුළ වර්ධනය කරමින් නව ලොවට උචිත දැනුම, ආකල්ප හා කුසලතාවලින් ශිෂ්‍යයා සන්නද්ධ කිරීම සඳහා නවීන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම ඉවහල් කර ගනිමින් ඵලදායී අධ්‍යයන පරිසරයක් ගොඩනැගීම සඳහා අවශ්‍ය මගපෙන්වීම්වලින් මෙම ගුරු මාර්ගෝපදේශය සමන්විත වේ.

ආචාර්ය පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි
අධ්‍යක්ෂ
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

## පටුන

| | පිටුව |
| --- | --- |
| මොඩියුලය 01 (සුබස් මිහිර) හැඳින්වීම | 01 |
| සුබස් මිහිර මොඩියුලයට අදාළ විෂය නිර්දේශය | 02 |
| ඉගෙනුම් අවස්ථාව 01 | 06 |
| ඉගෙනුම් අවස්ථාව 02 | 09 |
| ඉගෙනුම් අවස්ථාව 03 | 14 |
| ඉගෙනුම් අවස්ථාව 04 | 18 |
| මොඩියුල තක්සේරුකරණය හා ඇගයීම | 21 |
| මොඩියුලය 02 (සුබස් හුරුව- 01) හැඳින්වීම | 23 |
| සුබස් හුරුව 01 මොඩියුලයට අදාළ විෂය නිර්දේශය | 24 |
| ඉගෙනුම් අවස්ථාව 01 | 27 |
| ඉගෙනුම් අවස්ථාව 02 | 30 |
| ඉගෙනුම් අවස්ථාව 03 | 34 |
| මොඩියුල තක්සේරුකරණය හා ඇගයීම | 37 |
| මොඩියුලය 03 (සාහිත මිහිර - 01) හැඳින්වීම | 39 |
| සාහිත මිහිර 01 මොඩියුලයට අදාළ විෂය නිර්දේශය | 40 |
| ඉගෙනුම් අවස්ථාව 01 | 44 |
| ඉගෙනුම් අවස්ථාව 02 | 47 |
| ඉගෙනුම් අවස්ථාව 03 | 51 |
| සාහිත්‍යයෙන් ජීවිතයට | 56 |
| මොඩියුල තක්සේරුකරණය හා ඇගයීම | 58 |

## විෂය අරමුණ (Aim)

දෛනික සන්නිවේදන කටයුතුවල දී භාෂාව නිවැරදි ව භාවිත කිරීමටත් සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රස වින්දනාත්මක, විචාරාත්මක හා තාර්කික චින්තනය වර්ධනය කර ගැනීමටත් භාෂාමය ශාස්ත්‍රීය පදනම ගොඩනගා ගනිමින් අනාගත අධ්‍යාපන අපේක්ෂණ ඉටු කර ගැනීමටත් හැකියාව ඇති, සමාජ සංවේදන කුසලතාවලින් පරිපූර්ණ ජාතික සංවර්ධනයට දායක වීම සඳහා අවශ්‍ය වෘත්තීය නිපුණතා සංවර්ධනය කර ගත් යහපත් පුරවැසියකු බිහි කිරීම සඳහා අවශ්‍ය භාෂා කුසලතා සංවර්ධනය කිරීම

## අභිමතාර්ථ (Objectives)

- සිංහල භාෂාව හා සාහිත්‍යය ඉගෙනීම කෙරෙහි ධනාත්මක ආකල්ප සංවර්ධනය කිරීම
- සන්නිවේදන ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය චතුර්විධ භාෂා කුසලතා සංවර්ධනය කිරීම
- සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රස වින්දනාත්මක, විචාරාත්මක හා නිර්මාණාත්මක කුසලතා සංවර්ධනය කිරීම
- භාෂාව ගැන ඉගෙනීමෙන් නිරවද්‍ය භාෂා ව්‍යවහාරයට යොමු කිරීම
- භාෂාවෙන් හා සාහිත්‍යයෙන් නිරූපිත සංස්කෘතික හර පද්ධතිය පිළිබඳ අවබෝධය පුළුල් කිරීම
- විවිධ විෂය ඉගෙනීමට අවශ්‍ය පදනම සකස් කිරීම සඳහා වාක්කෝෂය සංවර්ධනය කිරීම
- 21 වන සියවසේ කුසලතා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය භාෂාමය පදනම ගොඩනැගීම
- ජාතික සංවර්ධනයට දායක වීම සඳහා අවශ්‍ය වෘත්තීය නිපුණතා සංවර්ධනය කිරීම
- සොබා දහමට හිතැති සමාජ සංවේදන කුසලතාවලින් සපිරි යහපත් පුරවැසියෙකු බිහි කිරීම

**ගුරු මාර්ගෝපදේශය භාවිතය සඳහා උපදෙස්**

- ♦ පහසුකම් සපයන්නෙකු ලෙස හයවන ශ්‍රේණියේ පළමු වාරයට අදාළ අත්‍යවශ්‍ය මොඩියුල අංක 1, 2 සහ 3 භාවිත කරන්නේ කෙසේ ද යන්න අවබෝධ කර ගැනීම සඳහා මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.
- ♦ මොඩියුල ක්‍රියාත්මක කිරීමට පෙර මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් අධ්‍යයනය කර එම උපදෙස් අනුව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- ♦ හැකි සෑම විට ම සුසාධ්‍යකරුවෙකු ලෙස කටයුතු කරමින් වඩාත් ප්‍රායෝගික ඉගෙනුම් අද්දැකීම් ලබා ගැනීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දිය යුතු ය.
- ♦ එහි දී ගුරු මාර්ගෝපදේශයේ ලබා දී ඇති මූලික ක්‍රමවේදයෙන් පරිබාහිර ව වඩාත් නිර්මාණශීලී සහ සුතථ්‍ය ඉගෙනුම් අවස්ථා සම්පාදනය කිරීමේ නිදහස මෙය පරිශීලනය කරන ඔබට ඇත.
- ♦ යෝජනා කර ඇති ක්‍රියාකාරකම්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් නිරත කිරීමේ දී අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දීම කළ යුතු ය.
- ♦ අපේක්ෂිත කාර්ය සාධන මට්ටම වෙත ළඟා වන තෙක් අඛණ්ඩ ව ප්‍රතිපෝෂණ ලබා දිය යුතු ය.

**මොඩියුල භාවිත කිරීමට උපදෙස්**

මෙම මොඩියුලයෙහි, සුහද සංවාද, දුරකතන සංවාද, මාතෘකානුකූල කතා හා විවිධ මාධ්‍ය යොදා ගෙන සිදු කරන ඉදිරිපත් කිරීම් යන ඉගෙනුම් අවස්ථා හතර අන්තර්ගත වේ. ඒ එක් එක් ඉගෙනුම් අවස්ථා පහත සඳහන් අංගවලින් සමන්විත වේ.

- ▪ ඉගෙනුම් පල සරල ව (ශිෂ්‍යයාට අවබෝධ වන පරිදි) දැක්වීම
- ▪ පෙර මතකය අවදි කිරීම
- ▪ උදාහරණ/රූපසටහන්/පැහැදිලි කිරීම්
- ▪ ක්‍රියාකාරකම් (කේවල/කණ්ඩායම්) සහ අභ්‍යාස
- ▪ ස්වයං තක්සේරුව (තම හැකියාව තමා විසින් ම තක්සේරු කර ගැනීම)
- ▪ මොඩියුලයේ සාරාංශය

- මෙම මොඩියුලය ඒ ඒ ඉගෙනුම් අවස්ථාවට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලින් සමන්විත වන අතර කණ්ඩායම් වශයෙන් හෝ කේවල ව හෝ මෙම ක්‍රියාකාරකම්වල නිරත වීමට අවස්ථාව සලසා ඇත. එම ක්‍රියාකාරකම අවසානයේ ලබා දී ඇති 'ස්වයං තක්සේරුව' සම්පූර්ණ කිරීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම සහ මග පෙන්වීම ගුරුවරයා විසින් සිදු කළ යුතු ය.
- ශිෂ්‍ය ශිෂ්‍යාවන් තක්සේරු කිරීම සඳහා ගුරු මාර්ගෝපදේශයේ ලබා දී ඇති සලකුණු මාර්ගෝපදේශ (Rubrics) යොදා ගත යුතු ය.

**සලකුණු මාර්ගෝපදේශ (Rubrics) හා නිර්ණායක භාවිත කිරීම සඳහා උපදෙස්**

- ඇගයීමට ලක් වන ක්ෂේත්‍ර පිළිබඳ ක්‍රියාකාරකම් සිදු කිරීමට/අභ්‍යාස ලබා දීමට පෙර ගුරුවරයා විසින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් පූර්ව දැනුවත් කිරීමක් සිදු කළ යුතු ය.
- ක්‍රියාකාරකම්/අභ්‍යාස අවසානයේ දී ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇගයීමට ලක් කර ලකුණු ලබා දිය යුතු ය.
- කිහිප ආකාරයක සලකුණු මාර්ගෝපදේශ (Rubrics) හා ලකුණු ලබා දීමේ නිර්ණායක ඒ ඒ ක්‍රියාකාරකම් සඳහා ලබා දී ඇත.
- ලකුණු ලබා දීමට පෙර ඒවා මැනවින් අධ්‍යයනය කිරීම සුදුසු ය.
- ශිෂ්‍යයාගේ ප්‍රතිසාධන මට්ටම පිළිබඳ සැලකිලිමත් වෙමින් ඒ අනුව ලකුණු ලබා දිය යුතු ය.
- සලකුණු මාර්ගෝපදේශ (Rubrics) අනුව මොඩියුලයකට හිමි වන උපරිම ලකුණු සංඛ්‍යාව 100කි.

**පහත කරුණු කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරන්න.**

- මොඩියුලයේ ලබා දී ඇති සියලු ම ක්‍රියාකාරකම් පාසලේ නියමිත කාලච්ඡේද ඇතුළත සිදු කරන්න.
- ශිෂ්‍යයා අපේක්ෂිත සාධන මට්ටමට ළඟා නො වන අවස්ථාවල දී ප්‍රතිකාර්ය ඉගෙනුම් අවස්ථා සැලසුම් කර කරන්න.
- ලිඛිත පිළිතුරු අපේක්ෂිත ඇගයීම්වල දී ලිඛිත ව පිළිතුරු ලබා දීමට අපහසු ශිෂ්‍යයන් සිටී නම් ඔවුන්ගෙන් පමණක් වාචික ව පිළිතුරු ලබා ගනිමින් තක්සේරුකරණයේ හා ඇගයීමේ යෙදෙන්න.
- වැඩිදුර ඉගෙනුම සඳහා ලබා දී ඇති ක්‍රියාකාරකම්වලට අමතර ව වෙනත් ගෙදර වැඩ ලබා දීමෙන් හැකිතාක් වළකින්න.
- ශිෂ්‍යයාට නිවසේ දී විවේකය, විනෝදය හා නින්ද ලබා ගැනීමට පවතින කාලයට හා අවකාශයට බාධා නොවන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගන්න.

**මොඩියුලය භාවිතයේ දී පහත කරුණු පිළිබඳ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අවධානය යොමු කරවන්න.**

- මොඩියුලය පිරිසිදු ව භාවිත කිරීම
- සැම ක්‍රියාකාරකමකට ම පෙර ලබා දී ඇති උපදෙස් හොඳින් කියවීම
- කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යෙදීමේ දී මිතුරු මිතුරියන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම
- ක්‍රියාකාරකම්වල නිරත වීමේ දී හා ස්වයං තක්සේරුකරණයේ දී අවංක ව කටයුතු කිරීම
- ගැටලු මතු වන අවස්ථාවල දී ගුරු උපදෙස් හා මග පෙන්වීම ලබා ගැනීම
- සබැඳි (Links) වෙත පිවිසීමේ දී හා අන්තර්ජාලය භාවිතයේ දී ගුරු අධීක්ෂණය යටතේ කටයුතු කිරීම

**ඇගයීම් ක්‍රමවේදය**
**මොඩියුල තක්සේරුකරණය හා ඇගයීම**

එක් මොඩියුලයකට නියමිත කාලය සම්මුඛ පැය 10කි. හිමි වන සම්භාර (Credit) ගණන එකකි. මොඩියුලයට අදාළ සම්භාර අගය තීරණය කිරීම සඳහා සම්භවන තක්සේරුව සහ සම්පිණ්ඩිත තක්සේරුව යොදා ගනු ලැබේ. එහි ලකුණු බෙදී යාමේ ප්‍රතිශතය පහත පරිදි වේ.

සම්භවන තක්සේරුව - 70%
සම්පිණ්ඩිත තක්සේරුව - 30%

එක් එක් මොඩියුලයේ තක්සේරුකරණ කාර්යන් කිහිපයක් ඇත. උදාහරණ වශයෙන් පළමු මොඩියුලයේ තක්සේරුකරණ කාර්යන් හතක් ඇතුළත් ව ඇත. එම එක් එක් කාර්ය සඳහා පහත ආකෘතියේ දැක්වෙන ආකාරයට සටහන් යොදා ගත යුතු ය. සලකුණු මාර්ගෝපදේශ (Rubrics) යොදා ගැනීමකින් තොර ව ලකුණු ලබා දීමේ දී එම තක්සේරුකරණ කාර්යට එක් එක් ශිෂ්‍යයාට හිමි ලකුණ සමස්ත ලකුණට එක් කළ යුතු ය.

**සුබස් මිහිර - ඉගෙනුම් අවස්ථාව 02**

| අනු අංකය | ශිෂ්‍යයාගේ/ ශිෂ්‍යාවගේ නම | සුබස් මිහිර තක්සේරුකරණ කාර්ය 2 | නිර්ණායක 1 | | | | නිර්ණායක 2 | | | | නිර්ණායක 3 | | | | නිර්ණායක 4 | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සලකුණු මාර්ගෝපදේශ අනුව ප්‍රාප්ති මට්ටම් | | | | සලකුණු මාර්ගෝපදේශ අනුව ප්‍රාප්ති මට්ටම් | | | | සලකුණු මාර්ගෝපදේශ අනුව ප්‍රාප්ති මට්ටම් | | | | සලකුණු මාර්ගෝපදේශ අනුව ප්‍රාප්ති මට්ටම් | | | | |
| | | | 4 | 3 | 2 | 1 | 4 | 3 | 2 | 1 | 4 | 3 | 2 | 1 | 4 | 3 | 2 | 1 | |
| 1 | A | | | | | | | | | | | | | | | | | | |
| 2 | B | | | | | | | | | | | | | | | | | | |
| 3 | C | | | | | | | | | | | | | | | | | | |

**මොඩියුල ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්**

**මොඩියුලය 01 - සුබස් මිහිර**

**හැඳින්වීම**

සිංහල භාෂාව, විෂයක් ලෙස මෙන් ම අනෙක් විෂයන් ඉගෙන ගැනීමේ මාධ්‍යක් ලෙස ද අපට ඉතා වැදගත් වේ. සවන් දීම, කතා කිරීම, කියවීම සහ ලිවීම යනු භාෂාවේ ප්‍රධාන කුසලතා වන අතර චතුර භාෂා හැකියාවක් ඇති කර ගැනීම සඳහා මෙම භාෂා කුසලතා සියල්ල ම වර්ධනය කර ගැනීම අවශ්‍ය වේ. විශේෂයෙන් ම සවන් දීමේ හා කතා කිරීමේ කුසලතා මනා ලෙස වර්ධනය කර ගැනීම, අපට එදිනෙදා ජීවිතයේ ප්‍රායෝගික සන්නිවේදන අවස්ථාවලට සාර්ථක ව හා ආත්ම විශ්වාසයෙන් යුතු ව මුහුණ දීමට පහසුවක් වේ. 6 ශ්‍රේණියේ 'සුබස් මිහිර' මොඩියුලය සකස් කර ඇත්තේ සවන් දීම හා කතා කිරීම යන භාෂා කුසලතා වර්ධනය කිරීම සඳහා ය. මෙම මොඩියුලයෙහි,

1. සුහද සංවාද
2. දුරකතන සංවාද
3. මාතෘකානුකූල කතා
4. විවිධ මාධ්‍ය යොදා ගෙන සිදු කරන ඉදිරිපත් කිරීම්

යන ඉගෙනුම් අවස්ථා අන්තර්ගත වන අතර එක් එක් ඉගෙනුම් අවස්ථාවට අදාළ ප්‍රායෝගික පුහුණුවක් හා පරිචයක් ලබා ගැනීමට හැකි වන ආකාරයෙන් මෙහි සූතර්‍ය ඉගෙනුමට යෝග්‍ය ක්‍රියාකාරකම් ඇතුළත් කර ඇත. එමගින් සවන් දීමේ හා කතා කිරීමේ මෙන් ම ඉදිරිපත් වීමේ කුසලතා ද වර්ධනය කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. හතර වන කාර්මික විප්ලවයත් සමග ඇති වන අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය හැකි 21 වන සියවසේ කුසලතාවලින් පිරිපුන් පුරවැසියන් බිහි කිරීම මෙහි තවත් එක් අරමුණකි.

විසි එක් වන සියවසේ කුසලතා නම්,

Creativity (නිර්මාණශීලිත්වය)
Collaboration (එක් ව කටයුතු කිරීම)
Communication (සන්නිවේදනය)
Critical Thinking (විවේචනාත්මක චින්තනය)
Information Literacy (තොරතුරු සාක්ෂරතාව)
Media Literacy (මාධ්‍ය සාක්ෂරතාව)
Technology Literacy (තාක්ෂණ සාක්ෂරතාව)
Flexibility (නම්‍යශීලීභාවය)
Leadership Skill (නායකත්ව කුසලතා)
Initiative (මුල පිරීම)
Productivity (ඵලදායිතාව)
Social Skills (සමාජ කුසලතා)

ඉහත කුසලතා අත්පත් කර ගැනීමෙන් අනාගත වැඩ ලෝකයට ආත්ම විශ්වාසයෙන් යුතු ව මුහුණ දිය හැකි, අභියෝග ජය ගත හැකි සාර්ථක පුරවැසියන් බිහි කිරීමට මෙම මොඩියුලය මහඟු අත්වැලක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

| 6 ශ්‍රේණිය | | | | |
|---|---|---|---|---|
| ඉගෙනුම් පල | නිර්දිෂ්ට පෙළ හා අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
| 1.1<br>ආචාරශීලී ව හා සංයමයෙන් යුතු ව සුහද සංවාදවලට සවන් දී ප්‍රතිචාර දක්වයි. | ගෙවතු වගාව පිළිබඳ මුණුබුරා සහ සීයා අතර සුහද සංවාදයක් (කාලය මිනිත්තු 3-5)<br>• නිශ්චිත තොරතුරු (චරිත, ස්ථානය, වෙලාව, ද්‍රව්‍ය ... ආදි)<br>• වක්‍ර ව ප්‍රකාශිත තොරතුරු (තේමාව, අරමුණ, මාතෘකාව... ආදි)<br>• අලුත් වචන<br>• පුද්ගල තරාතිරම අනුව උචිත ආමන්ත්‍රණ පද හා ආචාරශීලී යෙදුම් භාවිතය<br>• ආචාරශීලීභාවය<br>• සුහදශීලීභාවය<br>• සංයමයෙන් සවන් දීම<br>• සංයමයෙන් කතා කිරීම | • සවන් දීම<br>• කතා කිරීම | 1.1.1<br>සුහද සංවාදයකට සක්‍රිය ව සවන් දී එහි ඇතුළත් නිශ්චිත තොරතුරු දෙකක් හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | • නිශ්චිත තොරතුරු දෙකක් හඳුනා ගෙන ප්‍රකාශ කිරීම |
| | | | 1.1.2<br>සුහද සංවාදයකට සක්‍රිය ව සවන් දී එහි ඇතුළත් වක්‍ර ව ප්‍රකාශිත තොරතුරු දෙකක් හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | • වක්‍ර ව ප්‍රකාශිත තොරතුරු දෙකක් හඳුනා ගෙන ප්‍රකාශ කිරීම |
| | | | 1.1.3<br>සුහද සංවාදයකට සක්‍රිය ව සවන් දී එහි ඇතුළත් අලුත් වචන දෙකක් හඳුනා ගැනීම ප්‍රදර්ශනය කරයි. | • අලුත් වචන දෙකක් හඳුනා ගැනීම ප්‍රදර්ශනය කිරීම |
| 1.2<br>ආචාරශීලී ව හා සංයමයෙන් යුතු ව දුරකතන සංවාදවල සවන් දී ප්‍රතිචාර දක්වයි. | ගෙවතු වගාව සඳහා උපදෙස් ලබා ගැනීම පිළිබඳ ශිෂ්‍යයෙකු සහ ගොවි ජන සේවා කාර්යාලයේ නිලධාරියෙකු අතර ඇති වන දුරකතන සංවාදයක් (කාලය මිනිත්තු 3-5)<br>• ආමන්ත්‍රණ පද හා ආචාරශීලී යෙදුම්<br>• වාක්‍ය රටා<br>• අවස්ථානුකූල ප්‍රතිචාර<br>• අඛණ්ඩතාව පවත්වා ගැනීම<br>• චතුරභාවය<br>• දුරකතන සංවාදයක දී ඇමතුම ලබා දෙන්නා විසින් සැලකිලිමත් විය යුතු කරුණු | • සවන් දීම<br>• කතා කිරීම | 1.2.1<br>දුරකතන සංවාදයකට සක්‍රිය ව සවන් දී එහි ඇතුළත් නිශ්චිත තොරතුරු දෙකක් හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | • නිශ්චිත තොරතුරු දෙකක් හඳුනා ගෙන ප්‍රකාශ කිරීම |
| | | | 1.2.2<br>දුරකතන සංවාදයකට සක්‍රිය ව සවන් දී එහි ඇතුළත් වක්‍ර ව ප්‍රකාශිත තොරතුරු දෙකක් හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | • වක්‍ර ව ප්‍රකාශිත තොරතුරු දෙකක් හඳුනා ගෙන ප්‍රකාශ කිරීම |
| | | | 1.2.3<br>දුරකතන සංවාදයකට සක්‍රිය ව සවන් දී එහි ඇතුළත් අලුත් වචන දෙකක් හඳුනා ගැනීම ප්‍රදර්ශනය කරයි. | • අලුත් වචන දෙකක් හඳුනා ගැනීම ප්‍රදර්ශනය කිරීම |

| ඉගෙනුම් පල | නිර්දිෂ්ට පෙළ හා අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|---|
| | - ඇමතුම ලබා දෙන්නා තමාව හඳුන්වා දීම<br>- ඇමතුම ලබා දෙන්නා තම අවශ්‍යතාව කෙටියෙන් පැහැදිලි කිරීම<br>- ඇමතුම පවත්වා ගෙන යාම සඳහා අවසර පැතීම<br>- සංයමයෙන් හා ආචාරශීලී ව කතා කිරීම<br>- අත්‍යවශ්‍ය කරුණු පමණක් සංක්ෂිප්ත ව ඉදිරිපත් කිරීම<br>- ආචාරශීලී ව ඇමතුම අවසන් කිරීම<br>● දුරකතන සංවාදයක දී ඇමතුම ලබා ගන්නා (ග්‍රාහකයා) විසින්,<br>- දුරකතනය තුන්වරක් නාද කිරීමට පෙර හෝ හැකි ඉක්මනින් ප්‍රතිචාර දැක්වීම<br>- ආචාරශීලී ව ආමන්ත්‍රණය කිරීම<br>- ඇමතුම ලබා දෙන්නාගේ අවශ්‍යතාව විමසීම<br>- ඇමතුම ලබා දෙන්නාට අවධානයෙන් සවන් දීම<br>- සංක්ෂිප්ත ව අදාළ තොරතුරු පමණක් ලබා දීම<br>- ආචාරශීලී ව ඇමතුම අවසන් කිරීම | | 1.2.4<br>දුරකතන සංවාදයක දී සුදුසු වාංමාලාව භාවිත කරමින් කතා කරයි. | ● දුරකතන සංවාදවල දී සුදුසු ආමන්ත්‍රණ පදයක් හා ආචාරශීලී යෙදුම් දෙකක් භාවිතයට ගැනීම |
| | | | 1.2.5<br>දුරකතන සංවාදයක දී සුදුසු වාක්‍ය රටා භාවිත කරයි. | ● ඇමතුම ලබා ගැනීමේ දී/පිළිතුරු දීමේ දී සුදුසු වාක්‍ය රටා භාවිත කිරීම<br>● ඇමතුම පවත්වා ගෙන යාමේ දී සුදුසු වාක්‍ය රටාවක් භාවිත කිරීම<br>● ඇමතුම අවසන් කිරීමේ දී සුදුසු වාක්‍ය රටාවක් භාවිත කිරීම |
| | | | 1.2.6<br>කාලය කළමනාකරණය කර ගනිමින් මිනිත්තු තුනක පම දුරකතන සංවාදයක නිරත වෙයි. | ● කාලය කළමනාකරණය කර ගනිමින් මිනිත්තු තුනක පම දුරකතන සංවාදයක නිරත විම. |
| 1.3<br>දෙන ලද මාතෘකාවට අදාළ ව කතාවක් පවත්වයි. | පරිසරය සුරකිමු, මගේ රට මට අගෙයි, මා කැමති ම වීරයා, වවන්නෝ දිනන්නෝ ආදි දෙන ලද මාතෘකාවට අදාළ ව සංවිධානාත්මක ව කතා කිරීම (කාලය මිනිත්තු 2-3)<br>● උචිත වාංමාලා<br>● ප්‍රමාණවත් කරුණු<br>● විචාරශීලී අදහස් | ● සවන් දීම<br>● කතා කිරීම | 1.3.1<br>මාතෘකානුකූල කතාවකට සක්‍රිය ව සවන් දී එහි ඇතුළත් නිශ්චිත තොරතුරු දෙකක් හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ● නිශ්චිත තොරතුරු දෙකක් හඳුනා ගෙන ප්‍රකාශ කිරීම |
| | | | 1.3.2<br>මාතෘකානුකූල කතාවකට සක්‍රිය ව සවන් දී එහි ඇතුළත් වක්‍ර ව ප්‍රකාශිත තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ● වක්‍ර ව ප්‍රකාශිත තොරතුරු දෙකක් හඳුනා ගෙන ප්‍රකාශ කිරීම |

| ඉගෙනුම් පල | නිර්දිෂ්ට පෙළ හා අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|---|
| | • නිරවුල් බව<br>• විෂය කරුණුවල පෙළගැස්ම හා ගලා යෑම<br>• නිසි හඬ පාලනය හා උචිත වේගය<br>• උචිත අංග චලන<br>• කාල කළමනාකරණය | | 1.3.3<br>මාතෘකානුකූල කතාවකට සක්‍රිය ව සවන් දී එහි ඇතුළත් අලුත් වචන දෙකක් හඳුනා ගැනීම ප්‍රදර්ශනය කරයි. | • අලුත් වචන දෙකක් හඳුනා ගැනීම ප්‍රදර්ශනය කිරීම |
| | | | 1.3.4<br>මාතෘකානුකූල කතාවක දී සුදුසු වාංමාලාව සහ ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් කරමින් කතා කරයි. | • උචිත වාංමාලාවක් යොදා ගැනීම<br>• කරුණු ප්‍රමාණවත් වීම<br>• මාතෘකාවට අදාළ ව නිවැරදි කරුණු දැක්වීම |
| | | | 1.3.5 මාතෘකානුකූල කතාවක දී සංවිධානාත්මක ව හා මනා ගලා යාමකින් යුතු ව කතා කරයි. | • කරුණු සංවිධානාත්මක ව හා ගලා යාමකින් ඉදිරිපත් කිරීම<br>• නිසි හඬ පාලනයෙන් හා විරාමය පවත්වා ගෙන කතා කිරීම<br>• නිවැරදි ව වචන උච්චාරණය කිරීම<br>• කරුණුවල ප්‍රමාණවත් බව<br>• කාල කළමනාකරණය |
| 1.4<br>**සුදුසු මාධ්‍යයක්/ මාධ්‍ය කිහිපයක් භාවිත කොට ඉදිරිපත් කිරීම් සිදු කරයි.** | දේශීය ශක්ති ජනක ආහාරමය පානය - කැඳ පිළිබඳ උචිත මාධ්‍යයක්/ක්‍රමයක් Power Point සමර්පණ, පෝස්ටර්, ගායන, රංගන,) භාවිත කරමින් සිදු කරන බහුමාධ්‍ය ඉදිරිපත් කිරීමක් ලිඛිත ව්‍යවහාරයේ<br>• වියත් වහර<br>• ශාස්ත්‍රීය වචන<br>• පාරිභාෂික වචන<br>• අක්ෂර වින්‍යාසය<br>• ව්‍යාකරණානුකූල වාක්‍ය | • සවන් දීම<br>• කතා කිරීම<br>• කියවීම<br>• ලිවීම | 1.4.1<br>බහුමාධ්‍ය ඉදිරිපත් කිරීමකට සක්‍රිය ව සවන් දී එහි ඇතුළත් නිශ්චිත තොරතුරු දෙකක් හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | • නිශ්චිත තොරතුරු දෙකක් හඳුනා ගෙන ප්‍රකාශ කිරීම |
| | | | 1.4.2<br>බහුමාධ්‍ය ඉදිරිපත් කිරීමකට සක්‍රිය ව සවන් දී එහි ඇතුළත් වක්‍ර ව ප්‍රකාශිත දෙකක් තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | • වක්‍ර ව ප්‍රකාශිත තොරතුරු දෙකක් හඳුනා ගෙන ප්‍රකාශ කිරීම |
| | | | 1.4.3<br>බහුමාධ්‍ය ඉදිරිපත් කිරීමකට සක්‍රිය ව සවන් දී එහි ඇතුළත් අලුත් වචන දෙකක් හඳුනා ගැනීම ප්‍රදර්ශනය කරයි. | • අලුත් වචන දෙකක් හඳුනා ගැනීම ප්‍රදර්ශනය කිරීම |

| ඉගෙනුම් පල | නිර්දිෂ්ට පෙළ හා අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|---|
| | • විරාම ලක්ෂණ හා වචන වෙන් කිරීම<br>• කථන ව්‍යවහාරයේ<br>• නිරවුල් අදහස්<br>• නිවැරදි උච්චාරණය හා හඬ පාලනය<br>• කාල කළමනාකරණය<br>• අවම වශයෙන් මාධ්‍ය දෙකක් වත් සුදුසු පරිදි භාවිත කිරීම | | 1.4.4<br>දෙන ලද තේමාවකට අදාළ ව ඉදිරිපත් කිරීමක් සඳහා සැලසුමක් සකස් කරයි. | • නිවැරදි හා මනා නිමාවකින් යුත් සැලස්මක් සකස් කිරීම |
| | | | 1.4.5<br>ගැළපෙන මාධ්‍ය අවම වශයෙන් දෙකක්වත් භාවිත කොට සිදු කරන ඉදිරිපත් කිරීමක් සඳහා අවශ්‍ය අංග සහ මෙවලම් සකස් කරයි. | • ගැළපෙන මාධ්‍ය අවම වශයෙන් දෙකක් සඳහා අංග සහ මෙවලම් සකස් කිරීම |
| | | | 1.4.6<br>සුදුසු මාධ්‍ය දෙකක් හෝ ඊට වැඩි ගණනක් භාවිත කොට මිනිත්තු පහක ඉදිරිපත් කිරීමක් සිදු කරයි. | • ගැළපෙන මාධ්‍ය අවම වශයෙන් දෙකක්වත් භාවිත කිරීම<br>• උචිත හඬ පාලනය හා විරාමය පවත්වා ගැනීම<br>• කාල කළමනාකරණය කර ගනිමින් මිනිත්තු තුනක පමණ ඉදිරිපත් කිරීමක් සිදු කිරීම |
| | | | 1.4.7<br>භාෂාව නිවැරදි ව හසුරුවමින් ඉදිරිපත් කිරීමක් සිදු කරයි. | • උචිත හඬ පාලනය සහ විරාමය පවත්වා ගැනීම<br>• නිවැරදි භාෂා භාවිතය |

**ඉගෙනුම් අවස්ථාව - 01**
**කාලච්ඡේද 01යි.**

**සුහද සංවාද**

1. සුහද සංවාද පිළිබඳ පෙර දැනුම සිහිපත් කරමින් පාඩමට ප්‍රවේශය ලබා ගැනීම සඳහා 'පෙර මතකය අවදි කරමු' යටතේ ඇති කරුණු පිළිබඳ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමග සාකච්ඡා කර වාචික පිළිතුරු ලබා ගන්න.
2. මෙය සුහද සංවාදවලට සවන් දීම සහ සුහද සංවාදවල නිරත වීම පිළිබඳ ප්‍රායෝගික අද්දැකීම් ලබා දීම සඳහා සැලසුම් කර ඇති ක්‍රියාකාරකමක් වන බැවින් ශිෂ්‍යයාගේ වයසට සහ ශ්‍රේණියට නොගැළපෙන අනවශ්‍ය න්‍යායික දැනුම ලබා දීමෙන් වළකින්න.
3. පහත කරුණු පිළිබඳ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමග සාකච්ඡා කරන්න.
   - සුහද සංවාද සිදු වන අවස්ථා
   - එක් එක් අවස්ථාව අනුව භාෂා භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණු
   - සුහද සංවාදයක දී ආචාරශීලී ව හා සංයමයෙන් යුතු ව අවස්ථෝචිත ව ප්‍රතිචාර දැක්වීමේ වැදගත්කම
     - ♦ පුද්ගල තරාතිරම අනුව උචිත ආමන්ත්‍රණ පද භාවිතය
       උදා : ස්වාමීන් වහන්ස, පියතුමනි, පූජකතුමනි, විදුහල්පතිතුමනි
     - ♦ ආචාරශීලී යෙදුම් භාවිතය
       උදා : ස්තුතියි, කරුණාකර, සමාවෙන්න
     - ♦ සුබ පැතුම් භාවිතය
       උදා : ආයුබෝවන්, සුබ උදෑසනක්, සුබ රාත්‍රියක්,
     - ♦ අන් අයගේ ගෞරවය ආරක්ෂා වන පරිදි සංයමයෙන් කතා කිරීම
     - ♦ ආවේගශීලී නොවීම
     - ♦ උචිත ඉරියව් හා අංග චලන පවත්වා ගැනීම

- අවධානයෙන් හා අවබෝධයෙන් සවන් දී සංවාදය පවත්වා ගෙන යාමේ සහ ප්‍රතිචාර දැක්වීමේ වැදගත්කම

**ක්‍රියාකාරකම 1.1 - සුහද සංවාදයට සවන් දී පිළිතුරු ලබා දීම**

- සවන් දීමේ ක්‍රියාකාරකම සඳහා උචිත පරිදි පන්ති කාමරය සකස් කර ගන්න.
- සවන් දීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු සහ සිසු චර්යාව පවත්වා ගත යුතු ආකාරය පිළිබඳ ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කරන්න.
- පටිගත කරන ලද සුහද සංවාදයට සවන් දීමට අවශ්‍ය තාක්ෂණික උපකරණ සහ සම්පත් නොමැති අවස්ථාවක දී ශිෂ්‍ය ශිෂ්‍යාවන් යොදා ගෙන සජීවී ව සංවාදය සිදු කරන්න (සංවාදය සඳහා අදාළ පිටපත මෙම ඉගෙනුම් අවස්ථාව අවසානයේ දක්වා ඇත.)
- පටිගත කරන ලද සුහද සංවාදයට සවන් දීම සඳහා පහත ලබා දී ඇති QR කේතය යොදා ගන්න.
- සුහද සංවාදයට දෙවරක් සවන් දීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවස්ථාව ලබා දෙන්න.
- සංවාදයට සවන් දෙන අතර ම පිළිතුරු සටහන් කර ගන්නා ලෙස ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට උපදෙස් ලබා දෙන්න.
- ඇගයීම සිදු කර ප්‍රතිපෝෂණය ලබා දෙන්න.
- ක්‍රියාකාරකම අවසානයේ මොඩියුලයේ ලබා දී ඇති 'ස්වයං තක්සේරුව' සම්පූර්ණ කිරීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවශ්‍ය මග පෙන්වීම සිදු කරන්න.

Channel NIE

QR කේතය

**තක්සේරුකරණ කාර්ය 01**
**ලකුණු ලබා දීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|---|
| 1.1.1<br>සුහද සංවාදයකට සක්‍රිය ව සවන් දී එහි ඇතුළත් නිශ්චිත තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | නිශ්චිත තොරතුරු දෙකක් ප්‍රකාශ කිරීම (චරිත, ස්ථාන, වෙලාව, ද්‍රව්‍ය ආදි) | 1 | 1 |
| | | 2 | 1 |
| 1.1.2<br>සුහද සංවාදයකට සක්‍රිය ව සවන් දී එහි ඇතුළත් වක්‍ර ව ප්‍රකාශිත තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | වක්‍ර ව ප්‍රකාශිත තොරතුරු දෙකක් හඳුනා ගෙන ප්‍රකාශ කිරීම (තේමාව, අරමුණ, මාතෘකාව ආදි) | 5 | 2 |
| | | 6 | 2 |
| | | 7 | 2 |
| 1.1.3<br>සුහද සංවාදයකට සක්‍රිය ව සවන් දී එහි ඇතුළත් අලුත් වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | අලුත් වචන හඳුනා ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 3 | 3 |
| | | 4 | 3 |
| මුළු ලකුණු | | | 14 |

**ක්‍රියාකාරකම 1.2 - වැඩිදුර ඉගෙනුම (භූමිකා රංගනය)**

- සුහද සංවාදයක් භූමිකා රංගනයෙන් ඉදිරිපත් කිරීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන් සූදානම් කරවන්න.
- ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන ශිෂ්‍ය ශිෂ්‍යාවන් කිහිප දෙනෙකුට සුහද සංවාදයක් සඳහා සුදුසු මාතෘකාවක් ලබා දෙන්න.
- උදා- පාසලෙන් සැලසුම් කර ඇති අධ්‍යාපන චාරිකාව පිළිබඳ පන්තියේ සිසුන් කිහිප දෙනෙකු සහ ගුරුතුමිය අතර ඇති වන සුහද සංවාදය
- එම මාතෘකාවට අනුව සුහද සංවාදය ගොඩනගා ගැනීමට මග පෙන්වන්න.
- සංයමය හා ආචාරශීලීත්වය පිළිබඳ සැලකිලිමත් වෙමින් භූමිකා රංගනයකින් සුහද සංවාදය ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්න.
- ඉදිරිපත් කිරීම් අවසානයේ කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, සන්නිවේදන කුසලතා, නිර්මාණශීලීත්වය වැනි කරුණු අගය කරමින් අදහස් දක්වන්න.
- ඉදිරිපත් කිරීම අගය කරමින් අදහස් දැක්වීමට පන්තියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවස්ථාව ලබා දෙන්න.
- මෙම ක්‍රියාකාරකම සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකරන අතර පන්ති කාමරයේ ඇගයීම ප්‍රමාණවත් වේ.

ඇමුණුම 1

**(ක්‍රියාකාරකම 1.1ට අදාළ සුහද සංවාදයේ පිටපත)**

දරුවා ඃ- සීයේ... මම ඇතුළට ආවට කමක් නැද්ද?

සීයා ඃ- ආ... මගේ පුතේ, ඇතුළට එන්න.

දරුවා ඃ- කොහොමද සීයේ, සීයා හොඳින් නේද?

සීයා ඃ- ඔව් පුතා. මම බොහොම හොඳින්.

දරුවා ඃ- සීයේ, මේ පරණ බඩු කාමරේ සීයා මොනව ද හොයන්නේ.

සීයා ඃ- අපේ ගෙදර වැඩි ඉඩකඩක් නැති නිසා එළවළු පැළයක්, පලතුරු පැළයක් හිටවන්න පුළුවන් භාජන ටිකක් මම හෙවුවේ.

දරුවා ඃ- ඇයි සීයේ බොරුවට මහන්සි වෙන්නේ. අපිට ඕන තරම් එළවළු, පලතුරු කඩෙන් ගන්න පුළුවන්නේ.

සීයා ඃ- පුතා, අපි එදිනෙදා පරිභෝජනය කරන ආහාර අපට ගෙදර දී ම වවාගන්න පුළුවන්නම් ඒක අපේ සෞඛ්‍යය යහපත් ව පවත්වා ගන්න ගොඩාක් වැදගත් වෙනවා. ඒ වගේ ම පුතාගේ තාත්තට ලොකු මුදලකුත් ඉතිරි කරලා දෙන්න පුළුවන්. රටටත් මුදල් ඉතිරි කරලා දෙන්න පුළුවන්.

දරුවා ඃ- අනේ සීයේ... ඒ කොහොම ද කියලා මට කියන්න පුළුවන් ද?

සීයා ඃ- ආ... ඒක මෙහෙමයි පුතා. වගා කරන්නේ අපේ පවුලට ප්‍රමාණවත් තරමට. එතකොට අපිට කෘමිනාශක භාවිත කරන්න ඕනෙත් නෑ. කුස්සියේ ඉවත දමන දේවල්වලින් කාබනික පොහොර හදා ගෙන පාවිච්චි කරන්නත් පුළුවන්. ඒක මොන තරම් සෞඛ්‍යාරක්ෂිත ද? එතකොට පිටරටවලින් ගේන එළවලු, පලතුරු ජාති අපි ගන්නෙත් නැති නිසා පුතාගේ තාත්තට වගේ ම රටටත් ලොකු මුදලක් ඉතුරු වෙනවා.

දරුවා ඃ- ඇත්තමයි සීයේ, මටත් දැන් තමයි තේරුණේ අපි මොන තරම් පිටරට කෑම ජාති කනව ද කියලා. ඇපල්, මිදි, දොඩම් වගේ කෑම කෑවම ඒ සල්ලි ඔක්කොම පිටරටටනේ. පිටරට කෑම කන එක නවත්තලා අපිට අවශ්‍ය දේවල් අපි ම වවා ගත්ත නම් අපේ රට ඇතුළේ ලොකු මුදලක් ඉතුරු වෙනවා. එහෙම නේද සීයේ.

සීයා ඃ- මගේ පුතා හරිම බුද්ධිමත්. මම කිව්වටත් වඩා දේවල් තේරුම් අරන් තියනවානේ. මගේ පුතාට රට ගැන තියෙන හැඟීම ගැන මට හරි ම සතුටුයි. පුතා වගේ ම මේ රටේ හැම දරුවෙක් ම තමන් උපන් මවුබිමට ආදරය කරනව නම් අපේ රට හදන එක එච්චර අමාරු වැඩක් නෙවෙයි.

දරුවා ඃ- මට මේ දේවල් කියලා දුන්නට සීයට ගොඩක් ස්තුතියි!

**ඉගෙනුම් අවස්ථාව 02**
**කාලච්ඡේද 02යි.**

**දුරකතන සංවාද**

1. දුරකතන සංවාද පිළිබඳ පෙර දැනුම සිහිපත් කරමින් 'පෙර මතකය අවදි කරමු' යටතේ ඇති කරුණු පිළිබඳ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමග සාකච්ඡා කර වාචික පිළිතුරු ලබා ගන්න.
2. මෙය දුරකතන සංවාදවලට සවන් දීම සහ දුරකතන සංවාදවල නිරත වීම පිළිබඳ ප්‍රායෝගික අද්දැකීම් ලබා දීම සඳහා සැලසුම් කර ඇති ක්‍රියාකාරකමක් වන බැවින් ශිෂ්‍යයාගේ වයසට සහ ශ්‍රේණියට නොගැළපෙන අනවශ්‍ය න්‍යායික දැනුම ලබා දීමෙන් වලකින්න.
3. දුරකතන සංවාදයක නිරත වීමේ දී ඇමතුම ලබා දෙන්නා සහ ඇමතුම ලබා ගන්නා සැලකිලිමත් විය යුතු කරුණු මොඩියුලය ඇසුරෙන් හඳුන්වා දෙන්න.
4. දුරකතන සංවාදයක නිරත වීමේ දී ඇමතුම ලබා දෙන්නා සහ ඇමතුමට පිළිතුරු දෙන්නා විසින් යොදා ගන්නා ආචාරශීලී යෙදුම් හා වාක්‍ය රටා ශිෂ්‍යයන්ට හඳුන්වා දෙන්න.

**දුරකතන ඇමතුම් ලබා ගැනීමේ දී යොදා ගත හැකි ආචාරශීලී යෙදුම් හා වාක්‍ය රටා**

- **දුරකතන ඇමතුම ආරම්භයේ දී තමා හඳුන්වා දීම**
  - මගේ නම...
  - මේ කතා කරන්නේ ...
  - මම...
- **ඇමතුම පවත්වා ගෙන යාමට අවසර ගැනීම**
  - මේ වෙලාවේ කතා කරන්න පුළුවන් ද?
  - මේ වෙලාවේ කතා කිරීම කරදරයක් ද?
  - මට ........................ට කතා කරන්න පුළුවන් ද?
  - මේ කතා කරන්නේ................ ද?
- **අවශ්‍යතාව කෙටියෙන් පැවසීම**
  - මට දැනගන්න අවශ්‍ය ... ගැනයි
  - .... ගැන දැනගන්නයි මම කතා කළේ
  - මට ඒ ගැන තොරතුරු ටිකක් කියනව ද?
  - කරුණාකරලා මට කියන්න...
  - මට ඒ ගැන ටිකක් පැහැදිලි කරනව ද?
  - වැඩි විස්තර දැනගන්න පුළුවන් ද?

- **ආචාරශිලී යෙදුම් භාවිතය**
  - සමාවෙන්න
  - මට කණගාටුයි
  - කරුණාකරලා
- **ස්තුති කිරීම හා ඇමතුම අවසන් කිරීම**
  - බොහොම ස්තුතියි!
  - තොරතුරු ලබා දුන්නට ස්තුතියි!
  - සුබ දවසක්
  - සුබ රාත්‍රියක්

**දුරකතන ඇමතුම්වලට පිළිතුරු දීමේ දී යොදා ගත හැකි ආචාරශීලී යෙදුම් හා වාක්‍ය රටා**

- **ආචාරශිලී ව ඇමතුමට පිළිතුරු දීම**
  - ආයුබෝවන්
  - සුබ උදැසනක්
  - කරුණාකරලා, මට ඔබතුමාගේ/ඔබේ නම දැන ගන්න පුළුවන් ද?
  - කරුණාකරලා, මේ කතා කරන්නෙ කවුද කියලා මට දැන ගන්න පුළුවන් ද?

- **අවශ්‍යතාව විමසීම**
    - ♦ ඔබට/ඔයාට දැන ගැනීමට අවශ්‍ය මොනවා ද?
    - ♦ ඔබට යම් තොරතුරක් දැන ගන්න අවශ්‍ය ද?
    - ♦ කතා කිරීමට අවශ්‍ය කා සමග ද?/කා එක්ක ද?

- **අචාරශීලී ව ඇමතුම පවත්වා ගෙන යාම**
    - ♦ ඔව්, අනිවාර්යෙන් ම පුළුවන්?
    - ♦ කණගාටුයි. මේ වෙලාවේ කතා කරන්න බැහැ.
    - ♦ කරුණාකරලා, වෙන වෙලාවක කතා කරන්න.
    - ♦ මම තව පැය භාගයකින් කතා කරන්න ද?
    - ♦ ඔබට තව යමක් දැනගන්න අවශ්‍ය ද?
    - ♦ තව තොරතුරු අවශ්‍ය ද?

- **ඇමතුම අවසන් කිරීම**
    - ♦ කතා කළාට බොහොම ස්තුතියි!
    - ♦ සුබ දවසක්!
    - ♦ සුබ රාත්‍රියක්!

**ක්‍රියාකාරකම 2.1 - දුරකතන සංවාදයට සවන් දීම**

- සවන් දීමේ ක්‍රියාකාරකම සඳහා උචිත පරිදි පන්ති කාමරය සකස් කර ගන්න.
- සවන් දීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු සහ සිසු චර්යාව පවත්වා ගත යුතු ආකාරය පිළිබඳ ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කරන්න.
- පටිගත කරන ලද දුරකතන සංවාදයට සවන් දීමට අවශ්‍ය තාක්ෂණික උපකරණ සහ සම්පත් නොමැති අවස්ථාවක දී ශිෂ්‍ය ශිෂ්‍යාවන් යොදා ගෙන සජීවී ව සංවාදය සිදු කරන්න. (සංවාදයට අදාළ පිටපත මෙම ඉගෙනුම් අවස්ථාව අවසානයේ දක්වා ඇත.)
- පටිගත කරන ලද දුරකතන සංවාදයට සවන් දීම සඳහා මෙහි ලබා දී ඇති QR කේතය යොදා ගන්න.
- 'දුරකතන සංවාදයට දෙවරක් සවන් දීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවස්ථාව ලබා දෙන්න.
- සංවාදයට සවන් දෙන අතර ම පිළිතුරු සටහන් කර ගන්නා ලෙස ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට උපදෙස් ලබා දෙන්න.
- ඇගයීම සිදු කර ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

Channel NIE

QR කේතය

තක්සේරුකරණ කාර්ය 01
**ලකුණු ලබා දීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|---|
| 1.2.1<br>දුරකතන සංවාදයකට සක්‍රිය ව සවන් දී එහි ඇතුළත් නිශ්චිත තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | නිශ්චිත තොරතුරු දෙකක් ප්‍රකාශ කිරීම | 1 | 1 |
| | | 2 | 1 |
| 1.2.2<br>දුරකතන සංවාදයකට සක්‍රිය ව සවන් දී එහි ඇතුළත් වක්‍ර ව ප්‍රකාශිත තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | වක්‍ර ව ප්‍රකාශිත තොරතුරු දෙකක් හඳුනා ගෙන ප්‍රකාශ කිරීම (තේමාව, අරමුණ, මාතෘකාව ආදි) | 3 | 3 |
| | | 4 | 3 |
| 1.2.3<br>දුරකතන සංවාදයකට සක්‍රිය ව සවන් දී එහි ඇතුළත් අලුත් වචන හඳුනා ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | අලුත් වචන දෙකක් හඳුනා ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 5 | 2 |
| | | 6 | 2 |
| මුළු ලකුණු | | | 12 |

- **ක්‍රියාකාරකම 2. 2- දුරකතන සංවාදයක නිරත වීම**
  - දුරකතන සංවාදවල නිරත වීමේ දී ඇමතුම ලබා දෙන්නා සහ ඇමතුම ලබා ගන්නා විසින් සැලකිලිමත් විය යුතු කරුණු නැවත සිහිපත් කරන්න.
  - එම කරුණු ගැන සැලකිලිමත් වෙමින් දුරකතන සංවාදවල නිරත විය යුතු බව ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සිහිපත් කරන්න.
  - 'වැඩිදුර ඉගෙනුම' යටතේ ලබා දී ඇති දුරකතන සංවාදය ඇසුරින් ඉහත කරුණු තව දුරටත් තහවුරු කරන්න.
  - එම දුරකතන සංවාදයට සවන් දීමට මොඩියුලයේ ලබා දී ඇති QR කේතය භාවිත කරන්න.
  - ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇගයීමට ලක් වන ක්ෂේත්‍ර පිළිබඳ පූර්ව දැනුවත් කිරීමක් සිදු කරන්න.
  - පන්තියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් දෙදෙනා බැගින් කණ්ඩායම් කරන්න.
  - එක් එක් කණ්ඩායම සඳහා පහත දුරකතන සංවාද අවස්ථා කාඩ් පත්වල ලියා ලබා දෙන්න.

♦ පොතක් මිල දී ගැනීම පිළිබඳ විමසීමට පොත් අලෙවි සැලකට ලබා දෙන දුරකතන ඇමතුම (පොත මිල දී ගන්නා පුද්ගලයා සහ පොත් අලෙවි සැලේ දුරකතන ක්‍රියාකරු අතර)

♦ පුස්තකාලයක සාමාජිකත්වය ලබා ගැනීම පිළිබඳ තොරතුරු ලබා ගැනීමට මහජන පුස්තකාලයට ලබා දෙන දුරකතන ඇමතුම (පුස්තකාලයාධිපති සහ ශිෂ්‍යයෙකු අතර)

♦ නාට්‍යයක් නැරඹීම සඳහා ටිකට් පත් මිල දී ගැනීමට නාට්‍ය ශාලාවකට ලබා දෙන දුරකතන ඇමතුම (ටිකට් පත් මිල දී ගන්නා සහ නාට්‍ය ශාලාවේ ටිකට් පත් අලෙවිකරු අතර)

♦ රාත්‍රී ආහාරය මිල දී ගෙන නිවසට ගෙන්වා ගැනීම සඳහා ආහාර අලෙවි සැලකට ලබා දෙන ඇමතුම (ආහාර මිල දී ගන්නා තැනැත්තා සහ ආහාර අලෙවි සැලේ දුරකතන ක්‍රියාකරු අතර)

- තැපැල් මගින් පාර්සලයක් යැවීම පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා තැපැල් කාර්යාලයට ලබා දෙන ඇමතුම (පාර්සලය යවන්නා හා තැපැල් ස්ථානාධිපති අතර)
- පන්තියේ ශිෂ්‍ය සංඛ්‍යාවට ප්‍රමාණවත් පරිදි තවත් දුරකතන සංවාද අවස්ථා ඔබ විසින් නිර්මාණය කර ගන්න.
- ක්‍රියාකාරකම සඳහා ලකුණු ලබා දීමේ දී පහත දී ඇති සලකුණු මාර්ගෝපදේශ යොදා ගන්න.

- දුරකතන සංවාදයට දෙදෙනාට ම හිමි වන කාලය මිනිත්තු තුනකි.
- ඇමතුම ලබා ගන්නා සහ ඇමතුම ලබා දෙන්නා වශයෙන් වෙන් වෙන් ව නිර්ණායක මත පදනම් ව ලකුණු ලබා දෙන්න.
- කාලය කළමනාකරණය සඳහා දෙදෙනාට ම පොදු ලකුණු ලබා දෙන්න.
- එක් ශිෂ්‍යයෙකුට ලැබිය යුතු මුළු ලකුණු ගණන 8කි.
- ක්‍රියාකාරකම අවසානයේ මොඩියුලයේ ලබා දී ඇති 'ස්වයං තක්සේරුව' සම්පූර්ණ කිරීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවශ්‍ය මග පෙන්වීම සිදු කරන්න.

**තක්සේරු නිර්ණායක සහ සලකුණු මාර්ගෝපදේශ (Rubrics)**

**තක්සේරුකරණ කාර්ය 02**

**ලකුණු ලබා දීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ඉතා හොඳයි 4 | හොඳයි 3 | සාමාන්‍යයි 2 | සංවර්ධනය විය යුතු යි 1 |
|---|---|---|---|---|---|
| 1.2.4 දුරකතන සංවාදයක දී සුදුසු වාංමාලාව භාවිත කරමින් කතා කරයි. | දුරකතන සංවාදයක දී සුදුසු ආමන්ත්‍රණ පදයක් සහ ආචාරශීලී යෙදුම් දෙකක් භාවිත කිරීම (ලකුණු 4යි) | දුරකතන සංවාදයක දී සුදුසු ආමන්ත්‍රණ පදයක් සහ ආචාරශීලී යෙදුම් දෙකක් භාවිත කරයි. | දුරකතන සංවාදයක දී සුදුසු ආමන්ත්‍රණ පද සහ ආචාරශීලී යෙදුමක් භාවිත කරයි. | දුරකතන සංවාදයක දී ආචාරශීලී යෙදුමක් හෝ ආමන්ත්‍රණ පදයක් පමණක් භාවිත කරයි. | දුරකතන සංවාදයක දී සුදුසු ආමන්ත්‍රණ පද හෝ ආචාරශිලි යෙදුම් රහිතව කතා කරයි. |
| 1.2.5 දුරකතන සංව-ාදයක දී සුදුසු වාක්‍ය රටා භාවිත කරයි. | දුරකතන සංවාදයක දී ඇමතුම ලබා දෙන්නා/ ඇමතුම ලබා ගන්නා ආරම්භයේ දී පවත්වා ගැනීමේ දී සහ අවසන් කිරීමේ දී සුදුසු වාක්‍ය රටා භාවිත කිරීම (ලකුණු 4යි) | සුදුසු වාක්‍ය රටා භාවිත කරමින් ඇමතුම ලබා ගන්නා (ග්‍රාහකයා) ඇමතුම ලබා දෙන්නා විසින් භාවිත කළ යුතු මුල, මැද, අග වාක්‍ය රටා සියල්ල අනුගමනය කරමින් දුරකතන සංවාදයේ නිරත වෙයි. | සුදුසු වාක්‍ය රටා භාවිත කරමින් ඇමතුම ලබා ගන්නා (ග්‍රාහකයා) ඇමතුම ලබා දෙන්නා විසින් අවධානය යොමු කළ යුතු කරුණු බොහෝ ප්‍රමාණයක් අනුගමනය කරමින් දුරකතන සංවාදයේ නිරත වෙයි. | සුදුසු වාක්‍ය රටා භාවිත කරමින් ඇමතුම ලබා ගන්නා (ග්‍රාහකයා) ඇමතුම ලබා දෙන්නා විසින් අවධානය යොමු කළ යුතු කරුණුවලින් අඩක් අනුගමනය කරමින් දුරකතන සංවාදයේ නිරත වෙයි. | සුදුසු වාක්‍ය රටා භාවිත කරමින් ඇමතුම ලබා ගන්නා (ග්‍රාහකයා) ඇමතුම ලබා දෙන්නා විසින් අවධානය යොමු කළ යුතු කරුණුවලින් අඩකට වඩා අඩු ප්‍රමාණයක් අනුගමනය කරමින් දුරකතන සංවාදයේ නිරත වෙයි. |
| 1.2.6 කාලය නිසි පරිදි කළමණාකරණය කර ගනිමින් දුරකතන සංවාදයක නිරත වෙයි. | කාලය නිසි පරිදි කළමණාකරණය කර ගනිමින් දුරකතන සංවාදයක නිරත වීම. (ලකුණු 4යි) | මිනිත්තු තුනක පමණ දුරකතන සංවාදයක නිරත වෙයි. | කාලය ඉක්මවා දුරකතන සංවාදයක නිරත වෙයි. | මිනිත්තු දෙකක පමණ දුරකතන සංවාදයක නිරත වෙයි. | මිනිත්තු එකක් හෝ ඊට අඩුවෙන් දුරකතන සංවාදයක නිරත වෙයි. |

ඇමුණුම

**ඉගෙනුම් අවස්ථා - 02 (දුරකතන සංවාදයට අදාළ පිටපත)**

සුපුන් ඃ ආයුබෝවන්. මේ ගොවි ජන සේවා කාර්යාලය ද?

නිලධාරියා ඃ ආයුබෝවන්, ඔව් මේ ගොවි ජන සේවා කාර්යාලය

සුපුන් ඃ මම සුපුන් චාමර. හයේ පන්තියේ ඉගෙන ගන්න ළමයෙක්

නිලධාරියා ඃ පුතාට මොනව ද දැනගන්න ඕනේ?

සුපුන් ඃ මට ගෙවතු වගාව ගැන තොරතුරු ටිකක් දැනගන්න නිලධාරී මහත්මයෙකුට ටිකක් කතා කරන්න පුළුවන් ද?

නිලධාරියා ඃ පුතා කියන්න. මොනව ද දැනගන්න ඕනේ?

සුපුන් ඃ මහත්මයා, අපි ඉන්න ගෙදර මිදුලේ වැඩි ඉඩ කඩක් නම් නෑ. මට දැන ගන්න පුළුවන් ද අඩු ඉඩකඩක වගා කරන්න පුළුවන් මොනවගේ එළවළු, පලතුරු වර්ග ද කියලා?

නිලධාරියා ඃ ඔව් පුතා. පොඩි ඉඩකඩක හරි වගා කරන්න හිතන එක හරි හොඳයි. ඉඩ අඩු තැන්වල වුණත් වම්බටු, බණ්ඩක්කා, තක්කාලි, මිරිස් වගේ දේවල් වවන්න පුළුවන්.
ඒ වගේ ම පුතා, අල වර්ග වුණත් වවන්න පුළුවන්. පලතුරු වවනවා නම් අපට බද්ධ පැළ ගන්න වෙනවා.

සුපුන් ඃ ස්තුතියි මහත්මයා. එතකොට මම ඔබතුමාගේ ආයතනයට ආවොත් බීජ වර්ගයි බද්ධ පලතුරු පැළයි මිල දී ගන්න පුළුවන් ද?

නිලධාරියා ඃ හොඳයි පුතා. එන්න. පුතා ආවොත් අපිට පුතාට බඳුන්ගත වගාවක් කරන විදිහ ප්‍රායෝගික ව කරලා පෙන්වන්න පුළුවන්. පුතා වගේ පොඩි දරුවෙක් බඳුන්ගත වගාව ගැන දක්වන උනන්දුව ගැන මට හරි සතුටුයි. පුතාට අපි උපරිම සහයෝගය දක්වන්න සූදානම්.

සුපුන් ඃ ඔබතුමාගේ කාරුණික සහයෝගයට ස්තුතියි. සුබ දවසක්!

නිලධාරියා ඃ සුබ දවසක් පුතා.

**ඉගෙනුම් අවස්ථාව 03**
**(කාලච්ඡේද 04යි)**

**මාතෘකානුකූල කතා**

1. මාතෘකානුකූල කතා පිළිබඳ පෙර දැනුම සිහිපත් කරමින් පාඩමට ප්‍රවේශය ලබා ගැනීම සඳහා 'පෙර මතකය අවදි කරමු' යටතේ ඇති ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් නිරත කරවන්න.
2. පටිගත කරන ලද මාතෘකානුකූල කතාවට සවන් දීමට සහ නැරඹීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවස්ථාව ලබා දෙන්න. ඒ සඳහා QR කේතය යොදා ගන්න.
3. පටිගත කරන ලද මාතෘකානුකූල කතාවට සවන් දීමට අවශ්‍ය තාක්ෂණික උපකරණ නොමැති අවස්ථාවක දී පන්තියේ ශිෂ්‍යයකු හෝ ශිෂ්‍යාවක යොදා ගෙන කතාව ඉදිරිපත් කරන්න.
4. මාතෘකානුකූල කතාවට අදාළ පිටපත මෙම ඉගෙනුම් අවස්ථාව අවසානයේ දක්වා ඇත.

Channel NIE

QR කේතය

**ක්‍රියාකාරකම 3.1 - මාතෘකානුකූල කතාවට සවන් දී පිළිතුරු ලබා දීම**

- සවන් දුන්/නැරඹූ ලද මාතෘකානුකූල කතාව ඇසුරෙන් ක්‍රියාකාරකම 3.1 යටතේ අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන් යොමු කරවන්න.
- පටිගත කළ කතාවට දෙවරක් සවන් දීමට අවස්ථාව දෙන්න.
- සවන් දෙන අතර ම පිළිතුරු සටහන් කර ගන්නා ලෙස ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට උපදෙස් දෙන්න.
- ඇගයීම් සිදු කර අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**තක්සේරුකරණ කාර්ය 01**
**ලකුණු ලබා දීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|---|
| 1.3.1 මාතෘකානුකූල කතාවකට සක්‍රිය ව සවන් දී එහි ඇතුළත් නිශ්චිත තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | නිශ්චිත තොරතුරු දෙකක් ප්‍රකාශ කිරීම | 1 | 2 |
| | | 2 | 2 |
| 1.3.2 මාතෘකානුකූල කතාවකට සක්‍රිය ව සවන් දී එහි ඇතුළත් වක්‍ර ව ප්‍රකාශිත තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | වක්‍ර ව ප්‍රකාශිත තොරතුරු දෙකක් හඳුනා ගෙන ප්‍රකාශ කිරීම තේමාව, අරමුණ, මාතෘකාව ආදි | 3 | 3 |
| | | 4 | 3 |
| 1.3.3 මාතෘකානුකූල කතාවකට සක්‍රිය ව සවන් දී එහි ඇතුළත් අලුත් වචන හඳුනා ගැනීම ප්‍රදර්ශනය කරයි. | අලුත් වචන දෙකක් හඳුනා ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 5 | 4 |
| මුළු ලකුණු | | | 14 |

ක්‍රියාකාරකම 3.2 - මාතෘකානුකූල කතා ඉදිරිපත් කිරීම

- මාතෘකානුකූල කතාවක් පැවැත්වීමේ දී කතා සැකිල්ලක් නිර්මාණය කර ගැනීමේ වැදගත්කම හා එහි දී අවධානය යොමු කළ යුතු මූලික කරුණු පිළිබඳ පැහැදිලි කර දෙන්න.
- දෙන ලද මාතෘකාවකට අදාළ ව පොත්වලින්, සඟරා හා පුවත්පත්වලින්, රූපවාහිනියෙන්, ගුවන්විදුලියෙන්, අන්තර්ජාලයෙන්, වැඩිහිටියන්ගෙන් හා ගුරුවරුන්ගෙන් කරුණු රැස් කර ගැනීමට හැකි බව පැහැදිලි කරන්න.
- මාතෘකානුකූල කතා සඳහා මොඩියුලයේ දී ඇති මාතෘකාවලින් එකක් තෝරාගැනීමට ශිෂ්‍යයන්ට අවස්ථාවක් දෙන්න.
- කතාවේ මාතෘකාවට අනුව කරුණු රැස් කර ගැනීමට සහ පුහුණු වීමට සතියක පමණ කාලයක් ලබා දෙන්න.
- මාතෘකානුකූල කතාවක් පැවැත්වීමේ දී සැලකිලිමත් විය යුතු පහත කරුණු කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
  - අවසර ගැනීම
  - කරුණු නිවැරදි ව පෙළ ගස්වා ගැනීම
  - උචිත ලෙස හඬ පාලනය කර ගැනීම
  - මාතෘකාවට අදාළ කරුණු ඉදිරිපත් කිරීම
  - නිවැරදි ව තොරතුරු ඉදිරිපත් කිරීම
  - සිත් ගන්නා රසවත් තොරතුරු ඉදිරිපත් කිරීම
  - සංයමයෙන් කතා කිරීම
  - උචිත අංග චලන භාවිත කිරීම
  - උචිත වේගයකින් නිරවුල් ව අදහස් ප්‍රකාශ කිරීම
  - කාලය කළමනාකරණය කර ගැනීම
  - උචිත ලෙස කතාව අවසන් කිරීම
  - ස්තුති කිරීම

- සකස් කර ගත් කතා සැකිල්ල අනුව කතාවක් පැවැත්වීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවස්ථාව ලබා දෙන්න (එක් ශිෂ්‍යයෙකුට නියමිත කාලය මිනිත්තු 03කි).
- තක්සේරු කිරීම සඳහා පහත ලබා දී ඇති සලකුණු මාර්ගෝපදේශ යොදා ගන්න.
- ක්‍රියාකාරකම අවසානයේ ලබා දී ඇති 'ස්වයං තක්සේරුව' සම්පූර්ණ කිරීම සඳහා ශිෂ්‍යයන්ට අවශ්‍ය මග පෙන්වීම සිදු කරන්න.
- වැඩිදුර ඉගෙනුම සඳහා විවිධ කථිකයන් සහ දේශකයන් ඉදිරිපත් කර ඇති මාතෘකානුකූල කතා අන්තර්ජාලයෙන් නැරඹීම සහ ඒවායේ සාර්ථක ලක්ෂණ පිළිබඳ අවධානය යොමු කිරීමට මග පෙන්වීම සිදු කරන්න.

තක්සේරුකරණ කාර්ය 02

ලකුණු ලබා දීම

තක්සේරු නිර්ණායක සහ සලකුණු මාර්ගෝපදේශ (Rubrics)

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ඉතා හොඳයි 4 | හොඳයි 3 | සාමාන්‍යයි 2 | සංවර්ධනය විය යුතු යි 1 |
|---|---|---|---|---|---|
| 1.3.4 මාතෘකානුකූල කතාවක දී සුදුසු වාංමාලාව සහ නිවැරදි කරුණු ඉදිරිපත් කරමින් කතා කරයි. | මාතෘකාවට අදාළ වාංමාලාව නිවැරදි කරුණු සහිත ව කතා කිරීම (ලකුණු 04) | සියලු ම වචන මාතෘකාවට අදාළ වීම සහ නිවැරදි ව යොදා ගැනීම | බෝහෝ වචන සහ කරුණු මාතෘකාවට අදාළ වීම සහ නිවැරදි වීම යොදා ගැනීම | තරමක් දුරට වචන සහ කරුණු මාතෘකාවට අදාළ වීම සහ නිවැරදි ව යොදා ගැනීම | අනුචිත වචන සහ සදොස් කරුණු දක්වමින් කතා කරයි. |
| 1.3.5 මාතෘකානුකූල කතාවක දී සංවිධානාත්මක ව හා මනා ගලා යාමකින් යුතු ව කතා කරයි. | නිසි හඬ පාලනය විරාමය සහ නිවැරදි වචන උච්චාරණ පිළිබඳ සැලකිලිමත් වෙමින් කතා කිරීම (ලකුණු 04) | සෑම වචනයක්ම නිවැරදි ව උච්චාරණය කරමින් නිසි හඬ පාලනයෙන් විරාම සහිත ව කතා කරයි. | බොහෝ වචන නිවැරදි ව උච්චාරණය කරමින් හඬ පාලනයෙන් විරාම සහිත ව කතා කරයි. | තරමක් දුරට වචන නිවැරදි ව උච්චාරණය කරමින් හඬ පාලනය සහ විරාම තැබීමට උත්සහ දරමින් කතා කරයි. | බොහෝ උච්චාරණ දෝෂ සහිත ව හඬ පාලනය සහ විරාමය පිළිබඳ අඩු අවධානයක් යොමු කරමින් කතා කරයි. |
| | කරුණුවල සංවිධානාත්මක බව සහ මනා ගලා යාම (ලකුණු 04) | සියලු ම කරුණු මුල, මැද, අග සංවිධා-නයකින් සහ මනා ගලා යාමක-ින් යුතු ව ඉදිරිපත් කරයි. | බෝහෝ කරුණු මුල, මැද, අග සංවිධානයකින් සහ ගලා යාමකින් යුතුව ඉදිරිපත් කරයි. | සංවිධානාත්මක බවේ දුර්වලබව සහිත ව කතා කරයි. | සංවිධානාත්මක බව පිළිබඳ අවබෝධයකින් තොරව කරුණු ඉදිරිපත් කිරීමට උත්සාහ කරයි. |
| | කරුණුවල ප්‍රමාණවත් බව සහ කාල කළමනාකරණය (ලකුණු 04) | ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් කරමින් විනාඩි තුනක් අඛණ්ඩව කතා කරයි. | තරමක් කරුණු ඉදිරිපත් කරමින් විනාඩි තුනක් කතා කරයි. | කරුණු කිහිපයක් ඉදිරිපත් කරමින් විනාඩි තුනකට අඩු කාලයක් කතා කරයි. | ප්‍රමාණවත් කරුණු රහිත ව කාලය පිළිබඳ සැලකිල්ලකින් තොරව කතා කරයි. |

**මාතෘකානුකූල කතාව**
**මගේ රට මට අගෙයි**

'දෙව් ලොව ද මවු බිමට දෙවෙනි කොට සිතන්නෙමු. දෙව් ලොවේ නැති අසිරි මවුබිමේ දකින්නෙමු.'

මෙම ගීතයෙන් කියවෙන්නේ දෙව් ලොවේ නැති අසිරි මවුබිමේ ඇති බවයි. එසේ නම් සියලු ම දෙනාගෙන් අවසර ප්‍රාර්ථනා කරනවා මගේ රට පිළිබඳ වදන් පෙළක් ඔබ හමුවේ තැබීමට.

මගේ රට ශ්‍රී ලංකාව. එය ඉන්දියන් සාගරයේ මුතු ඇටය ලෙසින් හඳුන්වනවා. ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගත ව දූපතක් විදිහට පිහිටා තියෙනවා. ශ්‍රී ලංකාව විශාලත්වයෙන් වර්ග කිලෝමීටර් 65610 පමණ වූ කුඩා දිවයිනක්. ඉතාමත් සෞම්‍ය දේශගුණයක් සහිත මගේ රට අතීතයේ දී විවිධ නම්වලින් හඳුන්වා දීලා තියෙනවා. එදා පෙරදිග ධාන්‍යාගාරය යන නමින් හඳුන්වා දී තිබෙන්නේ මගේ රට සහලින් ස්වයංපෝෂිත වූ රටක් නිසයි. ඒ විතරක් නෙමෙයි සෙරන්ඩිබ්, තැප්‍රොබෙන්, සිලොන් ආදි නම්වලින් ද ශ්‍රී ලංකාව හඳුන්වා දීලා තියෙනවා.

ශ්‍රී ලංකාව කියන්නේ ප්‍රධාන වශයෙන් ම කෘෂිකර්මාන්තය කේන්ද්‍ර කර ගත්තු රටක්. තේ, පොල්, රබර් අපේ රටේ ප්‍රධාන අපනයන බෝග විදිහට හඳුන්වා දෙන්නට පුළුවන්. මැණික් වර්ගවලට වගේ ම සාදික්කා, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි ආදි කුළු බඩු වර්ගවලට ද මගේ රට මහත් ප්‍රසිද්ධියක් උසුලනවා.

ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය වන්නේ නිල් මානෙල් මල. නා ගස තමයි ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය විදියට සැලකෙන්නේ. වළිකුකුළා ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා විදියට නම් කරලා තියෙනවා. මගේ රට ප්‍රෞඪ ඉතිහාසයකින් හෙබි රටක්. අතීතයේ තිබූ ඒ දියුණු තාක්ෂණය පිළිබඳ පෙන්වන සාක්ෂි විදියට අපට මේ පුරාවිද්‍යාත්මක නටබුන් පෙන්වා දෙන්නට පුළුවන්. යුනෙස්කෝ සංවිධානය විසින් මේ වන විට ස්ථාන අටක් ලෝක උරුම විදියට නම් කර තියෙනවා. සීගිරිය, ගාලු කොටුව, සිංහරාජ වනාන්තරය, අනුරාධපුර නගරය ආදි ස්ථාන අපට හඳුන්වා දෙන්නට පුළුවන්.

ස්වාභාවික සම්පත්, මනරම් පරිසරය සහ ප්‍රෞඪ ඉතිහාසයකින් යුත් මගේ මාතෘභූමිය දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණයට ලක් වෙලා තියෙන්නෙ නිරායාසයෙන්මයි. ලාංකිකයන්ගේ ආගන්තුක සත්කාරය නිසාත් ස්වාභාවික සෞන්දර්ය නිසාත් මගේ මාතෘභූමිය දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණයට ලක්වෙලා තියෙනවා. ඉතිං මේ පවතින අප අපේ රටේ ස්වාභාවික සුන්දරත්වය රැකගෙන අනාගත පරපුරට ලබා දීම අප සතු යුතුකමක් වනවා.

ශ්‍රී ලංකාවේ ස්වාභාවික සුන්දරත්වය ගැන කිව්වොත් අලංකාර කඳු වැටි, මනරම් දිය ඇලි, ගංගා ඇළ දොළ පිහිටා තිබෙනවා. සිංහරාජය වනාන්තරය වගේ ම යාල, විල්පත්තු, උඩවලව ආදි වනෝද්‍යාන මගේ මේ පරිසරයේ සුන්දරත්වය තවත් ඉහළ නංවෙනවා. නිබඳ කුරුලු කිචි බිචිය ඇසෙන, මනරම් දිය ඇලි ගලා බසින මිහිපිට සුර පුරයක් වැනි සේ මනරම් මගේ මාතෘභූමිය රැක ගැනීම අපසතු යුතුකමක් වෙනවා.

මට මේ ලබා දී තිබෙන නිදහස් අධ්‍යාපනයෙන් උපරිම ඵල නෙලා ගනිමින් අනාගතයේ දී මගේ රටට සේවයක් කර මගේ රට ලෝකයේ බැබලවීමට මම බලාපොරොත්තු වනවා. ඔබ සියලු ම දෙනාට බෙහෙවින් ම ස්තුති යි.

**ඉගෙනුම් අවස්ථාව 04**
**(කාලච්ඡේද 05යි)**

**විවිධ මාධ්‍ය යොදා ගෙන සිදු කරන ඉදිරිපත් කිරීම්**

1. පහත කරුණු පිළිබඳ ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.

- එක් මාධ්‍යයක් යොදා ගෙන ඉදිරිපත් කිරීම් සිදු කරනවාට වඩා විවිධ මාධ්‍ය යොදා ගෙන ඉදිරිපත් කිරීම් සිදු කිරීම වඩාත් ඵලදායක බව
- ඉදිරිපත් කිරීම් සඳහා යොදා ගත හැකි විවිධ මාධ්‍ය හා මෙවලම් අතුරෙන් 'පිටු පෙරළනය' යනු අවම පහසුකම් යටතේ අඩු වියදමකින් සකස් කර ගත හැකි, හැසිරවීමට ඉතා පහසු මෙවලමක් බව
- පිටු පෙරළනයේ විශේෂ ලක්ෂණ
- තාක්ෂණික පහසුකම් පවතින අවස්ථාවල දී 'පවර් පොයින්ට්' වැනි පරිගණක මෘදුකාංග සහ බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර යොදා ගෙන ද ඉදිරිපත් කිරීම් (Presentatios) සිදු කළ හැකි බව.

2. පිටු පෙරළනයක් සකස් කර ගන්නා ආකාරය හඳුනා ගැනීමට මොඩියුලයේ දී ඇති වෙබ් සබැඳිය වෙත පිවිසෙන්න.

**ක්‍රියාකාරකම 4.1 - විවිධ මාධ්‍ය යොදා ගත් ඉදිරිපත් කිරීම් (බහුමාධ්‍ය සමර්පණ) නැරඹීම (Viewing)**

- පිටු පෙරළනය යොදා ගෙන සිදු කරන බහුමාධ්‍ය සමර්පණය නැරඹීමට සුදුසු පරිදි පන්ති කාමරය සකස් කර ගන්න.
- නැරඹීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
- 'දේශීය ශක්තිජනක පානය' යන මාතෘකාව යටතේ පිටු පෙරළනය යොදා ගනිමින් සිදු කරන ඉදිරිපත් කිරීම දෙවරක් නැරඹීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඒ සඳහා පහත QR කේතය යොදා ගන්න.

Channel NIE

QR කේතය

- පටිගත කරන ලද බහුමාධ්‍ය ඉදිරිපත් කිරීම නැරඹීමට අවශ්‍ය තාක්ෂණික උපකරණ නොමැති අවස්ථාවක දී ගුරුවරයා විසින් සකස් කර ගන්නා ලද පිටු පෙරළනයක් යොදා ගනිමින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට එම ඉදිරිපත් කිරීම සජීවී ව නැරඹීමට අවස්ථාව ලබා දෙන්න.
- නරඹන අතර ක්‍රියාකාරකම 4.1 යටතේ විමසා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු සටහන් කරන ලෙස ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට උපදෙස් ලබා දෙන්න.
- පහත ලබා දී ඇති නිර්ණායක අනුව ඇගයීම සිදු කර ප්‍රතිපෝෂණය ලබා දෙන්න.
- ක්‍රියාකාරකම අවසානයේ මොඩියුලයේ ලබා දී ඇති 'ස්වයං තක්සේරුව' (ඔබගේ හැකියාව ඔබ ම හඳුනා ගන්න) සම්පූර්ණ කිරීම සඳහා ශිෂ්‍යයන්ට අවශ්‍ය මග පෙන්වීම සිදු කරන්න.

තක්සේරුකරණ කාර්ය 01
ලකුණු ලබා දීම

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|---|
| 1.4.1 බහුමාධ්‍ය ඉදිරිපත් කිරීමක් නරඹා එහි ඇතුළත් නිශ්චිත තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | නිශ්චිත තොරතුරු දෙකක් ප්‍රකාශ කිරීම | 1 | 2 |
| | | 2 | 2 |
| 1.4.2 බහුමාධ්‍ය ඉදිරිපත් කිරීමක් නරඹා එහි ඇතුළත් වක්‍ර ව ප්‍රකාශිත තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | වක්‍ර ව ප්‍රකාශිත තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කිරීම (තේමාව, අරමුණ, මාතෘකාව ආදි) | 4 | 2 |
| | | 5 | 2 |
| 1.4.3 බහුමාධ්‍ය ඉදිරිපත් කිරීමක් නරඹා එහි ඇතුළත් අලුත් වචන හඳුනා ගැනීම ප්‍රදර්ශනය කරයි. | අලුත් වචන දෙකක් හඳුනා ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කිරීම | 3 | 4 |
| මුළු ලකුණු | | | 12 |

**ක්‍රියාකාරකම 4.2 - විවිධ මාධ්‍ය යොදා ගත් ඉදිරිපත් කිරීම් (බහුමාධ්‍ය සමර්පණ) සිදු කිරීම**

- විවිධ මාධ්‍ය යොදා ගත් (බහුමාධ්‍ය) ඉදිරිපත් කිරීම් සඳහා ලබා දී ඇති ආදර්ශ මාතෘකා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තවදුරටත් පැහැදිලි කර දෙන්න.
- එම මාතෘකා අතුරෙන් වඩාත් ප්‍රිය කරන, ඉදිරිපත් කිරීමක් කළ හැකි මාතෘකාවක් තෝරා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම් ලබා දෙන්න.
- විවිධ මාධ්‍ය යොදා ගත් (බහුමාධ්‍ය) ඉදිරිපත් කිරීම් සඳහා ශිෂ්‍යයන්ට සපයා ගත හැකි කැමති මාධ්‍ය අවම වශයෙන් දෙකක්වත් තෝරා ගැනීමට සහාය ලබා දෙන්න.
- මිනිත්තු පහක ඉදිරිපත් කිරීමක් සඳහා සැලසුමක් සකස් කිරීමට උපදෙස් දී අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- තෝරා ගත් මාතෘකාවකට අනුව බහුමාධ්‍ය ඉදිරිපත් කිරීමක් සඳහා මිනිත්තු පහක කාලයක් ලබා දෙන්න.
- තක්සේරුව සිදු කෙරෙන නිර්ණායක පිළිබඳ ශිෂ්‍යයන්ට පැහැදිලි කරන්න.
- පහත ලබා දී ඇති නිර්ණායක අනුව ඇගයීම සිදු කර ප්‍රතිපෝෂණය ලබා දෙන්න.
- ක්‍රියාකාරකම අවසානයේ මොඩියුලයේ ලබා දී ඇති 'ස්වයං තක්සේරුව' (ඔබගේ හැකියාව ඔබ ම හඳුනා ගන්න) සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම සිදු කරන්න.
- වැඩිදුර ඉගෙනුම යටතේ නවීන තාක්ෂණික මෙවලම් උපයෝගි කර ගෙන සිදු කරන විවිධ මාධ්‍ය (බහුමාධ්‍ය) ඉදිරිපත් කිරීමක් සිදු කිරීමේ හුරුව ශිෂ්‍යයන්ට ලබා දීම සඳහා මඩොල් දූව කෘතිය පිළිබඳ Powerpoint සමර්පණය ඇතුළත් පහත QR කේතය භාවිත කිරීමට උපදෙස් ලබා දෙන්න.

**තක්සේරු නිර්ණායක සහ සලකුණු මාර්ගෝපදේශ (Rubrics)**

**තක්සේරුකරණ කාර්ය 02**

**ලකුණු ලබා දීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ඉතා හොඳයි 4 | හොඳයි 3 | සාමාන්‍යයි 2 | සංවර්ධනය විය යුතු යි 1 |
|---|---|---|---|---|---|
| 1.4.4 දෙන ලද තේමාවකට අදාළ ව ඉදිරිපත් කිරීමක් සඳහා සැලසුමක් සකස් කරයි. | නිවැරදි හා මනා නිමාවකින් යුතු සැලසුමක් සකස් කිරීම (ලකුණු 04) | නිවැරදි හා මනා නිමාවකින් යුතු සැලසුමක් සකස් කරයි. | නිවැරදි සැලසුමක් සකස් කරයි. | තරමක් අඩුපාඩු සහිත සැලසුමක් සකස් කරයි. | බොහෝ අඩුපාඩු සහිත සැලසුමක් සකස් කරයි. |
| 1.4.5 ගැළපෙන මාධ්‍ය අවම වශයෙන් දෙකක්වත් භාවිත කොට සිදු කරන ඉදිරිපත් කිරීමක් සඳහා අවශ්‍ය අංග සහ මෙවලම් සකස් කරයි. | ගැළපෙන මාධ්‍ය අවම වශයෙන් දෙකක් වත් භාවිත කිරීම (ලකුණු 04) | ගැළපෙන මාධ්‍ය අවම වශයෙන් දෙකක් වත් යොදා ගනිමින් ඉදිරිපත් කිරීම සිදු කිරීම | මාධ්‍ය දෙකක් තරමක් අඩුපාඩු සහිත ව යොදා ගනිමින් ඉදිරිපත් කිරීම සිදු කරයි. | එක් මාධ්‍යයක් පමණක් භාවිත කරමින් ඉදිරිපත් කිරීම සිදු කරයි. | මාධ්‍ය පිළිබඳ අවබෝධයකින් තොරව අඩුපාඩු සහිත ව ඉදිරිපත් කිරීමක් සිදු කරයි. |
| 1.4.7 සුදුසු මාධ්‍ය දෙකක් හෝ ඊට වැඩි ගණනක් භාවිත කොට මිනිත්තු තුනක ඉදිරිපත් කිරීමක් සිදු කරයි. | කාලය කළමනාකරණය කර ගනිමින් මිනිත්තු තුනක පමණ ඉදිරිපත් කිරීමක් සිදු කිරීම (ලකුණු 04) | කාලය මැනවින් කළමනාකරණය කර ගනිමින් මිනිත්තු තුනක පමණ ඉදිරිපත් කිරීමක් සිදු කරයි. | කාලය කළමනාකරණය කර ගනිමින් මිනිත්තු තුනක පමණ ඉදිරිපත් කිරීමක් සිදු කරයි. | අඩු පාඩු සහිත ව කාලය කළමනාකරණය කර ගනිමින් මිනිත්තු දෙකක පමණ ඉදිරිපත් කිරීමක් සිදු කරයි. | බොහෝ අඩුපාඩු සහිත ව කාලය කළමනාකරණය කර ගනිමින් මිනිත්තු දෙකක හෝ ඊට අඩු කාලයක ඉදිරිපත් කිරීමක් සිදු කරයි. |
| | උචිත හඬ පාලනය හා විරාමය පවත්වා ගැනීම (ලකුණු 04) | අවස්ථාවට සහ ඉදිරිපත් කරන කරුණුවලට මනා ව ගැළපෙන ලෙස විරාමය පවත්වා ගනිමින් හඬ පාලනය කරයි. | අවස්ථාවට සහ ඉදිරිපත් කරන කරුණුවලට ගැළපෙන ලෙස විරාමය පවත්වා ගනිමින් හඬ පාලනය කරයි. | අවස්ථාවට සහ ඉදිරිපත් කරන කරුණුවලට තරමක් ගැළපෙන ලෙස විරාමය හා හඬ පාලනය සිදු කරයි. | හඬ පාලනය හා විරාමය පිළිබඳ සැලකිල්ලක් නො දක්වමින් කතා කරයි. |

**මොඩියුල තක්සේරුකරණය හා ඇගයීම**

එක් මොඩියුලයකට නියමිත කාලය සම්මුඛ පැය 10කි. හිමි වන සම්භාර (Credit) ගණන එකකි. මොඩියුලයට අදාළ සම්භාර අගය තීරණය කිරීම සඳහා සම්භවන තක්සේරුව සහ සම්පිණ්ඩිත තක්සේරුව යොදා ගනු ලැබේ. එහි ලකුණු බෙදී යාමේ ප්‍රතිශතය පහත පරිදි වේ.

සම්භවන තක්සේරුව - 70%
සම්පිණ්ඩිත තක්සේරුව - 30%

**සම්භවන තක්සේරුව**

පළමු මොඩියුලයේ සම්භවන තක්සේරුව සඳහා මොඩියුලයේ පළමු ඉගෙනුම් අවස්ථාවේ සිට සිව්වන ඉගෙනුම් අවස්ථාව දක්වා අදාළ ක්‍රියාකාරකම් යොදා ගන්න. එක් මොඩියුලයක් සඳහා හිමි වන ලකුණුවල එකතුව ලකුණු 100කි. එය නැවත 70%ක ප්‍රතිශතයක් ලෙස ගණනය කළ යුතු ය. එනම් මොඩියුලයක ලබා ගත් මුළු ලකුණු X නම් (X÷100) x 70 ලෙස ගණනය කරන්න. ලකුණු ඇතුළත් කිරීම සඳහා පහත ආකෘතිය යොදා ගන්න.

| අනු අංකය | ශිෂ්‍යයාගේ/ ශිෂ්‍යාවගේ නම | සුබස් මිහිර තක්සේරුකරණ කාර්ය 3 | නිර්ණායක 1 | | | | නිර්ණායක 2 | | | | නිර්ණායක 3 | | | | නිර්ණායක 4 | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සලකුණු මාර්ගෝපදේශ අනුව ප්‍රාප්ති මට්ටම් | | | | සලකුණු මාර්ගෝපදේශ අනුව ප්‍රාප්ති මට්ටම් | | | | සලකුණු මාර්ගෝපදේශ අනුව ප්‍රාප්ති මට්ටම් | | | | සලකුණු මාර්ගෝපදේශ අනුව ප්‍රාප්ති මට්ටම් | | | | |
| | | | 4 | 3 | 2 | 1 | 4 | 3 | 2 | 1 | 4 | 3 | 2 | 1 | 4 | 3 | 2 | 1 | |
| 1 | A | | | | | | | | | | | | | | | | | | |
| 2 | B | | | | | | | | | | | | | | | | | | |
| 3 | C | | | | | | | | | | | | | | | | | | |

වගුව 1.1

මොඩියුලය ඉගෙනුම් අවස්ථා කිහිපයකින් සමන්විත වේ. ඒ අනුව එක් ඉගෙනුම් අවස්ථාවක් තුළ තක්සේරුකරණ කාර්යන් කිහිපයක් ද අන්තර්ගත වේ. ඉහත 1.1 වගුවේ සඳහන් ආකාරයෙන් එක් එක් තක්සේරුකරණ කාර්යයෙන් ලබා ගන්නා ලකුණ පහත 1.2 වගුවේ ඇතුළත් කර ඉගෙනුම් අවස්ථාවක සමස්ත ලකුණ ගණනය කර ගත හැකි ය. ඒ අනුව මෙම ආකෘතියෙන් එක් ඉගෙනුම් අවස්ථාවකට එක් වගුවක් වශයෙන් සකස් කර ගත යුතු ය. එක් එක් ඉගෙනුම් අවස්ථාවකට ලබා ගත් ලකුණ පහත වගුව 1.3 ඇතුළත් කිරීමෙන් මොඩියුලයකට හිමි සමස්ත ලකුණ ගණනය කර ගත හැකි ය.

**සුබස් මිහිර - ඉගෙනුම් අවස්ථාව - 02**

| අනු අංකය | ශිෂ්‍යයාගේ/ ශිෂ්‍යාවගේ නම | තක්සේරුකරණ කාර්ය 1 | තක්සේරුකරණ කාර්ය 2 | තක්සේරුකරණ කාර්ය 3 | තක්සේරුකරණ කාර්ය 4 | එකතුව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

වගුව 1.2

පළමු මොඩියුලයේ සම්භවන තක්සේරුව සඳහා මොඩියුලයේ පළමු ඉගෙනුම් අවස්ථාවේ සිට සිව්වන ඉගෙනුම් අවස්ථාව දක්වා අදාළ ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ලකුණු ඇතුළත් කළ යුතු ය.

| | සම්භවන තක්සේරුව<br>මොඩියුලය අංක 1 -. - සුබස් මිහිර | | | | | 70%<br>සම්භවන<br>තක්සේරුව | 30%<br>සම්පිණ්ඩිත<br>තක්සේරුව | එකතුව<br>100% | GPA<br>අගය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ශිෂ්‍යයාගේ<br>නම | ඉගෙනුම්<br>අවස්ථාව<br>1 | ඉගෙනුම්<br>අවස්ථාව<br>2 | ඉගෙනුම්<br>අවස්ථාව<br>3 | ඉගෙනුම්<br>අවස්ථාව<br>4 | | | | |
| 01 | | | | | | | | | |
| 02 | | | | | | | | | |
| 03 | | | | | | | | | |

වගුව 1.3

**සම්පිණ්ඩිත තක්සේරුව -**

- මේ සඳහා මොඩියුලයේ අන්තර්ගතය ඇසුරෙන් නිර්මාණය කර ගන්නා ලද ක්‍රියාකාරකමක ශිෂ්‍යයන් නිරත කරවා ලකුණු ලබා දෙන්න.
  උදාහරණ -
  - ♦ විනාඩි තුනක පමණ සංවාදයකට සවන් දී අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම
  - ♦ ලබා දෙන මාතෘකා යටතේ විවිධ මාධ්‍ය ඉදිරිපත් කිරීමක් සිදු කිරීම
- මෙය 30%ක ලකුණු ප්‍රතිශතයකට පරිවර්තනය කර ගන්න.
- සම්පිණ්ඩිත ඇගයීම සඳහා සලකුණු මාර්ගෝපදේශයක් සකස් කර ගන්න.
- ඌන ලකුණු ලබා ගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ප්‍රතිකාර්ය ඉගෙනුම් වැඩපිළිවෙළක් සැලසුම් කරන්න.

**මොඩියුල ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්**
**මොඩියුලය 02 - සුබස් හුරුව 01**
**හැඳින්වීම**

සිංහල භාෂාව, විෂයක් ලෙස මෙන් ම අනෙක් විෂයන් ඉගෙන ගැනීමේ මාධ්‍යක් ලෙස ද අපට වැදගත් වේ. සවන් දීම, කතා කිරීම, කියවීම සහ ලිවීම යනු භාෂාවේ ප්‍රධාන කුසලතා වන අතර චතුර භාෂා හැකියාවක් ඇති කර ගැනීම සඳහා මෙම භාෂා කුසලතා සියල්ල ම වර්ධනය කර ගැනීම අවශ්‍ය වේ.

6 ශ්‍රේණියේ ''සුබස් හුරුව 01'' මොඩියුලය සකස් කර ඇත්තේ කියවීම සහ ලිවීම යන භාෂා කුසලතා වර්ධනය කිරීම සඳහා ය. එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා නිර්මාණශීලී ව ප්‍රායෝගික ලේඛන සකස් කිරීමටත් වාක්කෝෂය සංවර්ධනය කර ගනිමින් ලේඛනයේ යෙදීමටත් මෙම මොඩියුලයේ දී අවස්ථාව ලබා දී ඇත.

6 ශ්‍රේණියේ දී ''සුබස් හුරුව 01'' මොඩියුලයෙහි,

1. සුබ පැතුම් පත්
2. ආරාධනා පත්‍ර
3. සමානාර්ථවත් පද

යන ඉගෙනුම් අවස්ථා අන්තර්ගත වන අතර එක් එක් ඉගෙනුම් අවස්ථාවට අදාළ ප්‍රායෝගික පුහුණුවක් හා පරිචයක් ලබා ගැනීමට හැකි වන ආකාරයෙන් මෙහි සුතථ්‍ය ඉගෙනුමට (Authentic Learning) යෝග්‍ය ක්‍රියාකාරකම් ඇතුළත් කර ඇත. එමගින් කියවීමේ සහ ලිවීමේ කුසලතා මෙන් ම නිර්මාණශීලී කුසලතා ද වර්ධනය කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. හතර වන කාර්මික විප්ලවයත් සමග ඇති වන අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය හැකි 21 වන සියවසේ කුසලතාවලින් පිරිපුන් පුරවැසියන් බිහි කිරීම මෙහි තවත් එක් අරමුණකි.

| 6 ශ්‍රේණිය | | | | |
|---|---|---|---|---|
| ඉගෙනුම් පල | නිර්දිෂ්ට පෙළ හා අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
| 1.5<br>සුබ පැතුම් පත් නිවැරදි ව හා නිර්මාණශීලී ව සකස් කරයි. | වචන විස්සකට නොවැඩි සුබ පැතුම් පතක් (උපන්දින සුබ පැතුමක්/ මිතුරෙකුගේ ජයග්‍රහණයට සුබ පැතුමක්)<br>● නිශ්ශබ්ද කියවීම<br>● අවබෝධය<br>● අක්ෂර වින්‍යාසය<br>● ආකර්ෂණීය භාෂා භාවිතය<br>● විරාම ලක්ෂණ හා වචන වෙන් කිරීම<br>සුබ පැතුම් පතක ලක්ෂණ<br>- නිවැරදි භාෂා භාවිතය<br>- නිර්මාණශීලිත්වය<br>- සංක්ෂිප්තභාවය<br>- යවන්නාගේ නම<br>- ආකර්ෂණීය නිමාව | ● කතා කිරීම<br>● කියවීම<br>● ලිවීම | 1.5.1<br>පරිශීලනය කරන ලද සුබ පැතුම් පත් ඇසුරෙන් සුබ පැතුම් පතක් යනු කුමක් දැයි හඳුනා ගෙන ලක්ෂණ ප්‍රකාශ කරයි. | ● ලක්ෂණ හතරක්වත් ප්‍රකාශ කිරීම |
| | | | 1.5.2<br>ප්‍රායෝගික ජීවිතයේ සුබ පැතුම් පත් භාවිත වන අවස්ථා හතරක් හඳුනා ගෙන වාචික ව ප්‍රකාශ කරයි. | ● භාවිත වන අවස්ථා හතර ප්‍රකාශ කිරීම |
| | | | 1.5.3<br>සුබ පැතුම් පතක ඇතුළත් විය යුතු මූලිකාංග ඇතුළත් කොට අක්ෂර වින්‍යාසය, විරාම ලක්ෂණ හා වචන වෙන් කිරීම පිළිබඳ සැලකිලිමත් ව සුබ පැතුම් පතක් නිර්මාණශීලී ව සකස් කරයි. | ● සුබ පැතුම් පත යවන්නා සහ ලබන්නා ඇතුළත් වීම<br>● සුබ පැතුම සිදු කරන කාරණය ඇතුළත් වීම<br>● සංක්ෂිප්ත බව හා පැහැදිලි බව<br>● නිර්මාණශීලී භාෂා භාවිතය<br>● විවිධ වර්ණ, හැඩතල සහ රූප භාවිතය<br>● අක්ෂර වින්‍යාසය නිවැරදි වීම<br>● විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කිරීම<br>● නිවැරදි ව වචන වෙන් කිරීම |

| ඉගෙනුම් පල | නිර්දිෂ්ට පෙළ හා අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|---|
| 1.6<br>ඇරයුම්පත් නිවැරදි ව හා නිර්මාණශීලී ව සකස් කරයි. | කලා උලෙළ/විද්‍යා ප්‍රදර්ශනය සඳහා සකස් කළ ඇරයුම් පත් (වචන තිස් පහකට නොවැඩි)<br>• නිශ්ශබ්ද කියවීම<br>• අවබෝධය<br>• අක්ෂර වින්‍යාසය | • කතා කිරීම<br>• කියවීම<br>• ලිවීම | 1.6.1<br>පරිශීලනය කරන ලද ඇරයුම් පත් ඇසුරෙන් ඇරයුම් පතක් යනු කුමක් දැයි හඳුනා ගෙන ලක්ෂණ ප්‍රකාශ කරයි. | • ඇරයුම් පතක ලක්ෂණ හතරක් වත් ප්‍රකාශ කිරීම |
| | • ආකර්ෂණීය භාෂා භාවිතය<br>• ව්‍යාකරණානුකූල වාක්‍ය භාවිතය<br>• විරාම ලක්ෂණ හා වචන වෙන් කිරීම<br>**ඇරයුම් පතක ලක්ෂණ**<br>- නිවැරදි භාෂා භාවිතය<br>- නිර්මාණශීලිත්වය<br>- සංක්ෂිප්තභාවය<br>- යවන්නාගේ නම<br>- ලබන්නා/ආරාධිතයා පිළිබඳ තොරතුරු<br>- දිනය<br>- වේලාව<br>- කාරණය<br>- ආකර්ෂණීය නිමාව | | 1.6.2<br>කියවීමට දෙන ලද ඇරයුම් පත් ඇසුරෙන් ඇරයුම් පතක දක්නට ලැබෙන ලක්ෂණ හතරකට නොඅඩු සංඛ්‍යාවක් අවබෝධයෙන් යුතු ව නිවැරදි ව ප්‍රකාශ කරයි. | • අවම වශයෙන් ලක්ෂණ හතරක් ප්‍රකාශ කිරීම |
| | | | 1.6.3<br>ප්‍රායෝගික ජීවිතයේ ඇරයුම් පත් භාවිත වන අවස්ථා හතරක් හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | • ප්‍රායෝගික ජීවිතයේ ඇරයුම් පත් භාවිත වන අවස්ථා හතර ම ප්‍රකාශ කිරීම |
| | | | 1.6.4<br>ඇරයුම් පතක ඇතුළත් විය යුතු මූලිකාංග ඇතුළත් කොට අක්ෂර වින්‍යාසය, විරාම ලක්ෂණ හා වචන වෙන් කිරීම පිළිබඳ සැලකිලිමත් ව වචන 35ක පමණ ඇරයුම් පතක් නිර්මාණශීලී ව සකස් කරයි. | • ආරාධනය කරන්නා සහ ලබන්නා ඇතුළත් වීම<br>• ආරාධනය සිදු කරන කාරණය, පැවැත්වෙන දිනය, වේලාව සහ ස්ථානය ඇතුළත් වීම<br>• සංක්ෂිප්ත බව හා පැහැදිලි බව<br>• නිර්මාණශීලී භාෂා භාවිතය<br>• විවිධ වර්ණ, හැඩතල සහ රූප භාවිතය<br>• අක්ෂර වින්‍යාසය නිවැරදි වීම<br>• විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කිරීම<br>• නිවැරදි ව වචන වෙන් කිරීම |

| ඉගෙනුම් පල | නිර්දිෂ්ට පෙළ හා අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|---|
| 2.1<br>සමානාර්ථවත් පද පිළිබඳ අවබෝධය භාෂා කාර්යන්හි දී අවස්ථෝචිත ව ප්‍රදර්ශනය කරයි. | ඊ. ඩබ්ලිව්. අදිකාරම් මහතා පිළිබඳ තොරතුරු ඇතුළත් ඡේදයක්<br>• සමානාර්ථවත් පද<br>• ශබ්ද<br>• අර්ථ<br>• අර්ථවත් වාක්‍ය<br>• උක්තාඛ්‍යාත පද සම්බන්ධය<br>• අක්ෂර වින්‍යාසය<br>• විරාම ලක්ෂණ<br>• වචන වෙන් කිරීම | • කියවීම<br>• ලිවීම | 2.1.1<br>දෙන ලද ලිඛිත ප්‍රකාශනයක් කියවා එහි ඇතුළත් සමානාර්ථවත් පද හඳුනා ගෙන ප්‍රකාශ කරයි | • ඇරයුම් පතක ලක්ෂණ හතරක් වත් ප්‍රකාශ කිරීම |
| | | | 2.1.2<br>දෙන ලද වචන 15ක් සඳහා සමානාර්ථවත් පද 15ක් ලියයි. | • වචන 15 ම සඳහා සමානාර්ථවත් පද ලිවීම<br>• අක්ෂර වින්‍යාසය නිවැරදි වීම |
| | | | 2.1.3<br>දෙනු ලබන වචන 15ක සමානාර්ථවත් පද, අර්ථවත් ව යොදා වාක්‍ය 15ක හිස්තැන් සම්පූර්ණ කරයි. | • වාක්‍ය 15හි ම නිවැරදි ව හිස්තැන් සම්පූර්ණ කිරීම |
| | | | 2.1.4<br>දෙනු ලබන වචන 15ක සමානාර්ථවත් පදවල ශබ්දාර්ථ හඳුනා ගෙන එම වචන භාවිත කරමින් උක්තාඛ්‍යාත පද නිවැරදි ව ගළපා අක්ෂර වින්‍යාසය, විරාම ලක්ෂණ හා වචන වෙන් කිරීම පිළිබඳ අවධානයෙන් යුතු ව අර්ථවත් වාක්‍ය 15ක් නිර්මාණය කර ලියයි. | • සමානාර්ථවත් පද නිවැරදි ව භාවිත කරමින් වාක්‍ය 15ක් නිර්මාණය කර ලිවීම<br>• උක්තාඛ්‍යාත සම්බන්ධය නිවැරදි වීම<br>• අක්ෂර වින්‍යාසය නිවැරදි වීම<br>• විරාම ලක්ෂණ නිවැරදි ව යෙදීම<br>• නිවැරදි ව වචන වෙන් කිරීම |

**ඉගෙනුම් අවස්ථාව 01 - සුබ පැතුම් පත් සකසමු**
**(කාලච්ඡේද 04යි)**

සුබ පැතුම් පත් සකස් කිරීම පිළිබඳ පෙර දැනුම සිහිපත් කරමින් පාඩමට ප්‍රවේශය ලබා ගැනීම සඳහා **'පෙර මතක අවදි කරමු'** යටතේ ඇති කරුණු ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමග සාකච්ඡා කරන්න.

- ශිෂ්‍යයන්ට පහසුවෙන් සපයා ගත හැකි සුබ පැතුම් පත් කිහිපයක් නිවසේ තිබේ නම් පමණක් පන්තියට රැගෙන එන ලෙස උපදෙස් දෙන්න.
- ශිෂ්‍ය ශිෂ්‍යාවන් රැගෙන ආ සුබ පැතුම් පත් සහ මොඩියුලයේ ඇති සුබ පැතුම් පත් අධ්‍යයනය කිරීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවස්ථාව ලබා දෙන්න.
- එම සුබ පැතුම් පත්වල පහත ලක්ෂණ කෙරෙහි ශිෂ්‍ය අවධානය යොමු කරවන්න.

  - නිවැරදි අක්ෂර වින්‍යාසය
  - නිර්මාණශීලී භාෂා භාවිතය
  - නිවැරදි ව වචන වෙන් කිරීම
  - ආකෘතිය, හැඩතල සහ නිර්මාණශීලී බව
  - සංක්ෂිප්තභාවය
  - යවන්නාගේ නම සහ ලබන්නාගේ නම
  - ආකර්ෂණීය නිමාව

- මොඩියුලයේ සඳහන් සුබ පැතුම් පතක අන්තර්ගත විය යුතු ලක්ෂණ පිළිබඳ අවධානය යොමු කරවන්න.

**ක්‍රියාකාරකම 1.1**

- ලබා දී ඇති ප්‍රශ්න සඳහා ලිඛිත පිළිතුරු සියලු ශිෂ්‍යයන්ගෙන් ලබා ගෙන අවශ්‍ය ඇගයීම් හා ප්‍රතිපෝෂණ සිදු කරන්න.

**තක්සේරු නිර්ණායක සහ සලකුණු මාර්ගෝපදේශ (Rubrics)**
**තක්සේරුකරණ කාර්ය 01**
**ලකුණු ලබා දීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ඉතා හොඳයි 4 | හොඳයි 3 | සාමාන්‍යයි 2 | සංවර්ධනය විය යුතු යි 1 |
|---|---|---|---|---|---|
| 1.5.1 පරිශීලනය කරන ලද සුබ පැතුම් පත් ඇසුරෙන් සුබ පැතුම් පතක් යනු කුමක් දැයි හඳුනා ගෙන ඒවායේ ලක්ෂණ ප්‍රකාශ කරයි. | අවම වශයෙන් ලක්ෂණ හතරක් ප්‍රකාශ කිරීම (ලකුණු 04) | සුබ පැතුම් පතක ලක්ෂණ හතරක් වත් ප්‍රකාශ කිරීම | ලක්ෂණ තුනක් ප්‍රකාශ කරයි. | ලක්ෂණ දෙකක් ප්‍රකාශ කරයි. | එක් ලක්ෂණයක් ප්‍රකාශ කරයි. |
| 1.5.2 ප්‍රායෝගික ජීවිතයේ සුබ පැතුම් පත් භාවිත වන අවස්ථා හතරක් හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ප්‍රායෝගික ජීවිතයේ සුබ පැතුම් පත් භාවිත වන අවස්ථා හතරක් ප්‍රකාශ කිරීම (ලකුණු 04) | අවස්ථා හතරක් ප්‍රකාශ කරයි. | අවස්ථා තුනක් ප්‍රකාශ කරයි. | අවස්ථා දෙකක් ප්‍රකාශ කරයි. | එක් අවස්ථාවක් ප්‍රකාශ කරයි. |

**ක්‍රියාකාරකම 1.2**

- සුබ පැතුම් පතක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය උපකරණ සපයා ගැනීමට කල් ඇති ව උපදෙස් දෙන්න.
- නිර්මාණශීලී ව සුබ පැතුම් පත් සකස් කිරීමට කැමැත්තක් දක්වන ශිෂ්‍යයන්ට ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න.
- වියළි මල්, කොළ, කුරුලු පිහාටු, පාට කඩදාසි ආදිය රැගෙන ඒමට ශිෂ්‍යයන් දිරිගන්වන්න.
- විවිධ ප්‍රමාණයේ සහ විවිධ හැඩයේ අකුරු භාවිත කිරීමට උපදෙස් දෙන්න.
- විවිධ වර්ණ හැඩතල හෝ රූප භාවිත කරන ආකාරය පෙන්වා දෙන්න.
- නිර්මාණශීලී වාක්‍ය රටා - උදා - කවි, කෙටි වැකි, දිගු වැකි, යෙදුම් භාවිත කළ හැකි බව පැහැදිලි කරන්න.
- විවිධ හැඩවලට කපන ලද හෝ නමන ලද කඩදාසි භාවිත කරන ආකාරය පෙන්වා දෙන්න.
- සුබ පැතුම් පත් නිර්මාණයේ දී මොඩියුලයේ දක්වා ඇති අවස්ථාවලින් තෝරා ගත් අවස්ථාවක් අනුව ක්‍රියාකාරකමෙහි නිරත වීමට උපදෙස් දෙන්න.
- සුබ පැතුම් පත් නිර්මාණය සඳහා මොඩියුලයේ ලබා දී ඇති මග පෙන්වීම් කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
- පන්ති කාමරයේ දී සුබ පැතුම් පත් නිර්මාණය සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- සියලු ම ශිෂ්‍යයන් පන්ති කාමරයේ දී ලබා දෙන නියමිත වේලාව තුළ සුබ පැතුම් පත සකස් කළ යුතු අතර නිවසේ දී දෙමාපිය සහාය ලබා ගෙන සකස් නොකළ යුතු බව අවධාරණය කරන්න.
- ශිෂ්‍යයන් තක්සේරු කිරීම සඳහා ලබා දී ඇති සලකුණු මාර්ගෝපදේශ යොදා ගන්න.

**තක්සේරු නිර්ණායක සහ සලකුණු මාර්ගෝපදේශ (Rubrics)**

**තක්සේරුකරණ කාර්ය 02**

**ලකුණු ලබා දීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක | ඉතා හොඳයි 4 | හොඳයි 3 | සාමාන්‍යයයි 2 | සංවර්ධනය විය යුතු යි 1 |
|---|---|---|---|---|---|
| 1.5.3 සුබ පැතුම් පතක ඇතුළත් විය යුතු ලක්ෂණ ඇතුළත් කොට සුබ පැතුම් පතක් නිර්මාණශීලී ව සකස් කරයි. | සුබ පැතුම් යවන්නා හා ලබන්නා ඇතුළත් වීම. (ලකුණු 04) | සුබ පැතුම යවන්නා හා ලබන්නා පැහැදිලි ව සඳහන් කරයි. | සුබ පැතුම යවන්නා හා ලබන්නා තරමක් අඩු පාඩු සහිත ව සඳහන් කරයි. | සුබ පැතුම යවන්නා හෝ ලබන්නා යන දෙදෙනාගෙන් එක් පාර්ශවයක් පමණක් සඳහන් කරයි. | සුබ පැතුම යවන්නා හෝ ලබන්නා යන දෙදෙනාගෙන් එක් පාර්ශවයක් බොහෝ අඩු පාඩු සහිත ව සඳහන් කරයි. |
| | සුබ පැතුම සිදු කරන කාරණය සඳහන් වීම. (ලකුණු 04) | සුබ පැතුම සිදු කරන කාරණය ඉතා පැහැදිලි ව මැනවින් සඳහන් කරයි. | සුබ පැතුම සිදු කරන කාරණය තරමක් පැහැදිලි ව සඳහන් කරයි. | සුබ පැතුම සිදු කරන කාරණය අඩු පාඩු සහිත ව සඳහන් කරයි. | සුබ පැතුම සිදු කරන කාරණය බොහෝ අඩු පාඩු සහිත ව සඳහන් කරයි. |
| | සංක්ෂිප්තභාවය හා පැහැදිලි බව (ලකුණු 04) | සංක්ෂිප්ත ව හා පැහැදිලි ව අදාළ පණිවිඩය සඳහන් කරයි. | සංක්ෂිප්ත ව එහෙත් පණිවිඩයේ අපහැදිලිතා සහිත ව සඳහන් කරයි. | දීර්ඝ සහ අනවශ්‍ය විස්තර සහිත ව පණිවිඩය සඳහන් කරයි. | බොහෝ අඩුපාඩු සහිත ව පණිවිඩය සඳහන් කිරීමට උත්සහ දරයි. |

**ක්‍රියාකාරකම** 1.3

- නිර්මාණය කළ සුබ පැතුම් පත් සුදුසු ස්ථානයක ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- මිතුරු මිතුරියන්ගේ සුබ පැතුම් පත් අගය කරමින් අදහස් දැක්වීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවස්ථාව ලබා දෙන්න.
- නිර්මාණශීලී සුබ පැතුම් පත් ශිෂ්‍යයන්ගේ රුචිකත්වය අනුව තෝරා ගැනීමට අවස්ථාව ලබා දී ධනාත්මක උපස්ථම්භන ලබා දෙන්න.
- ප්‍රතිපෝෂණය ලබා දිය යුතු ශිෂ්‍යයන් කෙරෙහි අවධානය යොමු කරන්න.
- මොඩියුලයේ ලබා දී ඇති 'ස්වයං තක්සේරුව' සම්පූර්ණ කිරීම සඳහා ශිෂ්‍යයන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම සහ මග පෙන්වීම සිදු කරන්න.

**ඉගෙනුම් අවස්ථාව 02 - ආරාධනා පත්‍ර නිර්මාණය කරමු**
**(කාලච්ඡේද 04යි)**

ආරාධනා පත්‍ර නිර්මාණය කිරීම පිළිබඳ පෙර දැනුම සිහිපත් කරමින් පාඩමට ප්‍රවේශය ලබා ගැනීම සඳහා '**පෙර මතක අවදි කරමු**' යටතේ ඇති ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් නිරත කරවන්න.

- ශිෂ්‍යයන්ට පහසුවෙන් සපයා ගත හැකි ආරාධනා පත්‍ර කිහිපයක් නිවසේ තිබේ නම් පමණක් රැගෙන එන ලෙස ක්‍රියාකාරකම ආරම්භ කිරීමට පෙර දිනයක දී උපදෙස් දෙන්න.
- ඒවා මොඩියුලයේ දක්වා ඇති අවස්ථාවන් අනුව වර්ග කර හඳුනා ගැනීමට සලස්වන්න.
- ආරාධනා පත්‍රයක අන්තර්ගතය මෙන් ම නිර්මාණශීලී ආකෘතිය පිළිබඳ ව ද අවධානය යොමු කරවන්න.
- එහි දී ආරාධනා පත්‍රයක මූලිකාංග සහ විශේෂ ලක්ෂණ පිළිබඳ ශිෂ්‍යයන්ට පැහැදිලි කරන්න.
- ආරාධනා පත්‍රවල පිටු සංඛ්‍යාව ද අවශ්‍ය පරිදි වෙනස් කළ හැකි බව පැහැදිලි කරන්න.
- මොඩියුලයේ දක්වා ඇති ආදර්ශ ආරාධනා පත්‍ර කෙරෙහි අවධානය යොමු කරවන්න.
- ආරාධනා පත්‍රයක දක්නට ලැබෙන ලක්ෂණ අධ්‍යයනය කිරීමට අවස්ථාව සලසා දෙන්න.
- ආරාධනා පත්‍රයක් යනු කුමක් දැයි ශිෂ්‍යයන් සමග සාකච්ඡා කර පැහැදිලි කර දෙන්න.
- 'ආරාධනා පත්‍රයක් යනු යම් සුවිශේෂ අවස්ථාවකට සහභාගි වීම සඳහා තෝරා ගන්නා ලද සුවිශේෂ පුද්ගලයකුට හෝ පිරිසක් වෙත යවනු ලබන ලිඛිත ඇරයුමකි.'
- ආරාධනා කරනු ලබන උත්සවයේ ස්වභාවය හා අරමුණු අනුව ආරාධනා පත්‍රයේ ස්වරූපය ද වෙනස් විය හැකි බව නිදර්ශන දක්වමින් පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම 2.1**

- 2.1 ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් නිරත කරවන්න.
- ක්‍රියාකාරකම 2.1ට අදාළ ව ශිෂ්‍ය ශිෂ්‍යාවන් ලබා දුන් පිළිතුරු ඇගයීමකට ලක් කර අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- ශිෂ්‍යයන් තක්සේරු කිරීම සඳහා ඉගෙනුම් අවස්ථාව අවසානයේ ලබා දී ඇති සලකුණු මාර්ගෝපදේශ යොදා ගන්න.
- ක්‍රියාකාරකම 2.1 සහ ක්‍රියාකාරකම 2.2 අවසානයේ මොඩියුලයේ ලබා දී ඇති 'ස්වයං තක්සේරුව' (ඔබගේ හැකියාව ඔබ ම හඳුනා ගන්න) සම්පූර්ණ කිරීම සඳහා ශිෂ්‍යයන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම සහ මග පෙන්වීම සිදු කරන්න.

**තක්සේරු නිර්ණායක සහ සලකුණු මාර්ගෝපදේශ (Rubrics)**
**තක්සේරුකරණ කාර්ය 0**
**ලකුණු ලබා දීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ඉතා හොඳයි 4 | හොඳයි 3 | සාමාන්‍යයි 2 | සංවර්ධනය විය යුතු යි 1 |
|---|---|---|---|---|---|
| 1.6.1 පරිශීලනය කරන ලද ඇරයුම් පත් ඇසුරෙන් ඇරයුම් පතක් යනු කුමක් දැයි හඳුනා ගෙන ලක්ෂණ ප්‍රකාශ කරයි. | අවම වශයෙන් ලක්ෂණ හතරක් ප්‍රකාශ කිරීම (ලකුණු 04) | ලක්ෂණ හතරක් ප්‍රකාශ කරයි. | ලක්ෂණ තුනක් ප්‍රකාශ කරයි. | ලක්ෂණ දෙකක් ප්‍රකාශ කරයි. | එක් ලක්ෂණයක් ප්‍රකාශ කරයි. |
| 1.6.2 ප්‍රායෝගික ජීවිතයේ ඇරයුම් පත් භාවිත වන අවස්ථා හතරක් හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ප්‍රායෝගික ජීවිතයේ ඇරයුම් පත් භාවිත වන අවස්ථා හතර ම ප්‍රකාශ කිරීම (ලකුණු 04) | අවස්ථා හතරක් ප්‍රකාශ කරයි. | අවස්ථා තුනක් ප්‍රකාශ කරයි. | අවස්ථා දෙකක් ප්‍රකාශ කරයි. | එක් අවස්ථාවක් ප්‍රකාශ කරයි. |

**ක්‍රියාකාරකම 2.2**

- ආරාධනා පත්‍රයක් නිර්මාණය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය පන්ති කාමරයට රැගෙන එන ලෙස උපදෙස් දෙන්න.
- මොඩියුලයේ 2.2 ක්‍රියාකාරකම යටතේ දක්වා ඇති '**ආරාධනා පත්‍ර නිර්මාණය කිරීමේ දී සැලකිය යුතු කරුණු**' පිළිබඳ ව අවධානය යොමු කරවන්න.
- මොඩියුලයේ දී ඇති මාතෘකා අතුරින් තමන් වඩාත් කැමැත්තක් දක්වන මාතෘකාවක් තෝරා ගැනීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- ආරාධනා පත්‍ර නිර්මාණය කිරීමට සුදුසු පරිදි පන්ති කාමරය සකස් කර ගන්න.
- වචන 35ක පමණ නිර්මාණශීලී ආරාධනා පත්‍රයක් සකස් කිරීමට අවස්ථාව සලසා දෙන්න.
- සියලු ම ආරාධනා පත්‍ර පන්ති කාමරයේ දී ම සකස් කර අවසන් කළ යුතු බව අවධාරණය කරන්න.
- ආරාධනා පත්‍ර නිර්මාණය කර අවසන් වූ පසු ඒ පිළිබඳ ඇගයීම් හා ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- ශිෂ්‍යයන් තක්සේරු කිරීම සඳහා ඉගෙනුම් අවස්ථාව අවසානයේ ලබා දී ඇති සලකුණු මාර්ගෝපදේශ යොදා ගන්න.

**තක්සේරු නිර්ණායක සහ සලකුණු මාර්ගෝපදේශ (Rubrics)**
**තක්සේරුකරණ කාර්ය 04**
**ලකුණු ලබා දීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ඉතා හොඳයි 4 | හොඳයි 3 | සාමාන්‍යයි 2 | සංවර්ධනය විය යුතු යි 1 |
|---|---|---|---|---|---|
| 1.6.3 ඇරයුම් පතක ඇතුළත් විය යුතු මූලිකාංග ඇතුළත් කොට අක්ෂර වින්‍යාසය, විරාම ලක්ෂණ හා වචන වෙන් කිරීම පිළිබඳ සැලකිලිමත් ව වචන 35ක පමණ ඇරයුම් පතක් නිර්මාණශීලී ව සකස් කරයි. | ආරාධනය කරන්නා සහ ලබන්නා පැහැදිලි ව සඳහන් කිරීම (ලකුණු 04) | ආරාධනය කරන්නා සහ ලබන්නා පැහැදිලි ව සඳහන් කරයි. | ආරාධනය කරන්නා සහ ලබන්නා තරමක් අඩු පාඩු සහිත ව සඳහන් කරයි. | ආරාධනය කරන්නා සහ ලබන්නා යන දෙදෙනාගෙ න් තරමක් අඩු පාඩු සහිත ව සඳහන් කරයි. | ආරාධනය කරන්නා සහ ලබන්නා බොහෝ අඩු පාඩු සහිත ව සඳහන් කරයි. |
| | ආරාධනය කරන කාරණය, තිබෙන දිනය, වේලාව, ස්ථානය ආරාධනා කරන දිනය සඳහන් කිරීම. (ලකුණු 04) | තොරතුරු පහ ම සඳහන් කරයි. | තොරතුරු හතරක් සඳහන් කරයි. | තොරතුරු තුනක් සඳහන් කරයි. | එක් තොරතුරක් පමණක් සඳහන් කරයි. |
| | සංක්ෂිප්ත සහ පැහැදිලි ව සකස් කිරීම. (ලකුණු 04) | සංක්ෂිප්තභාවය හා පැහැදිලි ව අදාළ පණිවිඩය සඳහන් කරයි. | සංක්ෂිප්ත ව එහෙත් පණිවිඩයේ අපහැදිලිතා සහිත ව සඳහන් කරයි. | දීර්ඝ සහ අනවශ්‍ය විස්තර සහිත ව පණිවිඩය සඳහන් කරයි. | බොහෝ අඩුපාඩු සහිත ව පණිවිඩය සඳහන් කිරීමට උත්සහ දරයි. |
| | නිර්මාණශීලී භාෂා භාවිතය (ලකුණු 04) | ඉතා නිර්මාණශිලී ව භාෂාව භාවිත කරයි. | තරමක් නිර්මාණශිලී ව භාෂාව භාවිත කරයි. | නිර්මාණශිලී ව භාෂාව භාවිත කිරීමට උත්සාහ කරයි. | නිර්මාණශිලීභාවය පිළිබඳ අවධානයකින් තොරව භාෂාව භාවිත කරයි. |
| | විවිධ වර්ණ, හැඩතල සහ රූප භාවිතය (ලකුණු 04) | විවිධ වර්ණ, හැඩතල සහ රූප ඉතා උචිත ලෙස සහ අලංකාර නිමාවක් ලැබෙන පරිදි භාවිත කරයි. | විවිධ වර්ණ, හැඩතල සහ රූප තරමක් උචිත ලෙස භාවිත කරයි. | විවිධ වර්ණ, හැඩතල සහ රූප භාවිත කිරීමට උත්සාහ දරයි. | විවිධ වර්ණ, හැඩතල සහ රූප භාවිතය පිළිබඳ අවධානයකින් තොර ව සකස් කරයි. |
| | නිවැරදි අක්ෂර වින්‍යාසය, විරාම ලක්ෂණ හා වචන වෙන් කිරීම. (ලකුණු 04) | නිවැරදි අක්ෂර වින්‍යාස, විරාම ලක්ෂණ හා වචන වෙන් කිරීම | නිවැරදි අක්ෂර වින්‍යාස, විරාම ලක්ෂණ හා වචන වෙන් කිරීම සුළු අඩු පාඩු සහිත ව සිදු කරයි. | අක්ෂර වින්‍යාස, විරාම ලක්ෂණ හා වචන වෙන් කිරීම තරමක් අඩු පාඩු සහිත ව සිදු කරයි. | අක්ෂර වින්‍යාසය, විරාම ලක්ෂණ හා වචන වෙන් කිරීම බොහෝ අඩු පාඩු සහිත ව සිදු කරයි. |

**ක්‍රියාකාරකම 1.3**

- නිර්මාණය කළ ආරාධනා පත්‍ර සුදුසු ස්ථානයක ප්‍රදර්ශනය කිරීමට සලස්වන්න.
- මිතුරු මිතුරියන් සකස් කළ ආරාධනා පත්‍ර අගය කරමින් අදහස් දැක්වීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඉතා නිර්මාණශීලී ආරාධනා පත්‍ර ශිෂ්‍යයන්ගේ රුචිකත්වය අනුව තෝරා ගැනීමට අවස්ථාව ලබා දී ධනාත්මක උපස්ථම්භන ලබා දෙන්න.
- ප්‍රතිපෝෂණය ලබා දිය යුතු ශිෂ්‍යයන් කෙරෙහි අවධානය යොමු කරන්න.
- මොඩියුලයේ ලබා දී ඇති 'ස්වයං තක්සේරුව' සම්පූර්ණ කිරීම සඳහා ශිෂ්‍යයන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම සහ මග පෙන්වීම සිදු කරන්න.

**ඉගෙනුම් අවස්ථාව 03**
**(කාලච්ඡේද 4යි)**
**සමානාර්ථවත් පද හඳුනා ගනිමු.**

1. සමානාර්ථවත් පද පිළිබඳ පෙර දැනුම සිහිපත් කරමින් පාඩමට ප්‍රවේශය ලබා ගැනීම සඳහා '**පෙර මතකය අවදි කරමු**' යටතේ ඇති ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් නිරත කරවන්න.
2. ශිෂ්‍යයන් ඉදිරිපත් කරන සමානාර්ථවත් පද පුවරුවක් මත සටහන් කර ඒ පිළිබඳ ඔවුන් සමග සාකච්ඡා කරන්න.
3. දෙන ලද පදවලට සමානාර්ථවත් පද සොයා ගැනීමෙන් තම භාෂා හැකියාව වර්ධනය කර ගැනීමටත් වාක්කෝෂය පුළුල් කර ගැනීමටත් හැකි බව පැහැදිලි කර දෙන්න.
4. සමානාර්ථවත් පද පිළිබඳ පරිචයක් ලැබීමෙන් ලේඛනය මෙන් ම කථනය ද රසවත් ව හා ව්‍යක්ත ව පවත්වා ගෙන යා හැකි බව පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරකම 3.1**

- ක්‍රියාකාරකම සඳහා දී ඇති උපදෙස් අවධානයෙන් කියවීමට අවස්ථාව දෙන්න.
- අදාළ වාක්‍ය 15 ම කියවා හිස් තැනට සුදුසු සමානාර්ථවත් පදය කොටුවෙන් තෝරා ලිවීමට ශිෂ්‍යයන් යොමු කරවන්න.
- පිළිතුරු ඇගයීමේ හා ප්‍රතිපෝෂණයේ යෙදෙන්න.
- මෙය පෙරහුරු අභ්‍යාසයක් පමණක් වන අතර මේ සඳහා ලබා ගන්නා ලකුණු අවසාන ඇගයුමට එකතු කරනු නොකළ යුතු ය.

**ක්‍රියාකාරකම 3.2**
**වචන මංජුසාව විවර කරමු - සමානාර්ථවත් පද සොයමු**

- සමානාර්ථවත් පද ලබා දිය හැකි වචන එකතුවක් සකස් කර එම වචන කුඩා කොළ කැබලිවල සටහන් කර මංජුසාවකට හෝ පෙට්ටියකට දමන්න.
- එම පෙට්ටියට "වචන මංජුසාව " යන නම යොදන්න.
- පන්තියේ ශිෂ්‍යයන් කණ්ඩායම් දෙකකට වෙන් කරන්න.
- කණ්ඩායමකින් එක් ශිෂ්‍යයා බැගින් පැමිණ වචන මංජුසාවෙන් කොළය බැගින් තෝරා ගෙන එම වචනයට සමාන වචනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අදාළ ශිෂ්‍යයා නිවැරදි පිළිතුර ලබා දුන් විට කණ්ඩායමට ලකුණු 02ක් ලබා දෙන්න.
- ශිෂ්‍යයාට තනි ව පිළිතුරු දීම අසීරු අවස්ථාවල දී කණ්ඩායමේ සහාය ලබා ගෙන පිළිතුරු දීමට අවස්ථාව ලබා දෙන්න.
- කණ්ඩායමේ සහාය ලබා ගන්නා අවස්ථාවල දී හිමි වන ලකුණු ප්‍රමාණය 01කි.
- මාරුවෙන් මාරුවට කණ්ඩායම් දෙකේ සියලු ම සාමාජිකයන්ට තරග වැදීමට අවස්ථාව ලබා දෙන්න.
- වැඩි ම ලකුණු හිමි කර ගත් ජයග්‍රාහී කණ්ඩායම අගයන්න.
- මෙම ක්‍රියාකාරකම ක්‍රීඩාවක් ලෙස සිදු කළ යුතු අතර මේ සඳහා ලකුණු ලබා දීමේ දී සමස්ත කණ්ඩායමට ම පොදු ලකුණක් ලබා දෙන්න.

**තක්සේරු නිර්ණායක සහ සලකුණු මාර්ගෝපදේශ (Rubrics)**
**තක්සේරුකරණ කාර්ය 01**
**ලකුණු ලබා දීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ඉතා හොඳයි 4 | හොඳයි 3 | සාමාන්‍යයි 2 | සංවර්ධනය විය යුතු යි 1 |
|---|---|---|---|---|---|
| 4.3.2 ස්වයං දැනුවත්භාවය, ස්වයං කළමනාකරණය, සමාජ දැනුවත්භාවය, සමාජ සම්බන්ධතා ගොඩනැගීම හා වගකීමෙන් තීරණ ගැනීම යන සමාජ සංවේදන කුසලතා කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී ප්‍රදර්ශනය කරමින් කටයුතු කරයි. | ආචාරශීලී ව සංයමයෙන් හා සහකම්පනයෙන් යුතු ව කණ්ඩායම් හැඟීම ප්‍රදර්ශනය කරමින් කටයුතු කිරීම (ලකුණු 04) | ඉතා හොඳින් ආචාරශීලීත්වය, සංයමය, සහකම්පනය සහ කණ්ඩායම් හැඟීම ප්‍රදර්ශනය කරමින් කටයුතු කරයි. | හොඳින් ආචාරශීලීත්වය, සංයමය, සහකම්පනය සහ කණ්ඩායම් හැඟීම ප්‍රදර්ශනය කරමින් කටයුතු කරයි. | තරමක් හොඳින් ආචාරශීලීත්වය, සංයමය, සහකම්පනය සහ කණ්ඩායම් හැඟීම ප්‍රදර්ශනය කරමින් කටයුතු කරයි. | ආචාරශීලීත්වය, සංයමය, සහකම්පනය සහ කණ්ඩායම් හැඟීම ප්‍රදර්ශනය කිරීමට උත්සහ කරමින් කටයුතු කරයි. |

**ක්‍රියාකාරකම 3.3**

දෙන ලද ඡේදය අවධානයෙන් හා අවබෝධයෙන් කියවා ගැනීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.

- දී ඇති පද අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- එම පදවලට සුදුසු සමානාර්ථවත් පද ඡේදයෙන් සොයා ලිවීමට උපදෙස් දෙන්න.
- නියමිත අභ්‍යාස සම්පූර්ණ කිරීමෙන් පසු ශිෂ්‍යයන් ඇගයීමට ලක් කරන්න. අවශ්‍ය පරිදි ශිෂ්‍යයන්ට ප්‍රතිපෝෂණය ලබා දෙන්න.

**තක්සේරු නිර්ණායක සහ සලකුණු මාර්ගෝපදේශ (Rubrics)**
**තක්සේරුකරණ කාර්ය 02**
**ලකුණු ලබා දීම**

| |
|---|
| දෙන ලද වචන 15ක් සඳහා සමානාර්ථවත් පද 15ක් ලියා ඇත් නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.<br>$1\times15 = 15$ |

**ක්‍රියාකාරකම 3.4**

- සමානාර්ථවත් පද යොදා වාක්‍ය සකස් කර ගැනීමට අවශ්‍ය උපදෙස් සපයන්න.
- වාක්‍යවල උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, අක්ෂර වින්‍යාසය, වචන වෙන් කිරීම සහ විරාම ලක්ෂණ භාවිතය කෙරෙහි වඩාත් සැලකිලිමත් විය යුතු බව අවධාරණය කරන්න.
- නිර්මාණය කරන ලද වාක්‍ය ඇගයීම් කර සුදුසු ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- 
- ක්‍රියාකාරකම 3.4 අවසානයේ ලබා දී ඇති 'ස්වයං තක්සේරුව' (ඔබගේ හැකියාව ඔබ ම හඳුනා ගන්න)

සම්පූර්ණ කිරීම සඳහා ශිෂ්‍යයන්ට අවශ්‍ය උපදෙස් සහ මග පෙන්වීම සිදු කරන්න.

- ශිෂ්‍යයන් තක්සේරු කිරීම සඳහා ඉගෙනුම් අවස්ථාව අවසානයේ ලබා දී ඇති සලකුණු මාර්ගෝපදේශ යොදා ගන්න.

**තක්සේරු නිර්ණායක සහ සලකුණු මාර්ගෝපදේශ (Rubrics)**
**තක්සේරුකරණ කාර්ය 03**
**ලකුණු ලබා දීම**

- සමානාර්ථවත් පද 15ක් නිවැරදි ව භාවිත කරමින් වාක්‍ය 15ක් ලියා ඇත් නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

  $1 \times 15 = 15$

- උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි ව යොදා ගැනීම, අක්ෂර වින්‍යාසය නිවැරදි වීම, විරාම ලක්ෂණ නිවැරදි ව යෙදීම, නිවැරදි ව වචන වෙන් කිරීම පිළිබඳ අවධානය යොමු කරමින් නිර්මාණශීලී වාක්‍ය ලියා ඇත් නම් අමතර ලකුණු දෙකක් ලබා දෙන්න.
- ඒ අනුව සමස්ත ලකුණු සංඛ්‍යාව 17කි.

- මොඩියුලය අවසානයේ දක්වා ඇති වාංමාලාව කෙරෙහි ද අවධානය යොමු කරවන්න.

**මොඩියුල තක්සේරුකරණය හා ඇගයීම**

මොඩියුලයට අදාළ සම්භාර අගය තීරණය කිරීම සඳහා සම්භවන තක්සේරුව සහ සම්පිණ්ඩිත තක්සේරුව යොදා ගනු ලැබේ. එහි ලකුණු බෙදීයාමේ ප්‍රතිශතය පහත පරිදි වේ.
සම්භවන තක්සේරුව - 70%
සම්පිණ්ඩිත තක්සේරුව - 30%

**සම්භවන තක්සේරුව**

පළමු මොඩියුලයේ සම්භවන තක්සේරුව සඳහා මොඩියුලයේ පළමු ඉගෙනුම් අවස්ථාවේ සිට සිව්වන ඉගෙනුම් අවස්ථාව දක්වා අදාළ ක්‍රියාකාරකම් යොදා ගන්න. මේ අනුව එහි ලකුණු ප්‍රතිශතය 70%කි. එක් මොඩියුලයක් සඳහා ලකුණුවල එකතුව ලකුණු 100කි. මොඩියුලයක ලබා ගත් මුළු ලකුණු X නම් (X/100) x 70 ලෙස ගණනය කරන්න. ලකුණු ඇතුළත් කිරීම සඳහා පහත ආකෘතිය යොදා ගන්න. ඌන ලකුණු හිමි කර ගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ප්‍රතිකාර්ය ඉගෙනුම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න.

| අනු අංකය | ශිෂ්‍යයාගේ/ ශිෂ්‍යාවගේ නම | සුබස් හුරුව -01 තක්සේරුකරණ කාර්යය 3 | නිර්ණායක 1 | | | | නිර්ණායක 2 | | | | නිර්ණායක 3 | | | | නිර්ණායක 4 | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සලකුණු මාර්ගෝපදේශ අනුව ප්‍රාප්ති මට්ටම් | | | | සලකුණු මාර්ගෝපදේශ අනුව ප්‍රාප්ති මට්ටම් | | | | සලකුණු මාර්ගෝපදේශ අනුව ප්‍රාප්ති මට්ටම් | | | | සලකුණු මාර්ගෝපදේශ අනුව ප්‍රාප්ති මට්ටම් | | | | |
| | | | 4 | 3 | 2 | 1 | 4 | 3 | 2 | 1 | 4 | 3 | 2 | 1 | 4 | 3 | 2 | 1 | |
| 1 | A | | | | | | | | | | | | | | | | | | |
| 2 | B | | | | | | | | | | | | | | | | | | |
| 3 | C | | | | | | | | | | | | | | | | | | |

වගුව 1.1

මොඩියුලය ඉගෙනුම් අවස්ථා කිහිපයකින් සමන්විත වේ. ඒ අනුව එක් ඉගෙනුම් අවස්ථාවක් තුළ තක්සේරුකරණ කාර්යයන් කිහිපයක් ද අන්තර්ගත වේ. ඉහත 1.1 වගුවේ සඳහන් ආකාරයෙන් එක් එක් තක්සේරුකරණ කාර්යයෙන් ලබා ගන්නා ලකුණ පහත 1.2 වගුවේ ඇතුළත් කර ඉගෙනුම් අවස්ථාවක සමස්ත ලකුණ ගණනය කර ගත හැකි ය. ඒ අනුව මෙම ආකෘතියෙන් එක් ඉගෙනුම් අවස්ථාවකට එක් වගුවක් වශයෙන් සකස් කර ගත යුතු ය. එක් එක් ඉගෙනුම් අවස්ථාවකට ලබා ගත් ලකුණ පහත වගුව 1.3 ඇතුළත් කිරීමෙන් මොඩියුලයකට හිමි සමස්ත ලකුණ ගණනය කර ගත හැකි ය.

**සුබස් හුරුව 01 - ඉගෙනුම් අවස්ථාව - 02**

| අනු අංකය | ශිෂ්‍යයාගේ/ ශිෂ්‍යාවගේ නම | තක්සේරුකරණ කාර්ය 1 | තක්සේරුකරණ කාර්ය 2 | තක්සේරුකරණ කාර්ය 3 | තක්සේරුකරණ කාර්ය 4 | එකතුව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |

වගුව 1.2

පළමු මොඩියුලයේ සම්භවන තක්සේරුව සඳහා මොඩියුලයේ පළමු ඉගෙනුම් අවස්ථාවේ සිට සිව්වන ඉගෙනුම් අවස්ථාව දක්වා අදාළ ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ලකුණු ඇතුළත් කළ යුතු ය.

| | සම්භවන තක්සේරුව<br>මොඩියුලය අංක 1 -. - සුබස් හුරුව 01 | | | | | 70% සම්භවන තක්සේරුව | 30% සම්පිණ්ඩිත තක්සේරුව | එකතුව 100% | GPA අගය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ශිෂ්‍යයාගේ නම | ඉගෙනුම් අවස්ථාව 1 | ඉගෙනුම් අවස්ථාව 2 | ඉගෙනුම් අවස්ථාව 3 | ඉගෙනුම් අවස්ථාව 4 | | | | |
| 01 | | | | | | | | | |
| 02 | | | | | | | | | |
| 03 | | | | | | | | | |

වගුව 1.3

**සම්පිණ්ඩිත තක්සේරුව**

මේ සඳහා මොඩියුලයේ අන්තර්ගතය ඇසුරෙන් නිර්මාණය කර ගන්නා ලද ක්‍රියාකාරකමක ශිෂ්‍යයන් නිරත කරවා ලකුණු ලබා දෙන්න.

උදාහරණ -

- ලබා දෙන අවස්ථාවලට අදාළ ව සුබ පැතුම් පත් හෝ ආරාධනා පත්‍ර සකස් කිරීමට අවස්ථාව ලබා දීම
- නව තාක්ෂණික ක්‍රම ශිල්ප අනුගමනය කරමින් සුබ පැතුම් පත් හෝ ඇරයුම් පත් සකස් කිරීමට අවස්ථාව ලබා දීම.
- මෙය 30%ක ලකුණු ප්‍රතිශතයකට පරිවර්තනය කර ගන්න.
- සම්පිණ්ඩිත ඇගයීම සඳහා සලකුණු මාර්ගෝපදේශයක් සකස් කර ගන්න.
- ඌන ලකුණු ලබා ගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ප්‍රතිකාර්ය ඉගෙනුම් වැඩපිළිවෙළක් සැලසුම් කරන්න.

**මොඩියුල ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්**
**මොඩියුලය 03 - සාහිත මිහිර 01**

**හැඳින්වීම**

සිංහල භාෂාව, විෂයක් ලෙස මෙන් ම අනෙක් විෂයන් ඉගෙන ගැනීමේ මාධ්‍යක් ලෙස ද අපට වැදගත් වේ. සවන් දීම, කතා කිරීම, කියවීම සහ ලිවීම යනු භාෂාවේ ප්‍රධාන කුසලතා වන අතර චතුර භාෂා හැකියාවක් ඇති කර ගැනීම සඳහා මෙම භාෂා කුසලතා සියල්ල ම වර්ධනය කර ගැනීම අවශ්‍ය වේ. 6 ශ්‍රේණියේ ''සාහිත මිහිර 1'' මොඩියුලය සකස් කර ඇත්තේ සවන් දීම, කතා කිරීම, කියවීම සහ ලිවීම යන භාෂා කුසලතා සහ රස වින්දන කුසලතා වර්ධනය කිරීම සඳහා ය. සිංහල ජන සංස්කෘතිය හා බැඳුණු වචන, යෙදුම් අවබෝධ කර ගැනීමටත්, ජනකතාවක් අවධානයෙන් හා ජීවිතාවබෝධයෙන් කියවීමට හා සවන් දීමටත් මෙම මොඩියුලයෙන් අවස්ථාව සැලසේ. සාහිත්‍ය කෘතියක් රසාස්වාදය කිරීමේ දී අනුගමනය කළ යුතු සරල මාර්ගෝපදේශ මේ මගින් ලබා ගත හැකි ය. 6 ශ්‍රේණියේ දී ''සාහිත මිහිර 1'' මොඩියුලයෙහි,

1. කතන්දර කියවමු; ගුණ නුවණ වඩමු
2. කවි මිහිර විඳිමු
3. ගී මිහිර විඳිමු

යන ඉගෙනුම් අවස්ථා අන්තර්ගත වන අතර එක් එක් ඉගෙනුම් අවස්ථාවට අදාළ ප්‍රායෝගික පුහුණුවක් හා පරිචයක් ලබා ගැනීමට හැකි වන ආකාරයෙන් මෙහි සුතථ්‍ය ඉගෙනුමට යෝග්‍ය ක්‍රියාකාරකම් ඇතුළත් කර ඇත. එමගින් කියවීමේ සහ ලිවීමේ කුසලතා මෙන් ම නිර්මාණශීලී කුසලතා ද වර්ධනය කර ගැනීමට හැකියාව ලැබෙනු ඇතග හතර වන කාර්මික විප්ලවයත් සමග ඇති වන අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය හැකි 21වන සියවසේ කුසලතාවලින් පිරිපුන් පුරවැසියන් බිහි කිරීම මෙහි තවත් එක් අරමුණකි.

| 6 ශ්‍රේණිය | | | | |
|---|---|---|---|---|
| ඉගෙනුම් පල | නිර්දිෂ්ට පෙළ හා අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
| 1.10 සන්නිවේදන කටයුතුවල දී ජනකතා හා බැඳුණු ව්‍යවහාර භාවිත කරයි. | • සිංහල ජන සංස්කෘතිය හා බැඳුණු ව්‍යවහාර ඇතුළත් ජනකතාවක්<br>• (ඒ.පී. ගුණරත්නගේ නගුල් මුන්නා කෘතියෙන් උපුටා ගත් 'පුලුන් රොද' කතාව)<br>• ජන සංස්කෘතිය හා බැඳුණු වචන<br>• ජන සංස්කෘතිය හා බැඳුණු යෙදුම්<br>• නිර්මාණශීලීභාවය<br>• අක්ෂර වින්‍යාසය<br>• විරාම ලක්ෂණ<br>• වචන වෙන් කිරීම | • සවන් දීම<br>• කියවීම<br>• ලිවීම | 1.10.1<br>ජනකතාවක් අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව කියවා එහි ඇතුළත් නිශ්චිත තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | • නිශ්චිත තොරතුරු දෙකක් හඳුනා ගෙන ප්‍රකාශ කිරීම |
| | | | 1.10.2<br>ජනකතාවක් අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව කියවා එහි ඇතුළත් වක්‍ර ව ප්‍රකාශිත තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | • වක්‍ර ව ප්‍රකාශිත තොරතුරු තුනක් හඳුනා ගෙන ප්‍රකාශ කිරීම |
| | | | 1.10.3<br>ජනකතාවක් අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව කියවා ඒ ඇසුරෙන් ජන ව්‍යවහාරයේ පවතින වචන/යෙදුම් පහක් හඳුනා ගැනීම ප්‍රදර්ශනය කරයි. | • ජන ව්‍යවහාරයේ පවතින වචන/යෙදුම් පහක් හඳුනා ගැනීම ප්‍රදර්ශනය කිරීම |
| | | | 1.10.4<br>ජනකතාවක් අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව කියවා ඒ ඇසුරෙන් ජන ව්‍යවහාරයේ පවතින වචන/යෙදුම් පහක් සඳහා සාමාන්‍ය ව්‍යවහාරයේ භාවිත වන වචන/යෙදුම් ලියයි. | • ජන ව්‍යවහාරයේ පවතින වචන/යෙදුම් පහක් සඳහා සාමාන්‍ය ව්‍යවහාරයේ යෙදුම් ලිවීම<br>• අක්ෂර වින්‍යාසය නිවැරදි වීම<br>• විරාම ලක්ෂණ නිවැරදි ව යෙදීම<br>• නිවැරදි ව වචන වෙන් කිරීම |

| ඉගෙනුම් පල | නිර්දිෂ්ට පෙළ<br>හා අන්තර්ගතය | සුවිශේෂ<br>භාෂා<br>ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|---|
| | | | 1.10.5<br>ජනකතාවක් අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව කියවා ඒ ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්න හතරකට නිවැරදි පිළිතුරු ලියයි. | • ප්‍රශ්න පහට ම<br>• නිවැරදි පිළිතුරු ලීවීම<br>• නිර්මාණශිලිබව<br>• අක්ෂර වින්‍යාසය නිවැරදි වීම<br>• විරාම ලක්ෂණ නිවැරදි ව යෙදීම<br>• නිවැරදි ව වචන වෙන් කිරීම |
| 4.1<br>සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරමින් ඒවායේ පසුබිම හඳුනා ගෙන ඉදිරිපත් කරයි. | • ළමයා සහ ගොළුබෙල්ලා - රත්න ශ්‍රී විජේසිංහ<br>• කටු අකුලේ මල් ඇහැරේ - බන්දුල නානායක්කාරවසම් | • කියවීම<br>• ලිවීම | 4.1.1<br>නිර්දිෂ්ට එක් එක් සාහිත්‍ය නිර්මාණයේ පසුබිම පිළිබඳ දෙන ලද විස්තරයක් ඇසුරෙන් එම නිර්මාණයේ කතුවරයා හා ඔහුගේ වෙනත් නිර්මාණ දෙකක් නම් කරයි. | • කතුවරයාගේ නම සඳහන් කිරීම<br>• කතුවරයාගේ වෙනත් නිර්මාණ දෙකක් නම් කිරීම |
| 4.2<br>සාහිත්‍ය නිර්මාණ කියවා අගයමින් අදහස් දක්වයි. | • ළමයා සහ ගොළුබෙල්ලා-රත්න ශ්‍රී විජේසිංහ<br>• කටු අකුලේ මල් ඇහැරේ - බන්දුල නානායක්කාරවසම් යන නිර්මාණවල අර්ථාවබෝධය සහ රසවත් වීමට හේතු වූ කරුණු | • කියවීම<br>• ලිවීම | 4.2.1<br>නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ කියවා අර්ථාවබෝධය ප්‍රදර්ශනය කරමින් අදහස් දක්වයි. | • අර්ථාවබෝධය ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්න හතරට ම නිවැරදි පිළිතුරු ලිවීම<br>• අක්ෂර වින්‍යාසය නිවැරදි වීම<br>• විරාම ලක්ෂණ<br>• නිවැරදි ව භාවිත කිරීම<br>• නිවැරදි ව වචන වෙන් කිරීම |
| | | | 4.2.2<br>නිර්දිෂ්ට එක් එක් සාහිත්‍ය නිර්මාණ කියවා ඒවා රසවත් වීමට හේතු වූ කරුණු ලියයි. | • රසවත් වීමට හේතු වූ කරුණු දෙකක්<br>• නිවැරදි ව ලිවීම<br>• අක්ෂර වින්‍යාසය නිවැරදි වීම<br>• විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කිරීම<br>• නිවැරදි ව වචන වෙන් කිරීම |

| ඉගෙනුම් පල | නිර්දිෂ්ට පෙළ හා අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|---|
| 4.3<br>සාහිත්‍ය පරිශීලනයෙන් වර්ධනය කර ගත් සමාජ සංවේදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 6 ශ්‍රේණිය සඳහා නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ ඇසුරෙන්<br>● ස්වයං දැනුවත්භාවය (Self Awareness)<br>- හැඟීම් හඳුනා ගැනීම<br>- ශක්‍යතා හඳුනා ගැනීම<br>- ආත්ම විශ්වාසය<br>- ස්වයංකාර්යක්ෂමතාව<br>- සංජානනය<br>● ස්වයං කළමනාකරණය (Self Management)<br>- ආවේග පාලනය<br>- ආතතිය කළමනාකරණය<br>- ස්වයංවිනය<br>- ස්වයංපෙලඹවීම<br>- ඉලක්කගත වීම<br>- සංවිධාන කුසලතා<br>● සමාජ දැනුවත් භාවය (Social Awareness)<br>- නිවැරදි දැක්ම<br>- සහකම්පනය<br>- විවිධත්වය අගය කිරීම<br>- අන්‍යයන්ට ගරු කිරීම | ● කියවීම<br>● ලිවීම | 4.3.1<br>සාහිත්‍ය නිර්මාණ රස විඳීමෙන් අත්පත් කර ගත හැකි ස්වයංදැනුවත්භාවය, ස්වයං කළමනාකරණය, සමාජ දැනුවත්භාවය, සමාජ සම්බන්ධතා ගොඩනැගීම, වගකීමෙන් තීරණ ගැනීම සහ යන සමාජ සංවේදන කුසලතා ඇසුරින් අසනු ලබන ප්‍රශ්න දෙකකට පිළිතුරු ලියයි. | ● ප්‍රශ්න දෙකට ම පිළිතුරු ලිවීම<br>● අක්ෂර වින්‍යාසය නිවැරදි වීම<br>● විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කිරීම<br>● නිවැරදි ව වචන වෙන් කිරීම |
| | | | 4.3.2<br>සාහිත්‍ය නිර්මාණ රස විඳීමෙන් අත්පත් කර ගත හැකි ස්වයංදැනුවත්භාවය, ස්වයංකළමනාකරණය, සමාජ දැනුවත්භාවය, සමාජ සම්බන්ධතා ගොඩනැගීම, වගකීමෙන් තීරණ ගැනීම සහ යන සමාජ සංවේදන කුසලතා කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී ප්‍රදර්ශනය කරමින් කටයුතු කරයි. | ● ස්වයං දැනුවත්භාවය පිළිබඳ කුසලතා ප්‍රදර්ශනය කිරීම.<br>● ස්වයං කළමනාකරණය පිළිබඳ කුසලතා ප්‍රදර්ශනය කිරීම.<br>● සමාජ දැනුවත්භාවය පිළිබඳ කුසලතා ප්‍රදර්ශනය කිරීම.<br>● සමාජ සම්බන්ධතා ගොඩ නැගීම පිළිබඳ කුසලතා ප්‍රදර්ශනය කිරීම.<br>● වගකීමෙන් තීරණ ගැනීම පිළිබඳ කුසලතා ප්‍රදර්ශනය කිරීම. |

| ඉගෙනුම් පල | නිර්දිෂ්ට පෙළ හා අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|---|
| | • සමාජ සම්බන්ධතා ගොඩනැගීමේ කුසලතා (Relationship Skills)<br>- සන්නිවේදනය<br>- සමාජ නියුක්තිකරණය<br>- සබඳතා ගොඩනගා ගැනීම<br>- කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>• වගකීමෙන් තීරණ ගැනීම (Responsible Decision Making)<br>- ගැටලු හඳුනා ගැනීම<br>- අවස්ථා විශ්ලේෂණය<br>- ගැටලු විසඳීම<br>- ඇගයීම<br>- ප්‍රත්‍යවේක්ෂණය<br>- සදාචාරාත්මක වගකීම<br>යන සමාජ සංවේදන කුසලතා | | | |

**ඉගෙනුම් අවස්ථාව 01**
**(කාලච්ඡේද 04යි)**
**පුලුන් රොද**

1. කතන්දර පිළිබඳ පෙර දැනුම සිහිපත් කරමින් 'පුලුන් රොද' පාඩමට ප්‍රවේශය ලබා ගැනීම සඳහා **'පෙර මතකය අවදි කරමු'** යටතේ ඇති ප්‍රශ්නවලට ශිෂ්‍යයන්ගෙන් පිළිතුරු ලබා ගනිමින් සාකච්ඡාවක් ගොඩනගන්න.

- පහත කරුණු පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ජා කරන්න.
  - ජනකතා යනු මොනවා ද?
  - ජනකතා කියවීමේ වැදගත්කම
  - ජනකතාවල භාෂා භාවිතය
  - ජනකතාවකින් ලබා ගත හැකි ජීවිතාවබෝධය
  - ජනකතා පොත් හා ඒවායේ රචකයන් පිළිබඳ අවබෝධය
- 'පුලුන් රොද' ජනකතාව අවබෝධයෙන් සහ අවධානයෙන් කියවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- 'පුලුන් රොද' ජනකතාවේ ඇතුළත් සිදුවීම් අනුපිළිවෙළින් වාචික ව ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ශිෂ්‍යයන්ගේ රස වින්දනය හා අවබෝධය තව දුරටත් පුළුල් කිරීම සඳහා ලබා දී ඇති QR කේතය යොදා ගනිමින් ජනකතාවට සවන් දීම සඳහා අවස්ථාව සලසන්න.

- පටිගත කරන ලද ජනකතාවට සවන් දීමට අවශ්‍ය තාක්ෂණික උපකරණ සහ සම්පත් නොමැති අවස්ථාවක දී පන්තියේ ශිෂ්‍යයන් යොදා ගනිමින් කතා රසය මතු වන ආකාරයෙන් එම ජනකතාව පන්තියට ඉදිරිපත් කරවන්න.
- සවන් දීමෙන් පසු අදාළ කතාව පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- ජනකතාවේ කතුවරයා සහ 'පුලුන් රොද' ජනකතාව ඇතුළත් 'නගුල් මුන්නා සහ තවත් කතා' පොත පිළිබඳ අවබෝධයක් ලබා දෙන්න.
- කතුවරයා පිළිබඳ ලබා දී ඇති තොරතුරු අවධානයෙන් කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- කතුවරයාගේ වෙනත් සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 1.1**

- ක්‍රියාකාරකම 1.1 ඇතුළත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.
- එම පිළිතුරු අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- ප්‍රශ්නවලට ලබා දී ඇති පිළිතුරු ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරමින් ඇගයීමේ සහ ප්‍රතිපෝෂණයේ යෙදෙන්න.

**තක්සේරු නිර්ණායක සහ සලකුණු මාර්ගෝපදේශ (Rubrics)**
**තක්සේරුකරණ කාර්ය 01**
**ලකුණු ලබා දීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|---|
| 1.10.1<br>ජනකතාවක් අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව කියවා එහි ඇතුළත් නිශ්චිත තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | නිශ්චිත තොරතුරු දෙකක් ප්‍රකාශ කිරීම<br>ක්‍රියාකාරකම 1.1 | 1 | 2 |
| | | 2 | 1 |
| 1.10.3<br>ජනකතාවක් අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව කියවා ඒ ඇසුරෙන් ජන ව්‍යවහාරයේ පවතින වචන/යෙදුම් පහක් සඳහා සාමාන්‍ය ව්‍යවහාරයේ භාවිත වන වචන/යෙදුම් ලියයි. | ජන ව්‍යවහාරයේ පවතින වචන/යෙදුම් පහක් හඳුනා ගැනීම<br>ක්‍රියාකාරකම 1.1 | 3 | 5 |
| මුළු ලකුණු | | | 8 |

ක්‍රියාකාරකම 1.2

- ක්‍රියාකාරකම 1.2 ඇතුළත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.
- එම පිළිතුරු අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- ප්‍රශ්නවලට ලබා දී ඇති පිළිතුරු ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරමින් ඇගයීමේ සහ ප්‍රතිපෝෂණයේ යෙදෙන්න.

**තක්සේරුකරණ කාර්ය 02**
**ලකුණු ලබා දීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|---|
| 1.10.2<br>ජනකතාවක් අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව කියවා එහි ඇතුළත් වක්‍ර ව ප්‍රකාශිත තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | වක්‍ර ව ප්‍රකාශිත තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කිරීම<br>ක්‍රියාකාරකම 1.2 | 1 | 2 |
| | | 2 | 2 |
| මුළු ලකුණු | | | 4 |

ක්‍රියාකාරකම 1.3

- පන්තියේ ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- 'පුලුන් රොද' කතාවේ අවසානය නිර්මාණශීලී ලෙස වෙනස් කර ලිවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- අවසානය නැවත නිර්මාණය කළ කතන්දරය පන්තියට ඉදිරිපත් කිරීමට කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කිරීම් අගය කරමින් අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- මොඩියුලයේ ලබා දී ඇති 'ස්වයං තක්සේරුව' (ඔබගේ හැකියාව ඔබ ම හඳුනා ගන්න) සම්පූර්ණ කිරීම සඳහා ශිෂ්‍යයන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම සහ මග පෙන්වීම සිදු කරන්න.

- ශිෂ්‍යයන් තක්සේරු කිරීම සඳහා ඉගෙනුම් අවස්ථාව අවසානයේ ලබා දී ඇති සලකුණු මාර්ගෝපදේශ යොදා ගන්න.
- කණ්ඩායමේ සියලු දෙනාට පොදු ලකුණක් ලබා දෙන්න.

**තක්සේරු නිර්ණායක සහ සලකුණු මාර්ගෝපදේශ (Rubrics)**
**තක්සේරුකරණ කාර්ය 03**
**ලකුණු ලබා දීම**

| තක්සේරු නිර්ණායක | ඉතා හොඳයි 4 | හොඳයි 3 | සාමාන්‍යයි 2 | සංවර්ධනය විය යුතු යි 1 |
|---|---|---|---|---|
| කතාවේ අවසානය නිර්මාණශීලී ව වෙනස් කර ලියයි. | කතාවේ අවසානය ඉතා නිර්මාණශීලී ව වෙනස් කර ලියයි. (ලකුණු 04) | කතාවේ අවසානය බොහෝ දුරට නිර්මාණශීලී ව වෙනස් කර ලියයි. | කතාවේ අවසානය තරමක් නිර්මාණශීලී ව වෙනස් කර ලියයි. | කතාවේ අවසානය වෙනස් කර ලිවීමට උත්සාහ කරයි. |
| කණ්ඩායම් හැඟීම ප්‍රදර්ශනය කරමින් කටයුතු කිරීම | ඉතා හොඳින් කණ්ඩායම් හැඟීම ප්‍රදර්ශනය කරමින් කටයුතු කරයි. (ලකුණු 04) | හොඳින් කණ්ඩායම් හැඟීම ප්‍රදර්ශනය කරමින් කටයුතු කරයි. | තරමක් හොඳින් කණ්ඩායම් හැඟීම ප්‍රදර්ශනය කරමින් කටයුතු කරයි. | කණ්ඩායම් හැඟීමෙන් තොරව තනි ව කටයුතු කරයි. |
| ආචාරශීලී ව හා සංයමයෙන් යුතු ව සහකම්පනය ප්‍රදර්ශනය කරමින් කටයුතු කිරීම | ආචාරශීලීත්වය, සංයමය සහ සහකම්පනය ඉතා හොඳින් ප්‍රදර්ශනය කරමින් කටයුතු කරයි. (ලකුණු 04) | ආචාරශීලීත්වය, සංයමය සහ සහකම්පනය හොඳින් ප්‍රදර්ශනය කරමින් කටයුතු කරයි. | ආචාරශීලීත්වය, සංයමය සහ සහකම්පනය තරමක් හොඳින් ප්‍රදර්ශනය කරමින් කටයුතු කරයි. | ආචාරශීලීත්වය, සංයමය සහ සහකම්පනය ප්‍රදර්ශනය කිරීමට උත්සහ කරමින් කටයුතු කරයි. |

**ඉගෙනුම් අවස්ථාව 02**
**(කාලච්ඡේද 04යි)**
**කවි මිහිර විඳිමු**

- ශිෂ්‍යයන් කියවා ඇති කවි පන්තියක් පිළිබඳ පෙර දැනුම සිහිපත් කරමින් පාඩමට ප්‍රවේශය ලබා ගැනීම සඳහා **'මතක පොතේ පිටු පෙරළමු'** යටතේ ඇති කරුණු කෙරෙහි ශිෂ්‍ය අවධානය යොමු කරමින් සාකච්ඡාවක් ගොඩ නගන්න.

**ක්‍රියාකාරකම 2.1**

- 'ළමයා සහ ගොළුබෙල්ලා' කවි පන්තියේ කතුවරයා පිළිබඳ ලබා දී ඇති තොරතුරු අවධානයෙන් කියවා ගැනීමට සලස්වන්න.
- අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

**තක්සේරු නිර්ණායක සහ සලකුණු මාර්ගෝපදේශ (Rubrics)**
**තක්සේරුකරණ කාර්ය 01**
**ලකුණු ලබා දීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ඉතා හොඳයි 4 | හොඳයි 3 | සාමාන්‍යයි 2 | සංවර්ධනය විය යුතු යි 1 |
|---|---|---|---|---|---|
| 4.1.1 සාහිත්‍ය නිර්මාණයේ පසුබිම පිළිබඳ දෙන ලද විස්තරයක් ඇසුරෙන් එම නිර්මාණයේ කතුවරයා හා ඔහුගේ වෙනත් නිර්මාණ දෙකක් නම් කරයි. | කතුවරයා හා ඔහුගේ වෙනත් නිර්මාණ දෙකක් නම් කිරීම (ලකුණු 04) | කතුවරයා හා ඔහුගේ වෙනත් නිර්මාණ දෙකක් නම් කරයි. | කතුවරයා හා ඔහුගේ වෙනත් නිර්මාණයක් නම් කරයි. | කතුවරයාගේ වෙනත් නිර්මාණ දෙකක් පමණක් නම් කරයි. | කතුවරයා හෝ ඔහුගේ වෙනත් නිර්මාණයක් හෝ නම් කරයි. |

**ක්‍රියාකාරකම 2.2**

- පන්තියේ ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම්වලට වෙන් කරන්න.
- 'ළමයා සහ ගොළුබෙල්ලා' කවි පන්තිය කණ්ඩායමේ සාමාජිකයන් සමග කියවා රස විඳීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- කවි පන්තිය රසවත් වීමට හේතු සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එම හේතු පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කිරීම් අගය කරන්න.
- ශිෂ්‍යයන්ගේ අදහස් සැලකිල්ලට ගනිමින් අර්ථ රසය සහ ශබ්ද රසය ඇති කිරීමට කවියා යොදා ගත් උපක්‍රම, භාෂාව භාවිතය, අරමුණ ආදි කරුණු පිළිබඳ සාකච්ඡාවක් ගොඩනගන්න.
- මොඩියුලයේ "කවි පෙළේ විශේෂතා හඳුනා ගනිමු " යටතේ ඇති කරුණු කෙරෙහි ශිෂ්‍ය අවධානය යොමු කරන්න.
- පිළිතුරු ඇගයීමට ලක් කර ප්‍රතිපෝෂණය ලබා දෙන්න.
- කවි පන්තිය රසවත් වීමට හේතු දෙකක් විස්තර සහිත ව අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට උපදෙස් ලබා දෙන්න.

තක්සේරුකරණ කාර්ය 02

ලකුණු ලබා දීම

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ඉතා හොඳයි 4 | හොඳයි 3 | සාමාන්‍යයි 2 | සංවර්ධනය විය යුතු යි 1 |
|---|---|---|---|---|---|
| 4.2.2 නිර්දිෂ්ට එක් එක් සාහිත්‍ය නිර්මාණ කියවා ඒවා රසවත් වීමට හේතු වූ කරුණු ලියයි. | රසවත් වීමට හේතු වූ කරුණු දෙකක් විස්තර සහිත ව ලිවීම (ලකුණු 04) | රසවත් වීමට හේතු වූ කරුණු දෙකක් නිවැරදි ව හඳුනා ගෙන විස්තර සහිත ව ඉදිරිපත් කරයි. | රසවත් වීමට හේතු වූ කරුණු දෙකක් නිවැරදි ව හඳුනා ගෙන කෙටි විස්තරයක් සහිත ව ඉදිරිපත් කරයි. | රසවත් වීමට හේතු වූ කරුණු දෙකක් හඳුනා ගෙන විස්තර රහිත ව ඉදිරිපත් කරයි. | රසවත් වීමට හේතු වූ එක් කරුණක් අන් අයගේ සහාය ඇති ව ඉදිරිපත් කරයි. |
| | අක්ෂර වින්‍යාසය නිවැරදි වීම (ලකුණු 04) | සියලු ම වචන නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි. | වචනවලින් 75%කට වැඩි සංඛ්‍යාවක් නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි. | වචනවලින් 75%-50%ක් අතර සංඛ්‍යාවක් නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි. | වචනවලින් 50%කට අඩු සංඛ්‍යාවක් නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි. |
| | විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කිරීම (ලකුණු 04) | විරාම ලක්ෂණ ඉතා නිවැරදි ව භාවිත කරයි. | විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කරයි. | විරාම ලක්ෂණ තරමක් නිවැරදි ව භාවිත කරයි. | විරාම ලක්ෂණ භාවිතය ගැන සැලකිල්ලකින් තොරව ලියයි. |
| | නිවැරදි ව වචන වෙන් කිරීම (ලකුණු 04) | ඉතා නිවැරදි ව වචන වෙන් කර ලියයි. | නිවැරදි ව වචන වෙන් කර ලියයි. | තරමක් නිවැරදි ව වචන වෙන් කර ලියයි. | වචන වෙන් කිරීම පිළිබඳ සැලකිල්ලක් තොරව ලියයි. |

ක්‍රියාකාරකම 2.3

- කවි පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- පිළිතුරු ඇගයීමේ සහ ප්‍රතිපෝෂණයේ යෙදෙන්න.

**තක්සේරු නිර්ණායක සහ සලකුණු මාර්ගෝපදේශ (Rubrics)**
**තක්සේරුකරණ කාර්ය 03**
**ලකුණු ලබා දීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ඉතා හොඳයි 4 | හොඳයි 3 | සාමාන්‍යයි 2 | සංවර්ධනය විය යුතු යි 1 |
|---|---|---|---|---|---|
| 4.2.1 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ කියවා අර්ථාවබෝධය ප්‍රදර්ශනය කරමින් අදහස් දක්වයි. | අර්ථාවබෝධය ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්න හතරට ම නිවැරදි පිළිතුරු ඉදිරිපත් කිරීම (ලකුණු 04) | අර්ථාවබෝධය ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්න හතරට ම නිවැරදි පිළිතුරු ඉදිරිපත් කිරීම කරයි. | අර්ථාවබෝධය ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්න තුනකට නිවැරදි පිළිතුරු ඉදිරිපත් කරයි. | අර්ථාවබෝධය ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්න දෙකකට නිවැරදි පිළිතුරු ඉදිරිපත් කරයි. | අර්ථාවබෝධය ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්නයකට නිවැරදි පිළිතුරු ඉදිරිපත් කරයි. |

මෙම කරුණු ශිෂ්‍යයාගේ වයස් මට්ටමට ගැළපෙන ආකාරයට සරල ව පැහැදිලි කරන්න. සටහන් ලබා දීමෙන් වලකින්න.

- තේමාව/නිර්මාණයේ ප්‍රධාන අදහස
- නිර්මාණය වඩාත් රසවත් වීමට හේතු
- රිද්මානුකූල ව බස හැසිරවීම
- අනුප්‍රාසාත්මක ලෙස භාෂාව යොදා ගැනීම
- චිත්තරූප මැවෙන සේ භාෂාව භාවිත කිරීම
- සරල බස් වහරක් යොදා ගැනීම
- කවි පන්තිය රස වින්දනයේ දී සිතේ හටගත් අදහස
- ඉවසීමෙන් කටයුතු කිරීම
- ශිෂ්‍යයන් ජීවිතයේ මුහුණ දුන් අභියෝගාත්මක අවස්ථා
- එම අවස්ථාවල ඉවසීමෙන් කටයුතු කිරීමෙන් අත් වූ වාසි
- එම අවස්ථාවල ඉවසීමෙන් කටයුතු නො කිරීමෙන් අත් වූ අවාසි
- කවි පන්තියෙහි ඇතුළත් තවත් ධනාත්මක අදහස්

- මොඩියුලය අවසානයේ ලබා දී ඇති 'ස්වයං තක්සේරුව' (ඔබගේ හැකියාව ඔබ ම හඳුනා ගන්න) සම්පූර්ණ කිරීම සඳහා ශිෂ්‍යයන්ට අවශ්‍ය මග පෙන්වීම සිදු කරන්න.
- ශිෂ්‍යයන් තක්සේරු කිරීම සඳහා ඉගෙනුම් අවස්ථාව අවසානයේ ලබා දී ඇති සලකුණු මාර්ගෝපදේශ යොදා ගන්න.
- වැඩිදුර අධ්‍යයනය සඳහා යොමු කර ඇති ක්‍රියාකාරකම් කෙරෙහි ද අවධානය යොමු කරවන්න.
- ගුරුවරයාගේ දැනුම සහ අවබෝධය පුළුල් කර ගැනීම සඳහා ඇමුණුම 1හි ඇති කරුණු මැනවින් ගවේෂණය කරන්න.

ඇමුණුම 1 - (ගුරුභවතාගේ පරිශීලනය සඳහා පමණි)

- **තේමාව/ඉෂ්ටාර්ථය** -''සාහිත්‍ය කෘතියක අන්තර්ගත වන හෝ ඉන් ප්‍රකාශ කෙරෙන හෝ සමස්ත සංක්ෂිප්ත අර්ථය. ඉෂ්ටාර්ථය වූ කලී කෘතියේ විෂය ක්ෂේත්‍රය හෝ අරමුණ හෝ කතා සාරය හෝ තානය හෝ නො වේ. ඉෂ්ටාර්ථය ප්‍රධාන වශයෙන් කතාවක සිද්ධි හා චරිත ක්‍රියාකාරිත්වයේ සංයෝගයෙන් ඇති වන්නකි. කතුවරයා සමාජය පිළිබඳ දරන ආකල්පය ද කෘතියේ ඉෂ්ටාර්ථය කෙරෙහි බලපායි. එයින් ජීවිතය හෝ හර පිළිබඳ හෝ යම් අර්ථවත් දෙයක් ඉදිරිපත් කෙරේ. ඇතැම් කෘතියක ආරම්භයෙහි හෝ අවසානයෙහි හෝ එසේත් නැතහොත් අනෙක් තැනක හෝ ඉෂ්ටාර්ථය පිඬු කොට දැක්වෙනු ඇත.''

  (සාහිත්‍ය කලා ප්‍රදීපිකා - ඒ. වී. සුරවීර 2005 පිටුව 47)

- **උපමා/උපමාලංකාරය** - ''උපමාව නම් යම් වස්තුවක් වඩා හොඳින් පැහැදිලි කිරීම සඳහා හෝ තේරුම් කිරීම සඳහා තවත් වස්තුවකට සමාන කොට දැක්වීම ය. උපමාවක් දැක්වීමේ දී අවශ්‍යයෙන් ම 'මෙන්, සේ, වැනි, එව්' ආදි උපමා වාචක නිපාත පදයක් සමග යෙදේ.''

  (සාහිත්‍ය කලා ප්‍රදීපිකා - ඒ. වී. සුරවීර 2005 පිටුව 54)

- **රූපකය** - ''කාව්‍යාලංකාර ප්‍රභේදයකි. සැඟවුණ භේදයකින් සමන්විත උපමාන උපමේය යන

  දෙක එකක් වශයෙන් ගැනීම රූපකාලංකාරය නම් වේ. එසේ ම එය මෙන්, සේ, වැනි, එව් ආදි උපමාද්‍යෝතක නිපාතයන්ගෙන් තොරව යෙදුණු උපමා - උපමේයයන්ගේ සම්බන්ධය යයි කිව හැකි ය.''

  (සාහිත්‍ය කලා ප්‍රදීපිකා - ඒ. වී. සුරවීර 2005 පිටුව 191)

- **අනුප්‍රාසය** - ''සමාන අක්ෂර, පද, පාඨ ආදිය ළඟ ළඟ යෙදීම. අනුප්‍රාස යෙදීමෙන් ශබ්ද මාධූර්යය ඇති වේ.

  (සාහිත්‍ය කලා ප්‍රදීපිකා - ඒ. වී. සුරවීර 2005 පිටුව 17)

- **ධ්වනිතාර්ථය/ව්‍යංග්‍යාර්ථය** - ''ව්‍යංග්‍යාර්ථය නම් යම් ශබ්දයකින් එහි වාච්‍යාර්ථය ද ලක්ෂ්‍යාර්ථය ද ඉක්මවා ලැබෙන පුළුල් අර්ථයකි. එක් එක් පුද්ගලයා හෙවත් සහෘදයා සම්බන්ධයෙන් ඔහු ලබන ව්‍යංග්‍යාර්ථය වෙනස් විය හැකි ය. උත්තම කාව්‍ය නම් මේ ව්‍යංග්‍යාර්ථවත් හෙවත් ධ්වනිතාර්ථවත් කාව්‍යයයි.''

  (සාහිත්‍ය කලා ප්‍රදීපිකා - ඒ. වී. සුරවීර 2005 පිටුව 124)

- **සංකල්ප රූප** - ''භාෂාව නොහොත් තම නිර්මාණය සඳහා භාවිත කෙරෙන වචන සංයෝග මගින් පාඨකයාගේ මනසෙහි චිත්‍රයක් මැවීම නිර්මාණ ලේඛකයාගේ කාර්ය වන්නේ ය. සංකල්ප රූපය නම් වචන මගින් ඉදිරිපත් කෙරෙන වාග් චිත්‍රයයි. එය වාග් චිත්‍රයක් වන්නේ වචන ආශ්‍රයෙන් මවන චිත්‍රයක් නිසා ය.''

  (සාහිත්‍ය කලා ප්‍රදීපිකා - ඒ. වී. සුරවීර 2005 පිටුව 231)

**ඉගෙනුම් අවස්ථාව 03**
**(කාලච්ඡේද 03යි)**
**ගී මිහිර විඳිමු**

- 'ළමා ගීත' පිළිබඳ පෙර දැනුම සිහිපත් කරමින් පාඩමට ප්‍රවේශය ලබා ගැනීම සඳහා '**මතක පොතේ පිටුපෙරළමු**' යටතේ ඇති ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් නිරත කරවන්න.
- අන්තර්ජාලයට පිවිස ගීතයට සවන් දීමේ දී ගුරුවරයා/ගුරුවරිය හෝ වැඩිහිටියෙකුගේ මගපෙන්වීම අනුව පමණක් කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- තාක්ෂණික පහසුකම් යොදා ගනිමින් පන්ති කාමරයේ දී ම ගීතයට සවන් දීමට අවස්ථාව ලබා දීම
- වඩාත් සුදුසු වේ. ගීත රචකයා, ගායනය, සංගීතය සහ රචකයාගේ වෙනත් නිර්මාණ පිළිබඳ අවධානය යොමු කරවන්න.
- ගීතයක පද රචනයට සංගීතයෙන් සහ ගායනයෙන් ලැබෙන ආලෝකය පිළිබඳ සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරකම 3.1**

- ක්‍රියාකාරකමේ ලබා දී ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවස්ථාව ලබා දෙන්න.
- පිළිතුරු සාකච්ඡා කර ඇගයීමේ සහ ප්‍රතිපෝෂණයේ යෙදෙන්න.

**තක්සේරු නිර්ණායක සහ සලකුණු මාර්ගෝපදේශ (Rubrics)**
**තක්සේරුකරණ කාර්ය 01**
**ලකුණු ලබා දීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ඉතා හොඳයි 4 | හොඳයි 3 | සාමාන්‍යයි 2 | සංවර්ධනය විය යුතු යි 1 |
|---|---|---|---|---|---|
| 4.1.1 සාහිත්‍ය නිර්මාණයේ පසුබිම පිළිබඳ දෙන ලද විස්තරයක් ඇසුරෙන් එම නිර්මාණයේ කතුවරයා හා ඔහුගේ වෙනත් නිර්මාණ දෙකක් නම් කරයි. | කතුවරයා හා ඔහුගේ වෙනත් නිර්මාණ දෙකක් නම් කිරීම (ලකුණු 04) | කතුවරයා හා ඔහුගේ වෙනත් නිර්මාණ දෙකක් නම් කරයි. | කතුවරයා හා ඔහුගේ වෙනත් නිර්මාණයක් නම් කරයි. | කතුවරයාගේ වෙනත් නිර්මාණ දෙකක් පමණක් නම් කරයි. | කතුවරයා හෝ ඔහුගේ වෙනත් නිර්මාණයක් හෝ නම් කරයි. |

- ගීතය කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- ගායනයට සුවිශේෂ හැකියාවක් ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන් ප්‍රමුඛ කර ගනිමින් ගීතය ගායනා කිරීමට හෝ අන්තර්ජාලයේ ඇති පටිගත කරන ලද ගීතයට සවන් දීමට පන්තියේ ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

ක්‍රියාකාරකම 3.2

- ක්‍රියාකාරකම 3.2 යටතේ ලබා දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට අවස්ථාව ලබා දෙන්න.
- අදාළ පිළිතුරු ඇගයීමට ලක් කර ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**තක්සේරු නිර්ණායක සහ සලකුණු මාර්ගෝපදේශ (Rubrics)**

**තක්සේරුකරණ කාර්ය 02**

**ලකුණු ලබා දීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ඉතා හොඳයි 4 | හොඳයි 3 | සාමාන්‍යයි 2 | සංවර්ධනය විය යුතු යි 1 |
|---|---|---|---|---|---|
| 4.2.1 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ කියවා අර්ථාවබෝධය ප්‍රදර්ශනය කරමින් අදහස් දක්වයි. | අර්ථාවබෝධය ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්න හතරට ම නිවැරදි පිළිතුරු ඉදිරිපත් කිරීම (ලකුණු 04) | අර්ථාවබෝධය ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්න හතරට ම නිවැරදි පිළිතුරු ඉදිරිපත් කිරීම කරයි. | අර්ථාවබෝධය ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්න තුනකට නිවැරදි පිළිතුරු ඉදිරිපත් කරයි. | අර්ථාවබෝධය ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්න දෙකකට නිවැරදි පිළිතුරු ඉදිරිපත් කරයි. | අර්ථාවබෝධය ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්නයකට නිවැරදි පිළිතුරු ඉදිරිපත් කරයි. |

ක්‍රියාකාරකම 3.3

- පන්තියේ ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම්වලට වෙන් කරන්න.
- 'කටු අකුලේ මල් ඇහැරේ' ගීතය යළි කියවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- 'කටු අකුලේ මල් ඇහැරේ' ගීතය රසවත් වීමට හේතු වූ කරුණු කණ්ඩායමේ සාමාජිකයින් සමග සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- කවිය රසවත් වීමට හේතු පන්තියට ඉදිරිපත් කිරීමට එක් එක් කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කිරීම් අගය කරන්න.
- ශිෂ්‍යයන්ගේ අදහස් ද සැලකිල්ලට ගනිමින් අර්ථ රසය සහ ශබ්ද රසය ඇති කිරීමට රචකයා යොදා ගත් උපක්‍රම, භාෂාව භාවිතය, අරමුණ ආදි කරුණු පිළිබඳ ඔවුන්ගේ අවධානය යොමු කරවන්න.
- මොඩියුලයේ " ගීතයේ විශේෂතා හඳුනා ගනිමු" යටතේ ඇති කරුණු කෙරෙහි ශිෂ්‍ය අවධානය යොමු කරන්න.
- පිළිතුරු ඇගයීමට ලක් කර ප්‍රතිපෝෂණය ලබා දෙන්න.
- වැඩිදුර ඉගෙනුම සඳහා ලබා දී ඇති කරුණු පිළිබඳ ස්වයං අධ්‍යයනයක යෙදෙන්නට මග පෙන්වන්න.
- ඒ සඳහා පහත කරුණු ඉවහල් කර ගන්න. එම කරුණු ශිෂ්‍යයන්ට ගැළපෙන ආකාරයට සරල ව පැහැදිලි කරන්න.
    - ගීත රචනය, සංගීතය හා ගායකයා
    - ගීතයේ තේමාව
    - ළමා ලෝකයේ සුන්දරත්වය මවන ආකාරය
    - ළමා හදවත්වල පිවිතුරු බව
    - බාධා ජයගෙන ඉදිරියට යායුතු බව
    - අනාගතය බාර දරුවන්ට බව
    - ගීත නිර්මාණයේ දී භාෂාව භාවිත කර ඇති ආකාරය
    - ගීතයේ ඇතුළත් අදහස් කෙටියෙන් සාකච්ඡා කිරීම
    - ශිෂ්‍යයන්ගේ ජීවිත සංවර්ධනයට ලබා ගත හැකි ආදර්ශ
- ගීතය රසවත් වීමට හේතු දෙකක් විස්තර සහිත ව අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට උපදෙස් ලබා දෙන්න.

**තක්සේරු නිර්ණායක සහ සලකුණු මාර්ගෝපදේශ (Rubrics)**
**තක්සේරුකරණ කාර්ය 03**
**ලකුණු ලබා දීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ඉතා හොඳයි 4 | හොඳයි 3 | සාමාන්‍යයි 2 | සංවර්ධනය විය යුතු යි 1 |
|---|---|---|---|---|---|
| 4.2.2 නිර්දිෂ්ට එක් එක් සාහිත්‍ය නිර්මාණ කියවා ඒවා රසවත් වීමට හේතු වූ කරුණු ලියයි. | රසවත් වීමට හේතු වූ කරුණු දෙකක් විස්තර සහිත ව ලිවීම (ලකුණු 04) | රසවත් වීමට හේතු වූ කරුණු දෙකක් නිවැරදි ව හඳුනා ගෙන විස්තර සහිත ව ඉදිරිපත් කරයි. | රසවත් වීමට හේතු වූ කරුණු දෙකක් නිවැරදි ව හඳුනා ගෙන කෙටි විස්තරයක් සහිත ව ඉදිරිපත් කරයි. | රසවත් වීමට හේතු වූ කරුණු දෙකක් නිවැරදි ව හඳුනා ගෙන විස්තර රහිත ව ඉදිරිපත් කරයි. | රසවත් වීමට හේතු වූ එක් කරුණක් අන් අයගේ සහාය ඇති ව ඉදිරිපත් කරයි. |
| | අක්ෂර වින්‍යාසය නිවැරදි වීම (ලකුණු 04) | සියලු ම වචන නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි. | වචනවලින් 75% කට වැඩි සංඛ්‍යාවක් නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි. | වචනවලින් 75%-50%ක් අතර සංඛ්‍යාවක් නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි. | වචනවලින් 50%කට අඩු සංඛ්‍යාවක් නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි. |
| | විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කිරීම (ලකුණු 04) | විරාම ලක්ෂණ ඉතා නිවැරදි ව භාවිත කරයි. | විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කරයි. | විරාම ලක්ෂණ තරමක් නිවැරදි ව භාවිත කරයි. | විරාම ලක්ෂණ භාවිතය ගැන සැලකිල්ලක් නො දක්වයි. |
| | නිවැරදි ව වචන වෙන් කිරීම (ලකුණු 04) | ඉතා නිවැරදි ව වචන වෙන් කර ලියයි. | නිවැරදි ව වචන වෙන් කර ලියයි. | තරමක් නිවැරදි ව වචන වෙන් කර ලියයි. | වචන වෙන් කිරීම පිළිබඳ සැලකිල්ලක් නො දක්වයි. |

**සාහිත්‍යයෙන් ජීවිතයට අත්වැලක් ...**

- මෙම ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් නිරත කරවීමේ අපේක්ෂාව වන්නේ මෙම මොඩියුලයේ සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් ශිෂ්‍යයා වෙත සමාජ සංවේදන කුසලතා අත්පත් කර දීමයි.
- මෙම සමාජ සංවේදන කුසලතා මොනවා ද යන්න මොඩියුලය ආරම්භයේ දක්වා ඇති විෂය නිර්දේශයේ දක්වා ඇත.
- සමාජ සංවේදන කුසලතා ප්‍රධාන වශයෙන් කොටස් පහකට වෙන් වේ.
- මෙම කුසලතා ශිෂ්‍ය ශිෂ්‍යාවන් යහපත් පුරවැසියන් ලෙස සමාජ ගත වීමේ දී ඔවුන්ගේ චර්යාවෙන් නිරූපණය වන පරිදි ජීවිතානුබද්ධ ඉගෙනීමක් (Life long learning) සිදු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ස්වයං දැනුවත්භාවය** (Self Awareness)

- හැඟීම් හඳුනා ගැනීම
- ශක්‍යතා හඳුනා ගැනීම
- ආත්ම විශ්වාසය
- ස්වයංකාර්යක්ෂමතාව
- සංජානනය

**ස්වයං කළමනාකරණය** (Self Management)

- ආවේග පාලනය
- ආතතිය කළමනාකරණය
- ස්වයං විනය
- ස්වයංපෙලඹවීම
- ඉලක්කගත වීම
- සංවිධාන කුසලතා

**සමාජ දැනුවත් භාවය** (Social Awareness)

- නිවැරදි දැක්ම
- සහකම්පනය
- විවිධත්වය අගය කිරීම
- අන්‍යයන්ට ගරු කිරීම

**සමාජ සම්බන්ධතා ගොඩනැගීමේ කුසලතා** (Relationship Skills)

- සන්නිවේදනය
- සමාජ නියුක්තිකරණය
- සබඳතා ගොඩනගා ගැනීම
- කණ්ඩායම් ක්‍රියාකාරකම්

**වගකීමෙන් තීරණ ගැනීම** (Responsible Decision Making)

- ගැටලු හඳුනා ගැනීම
- අවස්ථා විශ්ලේෂණය
- ගැටලු විසඳීම
- ඇගයීම
- ප්‍රත්‍යවේක්ෂණය
- සදාචාරාත්මක වගකීම

**ක්‍රියාකාරකම 3.4**

- පන්තියේ ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම්වලට වෙන් කරවන්න.
- මොඩියුලයේ අංක 1 සිට අංක 6 දක්වා ඇතුළත් කරුණු කණ්ඩායම්වලට වෙන් කර ලබා දෙන්න.
- එක් කණ්ඩායමකට එක් කරුණක් හෝ දෙකක් බැගින් ලබා දෙන්න.
- ලැබුණු ගැටලුව/ගැටලු පිළිබඳ කණ්ඩායමේ සාමාජිකයින් සමග සාකච්ඡා කිරීමට සුදුසු කාලයක් ලබා දෙන්න.
- සාකච්ඡා කළ කරුණු විවිධ මාධ්‍ය යොදා ගනිමින් නිර්මාණශීලී ව පන්තියට ඉදිරිපත් කිරීමට මග පෙන්වීම සිදු කරන්න.
- වෙනත් කණ්ඩායම් ඉදිරිපත් කරන කරුණු ද අවධානයෙන් සවන් දී මතකයේ රඳවා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල ඉදිරිපත් කිරීම් අගය කරමින් අදහස් දැක්වීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවස්ථාව ලබා දෙන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කිරීම් අගය කරමින් අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**තක්සේරු නිර්ණායක සහ සලකුණු මාර්ගෝපදේශ** (Rubrics)

**තක්සේරුකරණ කාර්ය 4**

**ලකුණු ලබා දීම**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ඉතා හොඳයි 4 | හොඳයි 3 | සාමාන්‍යයි 2 | සංවර්ධනය විය යුතු යි 1 |
|---|---|---|---|---|---|
| 4.3.1 සාහිත්‍ය නිර්මාණ රස විඳීමෙන් අත්පත් කර ගත හැකි ස්වයං දැනුවත්භාවය, ස්වයං කළමනාකරණය, සමාජ දැනුවත්භාවය, සමාජ සම්බන්ධතා ගොඩනැගීම, වගකීමෙන් තීරණ ගැනීම සහ යන සමාජ සංවේදන කුසලතා ඇසුරින් අසනු ලබන ප්‍රශ්නයකට පිළිතුරු නිර්මාණශීලී ව විවිධ මාධ්‍ය යොදා ගනිමින් ඉදිරිපත් කරයි. | ප්‍රශ්නයකට නිවැරදි ව පිළිතුරු ලබා දීම (ලකුණු 04) | කණ්ඩායම එක් ව ලබා දුන් කාලය ඇතුළත ප්‍රශ්නයකට ඉතා සාර්ථක ව පිළිතුරු ලබා දෙයි. | කණ්ඩායම එක් ව ලබා දුන් කාලය ඇතුළත ප්‍රශ්නයකට තරමක් සාර්ථක ව පිළිතුරු ලබා දෙයි. | කණ්ඩායම එක් ව ලබා දුන් කාලය ඇතුළත ප්‍රශ්නයකට පිළිතුරක් ලබා දෙයි. | කණ්ඩායම එක් ව ලබා දුන් කාලයෙන් පසු ප්‍රශ්නයකට පිළිතුර ලබා දෙයි. |
| | විවිධ මාධ්‍ය යොදා ගනිමින් ඉදිරිපත් කිරීම (ලකුණු 04) | ඉදිරිපත් කිරීම සඳහා මාධ්‍ය දෙකක් යොදා ගනියි. | ඉදිරිපත් කිරීම සඳහා මාධ්‍යයක් යොදා ගනියි. | ඉදිරිපත් කිරීම සඳහා මාධ්‍යයක් යොදා ගැනීමට යම් උත්සහයක් දරයි. | විවිධ මාධ්‍ය යොදා නොගෙන ඉදිරිපත් කිරීම සිදු කරයි. |
| | නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීම (ලකුණු 04) | පිළිතුර නිර්මාණශීලී වන අතර විවිධ මාධ්‍ය ද ඉතා නිර්මාණශීලී ව යොදා ගනිමින් ඉදිරිපත් කරයි. | පිළිතුර නිර්මාණශීලී වන අතර විවිධ මාධ්‍ය නිර්මාණශීලී ව යොදා ගනිමින් ඉදිරිපත් කරයි. | පිළිතුර නිර්මාණශීලී වන අතර විවිධ මාධ්‍ය තරමක් නිර්මාණශීලී ව යොදා ගනිමින් ඉදිරිපත් කරයි. | පිළිතුර තරමක් නිර්මාණශීලී වන අතර විවිධ මාධ්‍ය යොදා ගනිමින් ඉදිරිපත් කරයි. |

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ඉතා හොඳයි 4 | හොඳයි 3 | සාමාන්‍යයි 2 | සංවර්ධනය විය යුතු යි 1 |
|---|---|---|---|---|---|
| 4.3.2 සාහිත්‍ය නිර්මාණ රස විඳීමෙන් අත්පත් කර ගත හැකි ස්වයං දැනුවත්භාවය, ස්වයං කළමනාකරණය, සමාජ දැනුවත්භාවය, සමාජ සම්බන්ධතා ගොඩනැඟීම, වගකීමෙන් තීරණ ගැනීම යන සමාජ සංවේදන කුසලතා කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී ප්‍රදර්ශනය කරමින් කටයුතු කරයි. | කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී සමාජ සංවේදන කුසලතා ප්‍රදර්ශනය කිරීම (ලකුණු 04) | කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී සමාජ සංවේදන කුසලතා ඉතා හොඳින් ප්‍රදර්ශනය කරයි. | කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී සමාජ සංවේදන කුසලතා හොඳින් ප්‍රදර්ශනය කරයි. | කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී සමාජ සංවේදන කුසලතා අඩුවෙන් ප්‍රදර්ශනය කරයි. | කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී සමාජ සංවේදන කුසලතා ඉතා අඩුවෙන් ප්‍රදර්ශනය කරයි. |

**ක්‍රියාකාරකම 3.5**

- අංක 1 සිට 6 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු තනි ව අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- පිළිතුරු සටහන් කිරීමේ දී කණ්ඩායම් ඉදිරිපත් කළ තොරතුරුවලට අමතර ව ශිෂ්‍යයන්ගේ අමතර අදහස් හෝ නැවුම් අදහසක් ඉදිරිපත් කිරීමෙන් උපරිම ලකුණු හිමි කර ගත හැකි බව පැහැදිලි කරන්න.
- මෙම ක්‍රියාකාරකම සඳහා ලකුණු ලබා දීමේ දී පහත සලකුණු මාර්ගෝපදේශ යොදා ගන්න.

තක්සේරුකරණ කාර්ය 5

**ලකුණු ලබා දීම**

| නිර්ණායක | ඉතා හොඳයි<br>4 | හොඳයි<br>3 | සාමාන්‍යයි<br>2 | සංවර්ධනය විය යුතු යි<br>1 |
|---|---|---|---|---|
| ප්‍රශ්න හයට ම පිළිතුරු සැපයීම | ප්‍රශ්න හයට ම පිළිතුරු සපයයි. (ලකුණු 04) | ප්‍රශ්න පහකට හෝ හතරකට පිළිතුරු සපයයි. | ප්‍රශ්න තුනකට හෝ දෙකකට පිළිතුරු සපයයි. | ප්‍රශ්න එකකට පිළිතුරු සපයයි. |
| සාකච්ඡා කළ කරුණුවලට අමතර කරුණු නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීම | බොහෝ අමතර කරුණු ඉතා නිර්මාණශීලී ව ඉදිරිපත් කරයි. (ලකුණු 04) | අමතර කරුණු තරමක් නිර්මාණශීලී ව ඉදිරිපත් කරයි. | කරුණුවලින් අඩක් පමණ සාකච්ඡා කළ කරුණු යොදා ගෙන නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීමට උත්සහ දරයි. | සාකච්ඡා කළ කරුණු පමණක් ඉදිරිපත් කරන අතර නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීමට පුහුණු විය යුතු ය. |
| අක්ෂර වින්‍යාසය, විරාම ලකුණු යෙදීම නිවැරදි ව වචන වෙන් කිරීම පිළිබඳ අවධානය යොමු කිරීම | නිවැරදි ව අක්ෂර වින්‍යාසය යෙදීම, විරාම ලකුණු යෙදීම, වචන වෙන් කිරීම පිළිබඳ සියලු ම පිළිතුරුවල දී අවධානය යොමු කරයි. (ලකුණු 04) | නිවැරදි අක්ෂර වින්‍යාසය, විරාම ලකුණු යෙදීම, වචන වෙන් කිරීම පිළිබඳ පිළිතුරු හතරක/පහක දී අවධානය යොමු කරයි. | නිවැරදි අක්ෂර වින්‍යාසය, විරාම ලකුණු යෙදීම, වචන වෙන් කිරීම පිළිබඳ පිළිතුරු තුනක/දෙකක දී අවධානය යොමු කරයි. | නිවැරදි අක්ෂර වින්‍යාසය, විරාම ලකුණු යෙදීම, වචන වෙන් කිරීම පිළිබඳ පිළිතුරු එකක දී අවධානය යොමු කරයි. |

**මොඩියුල තක්සේරුකරණය හා ඇගයීම**

මොඩියුලයට අදාළ සම්භාර අගය තීරණය කිරීම සඳහා සම්භවන තක්සේරුව සහ සම්පිණ්ඩිත තක්සේරුව යොදා ගනු ලැබේ. එහි ලකුණු ලබා දීමේ ප්‍රතිශතය පහත පරිදි වේ.
සම්භවන තක්සේරුව - 70%
සම්පිණ්ඩිත තක්සේරුව - 30%

**සම්භවන තක්සේරුව**

පළමු මොඩියුලයේ සම්භවන තක්සේරුව සඳහා මොඩියුලයේ පළමු ඉගෙනුම් අවස්ථාවේ සිට සිව්වන ඉගෙනුම් අවස්ථාව දක්වා අදාළ ක්‍රියාකාරකම් යොදා ගන්න. මේ අනුව එහි බර තැබීම 70%කි. එක් මොඩියුලයක් සඳහා ලකුණුවල එකතුව ලකුණු 100කි. මොඩියුලයක ලබා ගත් මුළු ලකුණු X නම් (X/100) x 70 ලෙස ගණනය කරන්න. එම ලකුණු මෙම ලකුණු සම්භවන තක්සේරුව සඳහා හිමිවන බැවින් අඩු ලකුණු ලබා ගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නැවත නැවත අදාළ ක්‍රියාකාරකම නිවැරදි ව ඉදිරිපත් කිරීමෙන් එම ලකුණු උපයා ගැනීමට අවස්ථාව හිමි වේ. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ සහ ඉදිරි පෝෂණ ලබා දෙන්න. ලකුණු ඇතුළත් කිරීම සඳහා පහත ආකෘතිය යොදා ගන්න.

| අනු අංකය | ශිෂ්‍යයාගේ/ ශිෂ්‍යාවගේ නම | සාහිත මිහිර 01 තක්සේරුකරණ කාර්ය 3 | නිර්ණායක 1 | | | | නිර්ණායක 2 | | | | නිර්ණායක 3 | | | | නිර්ණායක 4 | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සලකුණු මාර්ගෝපදේශ අනුව ප්‍රාප්ති මට්ටම් | | | | සලකුණු මාර්ගෝපදේශ අනුව ප්‍රාප්ති මට්ටම් | | | | සලකුණු මාර්ගෝපදේශ අනුව ප්‍රාප්ති මට්ටම් | | | | සලකුණු මාර්ගෝපදේශ අනුව ප්‍රාප්ති මට්ටම් | | | | |
| | | | 4 | 3 | 2 | 1 | 4 | 3 | 2 | 1 | 4 | 3 | 2 | 1 | 4 | 3 | 2 | 1 | |
| 1 | A | | | | | | | | | | | | | | | | | | |
| 2 | B | | | | | | | | | | | | | | | | | | |
| 3 | C | | | | | | | | | | | | | | | | | | |

වගුව 1.1

මොඩියුලය ඉගෙනුම් අවස්ථා කිහිපයකින් සමන්විත වේ. ඒ අනුව එක් ඉගෙනුම් අවස්ථාවක් තුළ තක්සේරුකරණ කාර්යයන් කිහිපයක් ද අන්තර්ගත වේ. ඉහත 1.1 වගුවේ සඳහන් ආකාරයෙන් එක් එක් තක්සේරුකරණ කාර්යයෙන් ලබා ගන්නා ලකුණ පහත 1.2 වගුවේ ඇතුළත් කර ඉගෙනුම් අවස්ථාවක සමස්ත ලකුණ ගණනය කර ගත හැකි ය. ඒ අනුව මෙම ආකෘතියෙන් එක් ඉගෙනුම් අවස්ථාවකට එක් වගුවක් වශයෙන් සකස් කර ගත යුතු ය. එක් එක් ඉගෙනුම් අවස්ථාවකට ලබා ගත් ලකුණ පහත වගුව 1.3 ඇතුළත් කිරීමෙන් මොඩියුලයකට හිමි සමස්ත ලකුණ ගණනය කර ගත හැකි ය.

**සාහිත මිහිර 01 - ඉගෙනුම් අවස්ථාව - 02**

| අනු අංකය | ශිෂ්‍යයාගේ/ ශිෂ්‍යාවගේ නම | තක්සේරුකරණ කාර්ය 1 | තක්සේරුකරණ කාර්ය 2 | තක්සේරුකරණ කාර්ය 3 | තක්සේරුකරණ කාර්ය 4 | එකතුව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

වගුව 1.2

පළමු මොඩියුලයේ සම්භවන තක්සේරුව සඳහා පළමු ඉගෙනුම් අවස්ථාවේ සිට සිව්වන ඉගෙනුම් අවස්ථාව දක්වා අදාළ ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ලකුණු ඇතුළත් කළ යුතු ය.

| | සම්භවන තක්සේරුව<br>සාහිත මිහිර 01 | | | | | 70%<br>සම්භවන<br>තක්සේරුව | 30%<br>සම්පිණ්ඩිත<br>තක්සේරුව | එකතුව<br>100% | GPA<br>අගය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ශිෂ්‍යයාගේ<br>නම | ඉගෙනුම්<br>අවස්ථාව<br>1 | ඉගෙනුම්<br>අවස්ථාව<br>2 | ඉගෙනුම්<br>අවස්ථාව<br>3 | ඉගෙනුම්<br>අවස්ථාව<br>4 | | | | |
| 01 | | | | | | | | | |
| 02 | | | | | | | | | |
| 03 | | | | | | | | | |

වගුව 1.3

**සම්පිණ්ඩිත තක්සේරුව - 30%**

මේ සඳහා මොඩියුලයේ අන්තර්ගතය ඇසුරෙන් නිර්මාණය කර ගන්නා ලද ක්‍රියාකාරකමක ශිෂ්‍යයන් නිරත කරවා ලකුණු ලබා දෙන්න.

උදාහරණ -

- කියවා ඇති සාහිත්‍ය නිර්මාණයකින් නිරූපණය වන යහපත් ආකල්ප පිළිබඳවත් එයින් ශිෂ්‍යයන්ගේ ජීවිතයට ලබා ගත හැකි ආදර්ශ පිළිබඳවත් අගය කරමින් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම
- මොඩියුලයේ දී හඳුනා ගත් සාහිත්‍ය නිර්මාණ රස විඳිමින් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම
- මෙය 30%ක ලකුණු ප්‍රතිශතයකට පරිවර්තනය කර ගන්න.
- සම්පිණ්ඩිත ඇගයීම සඳහා සලකුණු මාර්ගෝපදේශයක් සකස් කර ගන්න.
- ඌන ලකුණු ලබා ගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ප්‍රතිකාර්ය ඉගෙනුම් වැඩපිළිවෙළක් සැලසුම් කරන්න.